# ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ දූෂණ




ට්‍රාන්ස්පේරන්සි
ඉන්ටනැෂනල්
ශ්‍රී ලංකා
සුපිළිපන් දේශයක් උදෙසා

සමාජයීය අසමානත්වයක් ඇතිකරමින් පාසැල් අධ්‍යාපනයේ දූෂණය තදින් පවතින විට අධ්‍යාපන ක්‍රමය සහ යහපාලනය පිළිබඳව මහජනයා අතර පවතින සමාජ විශ්වාසය බිඳීයයි. එයින් රටේ සංවර්ධන ක්‍රියාදාමයට බලවත් හානියක් සිදුවේ. එවිට තරුණ පිරිස දූෂණය එදිනෙදා ජීවන රටාවේ කොටසක් ලෙස සැලකීමට පෙළඹෙති. එය රටේ අනාගත අභිවෘද්ධියට අවශ්‍ය සදාචාරය, ආචාරධර්ම සහ චර්යා අගයන් ගොඩනැගීමට ඉමහත් බාධාවකි. එමෙන්ම එය අධ්‍යාපන අමාත්‍යාංශයේ මෙහෙවරෙහි සඳහන් පරිදි ''පාර්ශවකරුවන් තෘප්තිමත්භාවයට පත්වන අයුරින් කාර්යක්ෂමතාව හා උසස් ගුණාත්මකතාවයට යොමුවන අධ්‍යාපන ක්‍රමයක් තුළින් දක්ෂ පුරවැසි පිරිසක් බිහිකිරීමේ'' අභිලාෂයට මහත් තර්ජනයකි

**ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා**

# ශ්‍රී ලංකාවේ
# අධ්‍යාපන ක්ෂේත්‍රයේ දූෂණ

## සිදුවන ආකාරය සහ ප්‍රමාණය පිළිබඳ අධ්‍යයනයක්

2009 මැයි

ට්‍රාන්ස්පේරන්සි
ඉන්ටනැෂනල්
ශ්‍රී ලංකා
සුපිළිපන් දේශයක් උදෙසා

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා - 2009

ISBN 978-955-1281-25-0

**ප්‍රකාශණය**
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා
28/බුලර්ස් පටුමග
කොළඹ 07

දුරකතනය 0 11 2506419
ෆැක්ස් 0 11 2592287
ඊ මේල් tisl@tisrilanka.org
වෙබ් අඩවිය www.tisrilanka.org

පිට කවරයේ කාටූනය : රස්කින් මොහමඩ් මුනාෆ්
(2008- **TISL** ජාතික දූෂණ විරෝධී කාටූන් තරගයෙන්)
පසුපස කවරයේ කාටූනය: ප්‍රීති කන්නන්ගර
(2008- **TISL** ජාතික දූෂණ විරෝධී කාටූන් තරගයෙන්)

# පටුන


පෙරවදන

1. සම්පිණ්ඩනය 03

2. හැඳින්වීම 10

3. අරමුණු සහ අධ්‍යයනයේ ක්‍රමවේදය 18

4. හෙළිවූ කරුණු 25

4.1 පාසැල් මට්ටමේ දූෂණ 27

4.1.1 පාසැල් වලට ඇතුලත්කිරීම් 27

4.1.2 පෙළ පොත් 32

4.1.3 ගුණාත්මක යෙදවුම් 33

4.1.4 පස්වෙනි ශ්‍රේණියේ ශිෂ්‍යාධාර 35

4.1.5 ශිෂ්‍යයින්ට විභාග නිවාඩු 35

4.1.6 විශ්ව විද්‍යාලයට ඇතුල්වීමේ දිස්ත්‍රික්ක අනුපාත ක්‍රමය 36

4.1.7 ගුරුවරුන්ගේ හැසිරීම සහ පක්ෂභජනය 38

4.2 ගාස්තු සහ ගෙවීම් 40

4.2.1 ගාස්තු සහ පරිත්‍යාග 40

4.2.2 පාසැල් සංවර්ධන කමිටුවලට ගෙවීම් 42

4.2.3 ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම 43

4.2.4 ගුරුවරුන්ට තෑගි බෝග 43

4.2.5 උපකාරක (ටියුෂන්) පන්ති 45

4.2.6 වෙනත් ගෙවීම් 46

4.3 පරිපාලනය හා සම්බන්ධ දූෂණය 47

4.3.1 පාසැල්වලට අදාල ප්‍රශ්න - දෙමළ පරිවර්තන 47

4.3.2 පාසැල්වල සහ අධ්‍යාපන කාර්යාලවල අක්‍රමිකතාවන් 48

4.3.3 වැටුප් වර්ධක ප්‍රමාදවීම 48

4.3.4 දුෂ්කර දීමනා 49

4.3.5 ගුරු ණය 50

4.3.6 මාරුවීම් 51

4.3.7 පත්වීම් 57

4.4 දූෂණයට එරෙහිව පැමිණිලි 61

5 නිගමන 63

# පෙරවදන

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ මෙහෙවර සුපිළිපන් දේශයක් ගොඩනැගීමයි. මෙම අරමුණ ඉටුකරගැනීම සඳහා රාජ්‍ය සහ පෞද්ගලික අංශ මෙන්ම සිවිල් සමාජයත් සිය ක්‍රියා පටිපාටියන්හිදී දූෂණය සහ අසම්මත ව්‍යවහාරයන් මුලිනුපුටා දැමීමට උත්සාහකළ යුතුය. දූෂණය වැළැක්වීමේ උපාය මාර්ග පිළියෙල කිරීමට නම් දැනට පවත්නා ගැටලුවල ස්වභාවය සහ ප්‍රමාණය හඳුනාගත යුතුය. ශ්‍රී ලංකාවේ ආර්ථික සහ සමාජ වර්ධනයට වැදගත්වූ ක්ෂේත්‍ර පිළිබඳව අධ්‍යයනය කිරීමට අප ආයතනය උනන්දුවන්නේ මේ නිසාය. 2009 වසර තුළදී පළකෙරෙන පළමුවන වාර්තාව මෙයයි.

අධ්‍යාපන ක්ෂේත්‍රය දුෂණය මැඩලිය යුතු මූලික අංශයකි. අපේ ළමා පරපුර දැනුම සහ නිපුණතා ලබාගන්නේත්, සිය අනාගතය හැඩගසාගන්නේත් අධ්‍යාපනය තුළිනි. එබැවින් මෙම ක්ෂෙත්‍රය දූෂණය සහ අක්‍රමිකතා වලින් තුරන්ව සාධාරණවත් අපක්ෂපාතවත් සේවය කළ යුතුය. මෙම වාර්තාවෙන් අනාවරණයවී ඇති කරුණු කෙරෙහි අවධානය යොමුකරමින් ඒ පිළිබඳව සාකච්ඡාකර අධ්‍යාපනයේ දූෂණය මැඩලීමට සියලු පාර්ශවකරුවන් උනන්දුවනු ඇතැයි බලාපොරොත්තුවෙමි. සුපිළිපන් දේශයක් ගොඩනැගීමේ පරමාර්ථයට ඒ අයුරින් ඔවුන්ට දායකවිය හැක.

මෙම වාර්තාව සකස්කර ඇත්තේ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ මහාචාර්ය අමරසිරි ද සිල්වාගේ මුලිකත්වයෙන් යුතු කණ්ඩායමක් විසින්, 2008 මැයි මාසයේ සිට ඔක්තෝබර් මාසය දක්වා සිදුකරන ලද අධ්‍යයනයකින් එකතුකරගත් තොරතුරු අනුවය. මහාචාර්ය ද සිල්වා ඉමහත් කැපවීමකින් සිය කාර්යය මනාව ඉටුකිරීම ගැන අප ආයතනයේ කෘතඥතාවය ඒ මහතාට පිරිනැමේ. අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් නිමල් බණ්ඩාර මහතාත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති සැලසුම් කාර්යසාධන සමාලෝචන පිළිබඳ අතිරේක ලේකම් එස්.යූ.විජේරත්න මහතාත් පර්යේෂණ කටයුතු පිළිබඳව දැක්වූ සහයෝගයටත්, අධ්‍යයනයෙන් හෙළිවූ කරුණු සහ නිගමන ගැන සාකච්ඡා කිරීමට අවස්ථාවක් සලසාදීම ගැනත් බෙහෙවින් ස්තුතිවන්ත වෙමි. අප ආයතනයේ පර්යේෂණ අංශය මේ කාර්යය ගැන දැරූ වෙහෙස අපමණය. එම අංශයේ සාමාජිකයින්ට මාගේ ස්තුතිය පිරිනැමේ.

ජේ.සී.වැලිඅමුණ
විධායක අධ්‍යක්ෂ

# 1. සම්පිණ්ඩනය

අධ්‍යාපනය ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජයීය සංවර්ධනයේ මූලික පදනම ලෙස සැලකේ. ළමුන් අනිවාර්යයෙන්ම පාසැල් යැවීමේ නීති ඇතුලු අධ්‍යාපන ක්‍රමය විධිමත් කිරීම සඳහා නීති රීති විවිධ රජයන් විසින් පනවා ඇති අතර සිය දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබාදීම දෙමව්පියන් සියලුදෙනාගේම අපේක්ෂාවයි. ඉතාමත් දුප්පත් දෙමව්පියන්ද කල්පනා කරන්නේ දුගීබවින් මිදීමට ඇති එකම මග සිය දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබාදීම බවයි.

ලංකාවේ ළමුන්ගෙන් සියයට 98 ක් පමණම රජයේ පාසැල් 9,678 ක නිදහස් අධ්‍යාපනය ලබති. ඉගෙනීමෙන් ප්‍රතිඵල ලබන සංඛ්‍යාව වැඩිවෙමින් පවතී. කෙසේවුවද, පස්වෙනි ශ්‍රේණිය සහ අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ වැනි විභාගවලින් ලැබෙන අසාර්ථක ප්‍රතිඵල නිසා අධ්‍යාපනය සතුටුදායක මට්ටමකට පැමිණ නැති බවට ද සැක පහළවේ.

ප්‍රතිපත්තිමය වශයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය බලාපොරොත්තු වන්නේ සාධාරණත්වය, ගුණාත්මකබව සහ කාර්යක්ෂමතාව ඇතිකිරීමයි. එහෙත් මාධ්‍ය වාර්තා අනුව නම්, විශේෂයෙන්ම සාධාරණත්වය අතින් සමාජය සෑහීමට පත්වී නැති බව පෙනේ.

නගරබද පාසැල් සහ ග්‍රාමීය හා වතු පාසැල් අතර පහසුකම් මෙන්ම සිසුන්ගේ කාර්ය සාධනය අතින් පමණක් නොව ගුරුවරුන් පත්කිරීම අතින්ද අසමනාකම් ඇතැයි වාර්තාවේ. සුදුසුකම් නොමැති ගුරුවරුන් පත්කිරීමෙන් ඉගැන්වීමේ ගුණාත්මක බව අඩුවී ඇති බව පෙනේ. අධ්‍යාපන අමාත්‍යාංශය පළමුවෙනි ශ්‍රේණියට ළමුන් බඳවා ගැනීමේදී අයකරගත යුතු ගාස්තු නියම නොකිරීම නිසා දෙමව්පියන් තුළ අවුල් තත්ත්වයක් පවතී. සමහර විදුහල්පතිවරු හිතුමනාපයට ක්‍රියාකරන බව කියනු ලැබේ. මෙවන් කරුණු කාරණා හේතුවෙන් අධ්‍යාපනයේ සාධාරණත්වය ගැන විවිධ ගැටලු මතුවී ඇත.

මේ අතර, අක්‍රමවත් ලෙස නිලධාරීන් සහ අධ්‍යක්ෂවරුන් පත්කිරීම නිසා අධ්‍යාපනයේ පරිපාලනය පිරිහී ඇතැයි බොහෝ දෙනා කල්පනා කරති.

'ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ දූෂණ සිදුවන ආකාරය සහ ප්‍රමාණය' පිළිබඳ මෙම අධ්‍යයනය මහාචාර්ය අමරසිරි ද සිල්වා විසින් 2008 මැයි මාසයේ සිට සැප්තැම්බර් දක්වා පවත්වන ලදී. කරුණු ලබාගත්තේ අහඹු ලෙස නිවෙස් දහසකින් තෝරාගත්

දෙමව්පියන් සහ ගුරුවරුන් සියයක්, අධ්‍යාපන නිලධාරීන් සියයක්, ග්‍රාම නිලධාරී කොට්ඨාශ 11 කින් තෝරාගත් 59 දෙනෙකු සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීමෙනි. සමීක්ෂණය යොමුවූයේ රජයේ පාසැල් වල පළමුවෙනි ශ්‍රේණියට සිසුන් ඇතුල්කිරීමේ පටන් උසස් පෙළ (13 වෙනි ශ්‍රේණිය) දක්වා සිදුවෙතැයි කියන දූෂණ සහ අක්‍රමිකතා සම්බන්ධවය.

නිවෙස්වල සිටි සිසුන් සංඛ්‍යාව 1,800 කි. ග්‍රාම නිලධාරී කොට්ඨාශ තෝරාගනු ලැබුවේ අනුරාධපුරය, ගාල්ල, මහනුවර, නුවරඑළිය, බදුල්ල සහ පුත්තලම දිස්ත්‍රික්ක වලිනි.

සමීක්ෂණයේදී හෙළිවූ කරුණු කොටස් හතරකට වෙන්කළ හැක:
1) පාසැල් මට්ටමේ දූෂණ
2) ගාස්තු සහ ගෙවීම්
3) පරිපාලනය හා සම්බන්ධ දූෂණ
4) දූෂණයට එරෙහි පැමිණිලි

දූෂණය රහසිගතව සිදුකෙරෙන්නකි. එබැවින් එය ව්‍යාප්තවී ඇති ආකාරය ගැන දැනගැනීම අසීරුය. දූෂණ පිළිබඳ සමීක්ෂණ වලදී තොරතුරු ලබාගන්නේ හැඟීම් සහ දූෂණ අත්දැකීම් පදනම්කරගෙනය. හෙළිවන කරුණු පරිස්සමින් අර්ථකථනය කළ යුතුය. ඊට හේතුව හැඟීම් හැමවිටම සත්‍යය පිළිබිඹු නොකිරීමත්, පළිගැනීම් ඇතිවීමට ඇති හැකියාව නිසා අත්දැකීම් බොහෝවිට වාර්තා නොවීමත් නිසාය. මෙවන් අඩුපාඩුකම් මධ්‍යයේ වුවද, මෙම අධ්‍යයනයෙන් දූෂණ සිදුවන ආකාරය සහ ප්‍රමාණය ගැනත්, අක්‍රමිකතාවල රටාවන් සහ ව්‍යුහමය ගැටලු ගැනත් කරුණු හෙළි වී තිබේ.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය මෙම සමීක්ෂණයේ වටිනාකම දකින්නේ මෙරට අධ්‍යාපන ක්ෂේත්‍රයේ කොටස්කරුවන් වන දෙමව්පියන්, ගුරුවරුන් සහ නිලධාරීන් හැමදෙනෙකුගේම අදහස් ඊට අයත්ව තිබීම නිසාය. එබැවින් එය මහජන සාකච්ඡාවට යොමුවී අධ්‍යාපන ප්‍රතිපත්ති සැකසීමට ඉවහල්වේ යැයි අපේක්ෂා කරමු. ශ්‍රී ලාංකිකයින් හැමදෙනාගේම ප්‍රයෝජනය තකා සාධාරණ උසස් මට්ටමේ අධ්‍යාපන ක්‍රමයක් ඇතිකර ගැනීම අවශ්‍යය.

## හෙළිවූ කරුණු

### රජයේ පාසැල් ක්‍රමය

මීට දශක කීපයකට ඉහතදී පැවති තත්ත්වය අනුව බලන විට රජයේ අධ්‍යාපන ක්‍රමය පිරිහී ඇතැයි දෙමව්පියන්, ගුරුවරුන් සහ නිලධාරීහු පවසති. පත්වීම් සහ මාරුවීම් ඇතුලු අධ්‍යාපන ක්‍රමය දේශපාලන බලපෑම්වලට යටත්වීම සහ ගුරු වෘත්තිය රැකියාවක් ලෙස පමණක් සලකා එහි වෘත්තීයමය අගය අඩුකිරීම ඊට හේතුවයි.

• පාසැල් ක්‍රමය දූෂිතයි: නිවැසියන් 21.5% එකඟයි

• ගුරුකමේ එතරම් වෘත්තීයමය අගයක් නැත: ගුරුවරුන් 30% සහ නිලධාරීන් 42% එකඟයි

• පත්වීම් දේශපාලනීකරණය වී ඇත:දෙමව්පියන් 28.6% නිලධාරීන් 55.8% එකඟයි

### පාසැල්වලට ඇතුල්කිරීම්

පාසැල්වලට ඇතුල්කිරීම් බෙහෙවින් දූෂිත බව සියලුදෙනාම කියා සිටියහ. විදුහල්පතිවරුන්ට අල්ලස්දීම, දේශපාලනඥයින්ගෙන් සහ නිලධාරීන්ගෙන් උදව් පැතීම, විශාල වියදමක් දරමින් අතරමැදියන් සොයායෑම, අනිසි ඥාති සංග්‍රහ සහ පාසැල් වලට හා පාසැල් සංවර්ධන කමිටුවලට ඊනියා පරිත්‍යාගදීම අක්‍රමිකතාවන් ලෙස පෙන්වාදෙනු ලැබීය. 'පදිංචිය' තම වාසියට හරවාගනිමින් පාසැල්වලට ඇතුල්කිරීම් සිදුවන කාලසීමාවේදී දූෂණය එදිනෙදා ජීවිතයේ කොටසක් බවට පත්වෙයි. මෙවන් සිදුවීම් නිසා සමහර ළමුන්ට සුදුසු තැන නැතිවී යයි.

• විදුහල්පතිවරුන්ට අල්ලස්දීම: ගුරුවරුන් 36% සහ නිලධාරීන් 34% පැවසුවේ දෙමව්පියන් අල්ලස් දෙන බවයි

• පාසැල් සංවර්ධන කමිටුවලට අල්ලස්දීම: දෙමව්පියන් 15.5% ක් එකඟයි

• අධ්‍යාපන නිලධාරීන්ට අල්ලස්දීම: දෙමව්පියන් 7% ක් එකඟයි. ගුරුවරුන් 98% සහ නිලධාරීන් 89% ක් කීවේ අල්ලස් උපකාරීවෙන බවයි.

• අනිසි ඥාති සංග්‍රහ: ගුරුවරුන් 95% සහ නිලධාරීන් 85% ක් එය සිදුවන බව පිළිගනී

• පදිංචිය හා සම්බන්ධ දූෂණ: ගුරුවරුන් 80% සහ නිලධාරීන් 81% ක් එකඟයි

## පාසැලට ඇතුලත්කිරීමේ ගාස්තු,'ගුණාත්මක යෙදවුම්' සහ පෙළ පොත්

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සිසුන් පාසැලට ඇතුලත්කිරීමේ ගාස්තු අයකළ හැකි අඩුම සහ වැඩිම සීමාවන් පිළිබඳව චක්‍රලේඛ නිකුත් නොකිරීම හේතුවෙන් විදුහල්පතිවරුන්ගේ අත්තනෝමතික තීරණ ගැනීම පිළිබඳව විවිධ අදහස් පළකෙරුණි. එක් සිසුවකුට 2008 වසරේදී සාමාන්‍යයෙන් රුපියල් 3,977.09 බැගින් අයකෙරුණු බව හෙළිවිය.

• ඇතුලත්කිරීමේ ගාස්තු වැඩියි: දෙමව්පියන් 81.4%ක් එකඟයි. ගුරුවරුන් සහ නිලධාරීන් 90%කට වඩා කීවේ ගාස්තු දෙමව්පියන්ට බරක් බවයි

• රිසිට් පත් නැත: :ගුරුවරුන් 10% සහ නිලධාරීන් 15%ක් එකඟයි

• පාසැල් අරමුදල්, ගාස්තු හා ප්‍රදාන විගණනය කිරීමක් නෑ: ගුරුවරුන් 62.2% සහ නිලධාරීන් 86.3% එකඟයි

'ගුණාත්මක යෙදවුම්' යනුවෙන් හැඳින්වෙන්නේ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පන්තිවල ඉගැන්වීම සහ ඉගෙනගැනීම සඳහා යොදගැනීමට වෙන්කරන මුදල් ප්‍රදානයන්ය. ඒවා වෙන්කෙරෙන්නේ පාසැලේ ශිෂ්‍ය සංඛ්‍යාව අනුවය. පාසැල් ලැයිස්තුවේ ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිනම් ප්‍රදානයද වැඩිය.දෙමව්පියන් 80%ක් මේ ගැන දැනසිටි නමුත් විශේෂයෙන්ම ග්‍රාමීය සහ වතු පාසැල්වල ඒවා නිසි ආකාරයට පාවිච්චි කිරීම ගැන සැක පහළ කළහ.

- ගුණාත්මක යෙදවුම් නිසි ලෙස පාලනය නොකිරීම: එසේ වියහැකියයි නිවැසියන් 35%ක් කී අතර ගුරුවරුන් 98% සහ නිලධාරීන් 91%ක් අනිසි පාලනය පිළිගත්හ.

පෙළ පොත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මුද්‍රණය කර නොමිලේ බෙදදෙනු ලැබේ. කෙසේවුවද, බොහෝදෙනා ඒවා සිසුන්ටදීම මෙන්ම බෙදහැරීම පිළිබඳ ගැටලු ඇතැයි කීහ. සිසුන් ටිකදෙනෙක් පොත් වලට මුදල් ගෙවූ බව කීහ.

• පෙළ පොත්: ග්‍රාමීය සහ වතු පාසැල්වල සිසුන් 6.2%ක් පොත් ලැබුණේ නැතැයි කීහ

• පොත් කලට වේලාවට ලැබීම: සිසුන් 23.3% කට නියම වේලාවට පොත් ලැබී නොතිබිණි.

• ගෙවීම්: සිසුන් 3.5% ක් පොත්වලට මුදල් ගෙවා තිබුණි.

## සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ සිසුන්ට විභාග නිවාඩු

සාමාන්‍ය සහ උසස් පෙළ විභාගයට පෙනී සිටින සිසුන්ට දෙවෙනි වසර අවසානයේදී විභාගයට පාඩම් කිරීම සඳහා නිවාඩු ලැබුණි. අධ්‍යාපන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කීවේ මෙය අවසර නොමැතිව සිදුකරන්නක් බවයි.

• පාඩම් නිවාඩුදීම: ගුරුවරන් 35% ක් එකඟයි

## සමානතා අයිතිය උල්ලංඝනය කිරීම

සිසුන් සියලුදෙනාටම එක හා සමාන අධ්‍යාපනයක් නොලැබෙයි. අධ්‍යාපනයේ සමානතාව අමතක කරමින් දෙමව්පියෝ ඔවුන්ගේ තත්ත්වය සහ ඔවුන් ලබා ඇති අධ්‍යාපනය අනුව සිය දරුවන්ට වඩාත් හොඳ අධ්‍යාපනයක් ලබාදීමට වෙහෙසෙති. තමන් පොහොසත් නම් දරුවා හොඳින් ඉගෙනගනු ඇතැයි බොහෝදෙනා විශ්වාස කරති.

බොහෝ දෙනෙකු තරයේ කියා සිටි තවත් කරුණක් නම් අධ්‍යාපනයේ සමානතා ප්‍රතිපත්තියට පටහැනිව නගරබද පාසැල් හා සසඳාබලන විට ග්‍රාමීය සහ වතු පාසැල්වලට ලැබෙන පහසුකම් බෙහෙවින් අඩු බවයි. දෙමව්පියන්, ගුරුවරුන් මෙන්ම නිලධාරීන්ද පෙන්වාදුන්නේ පහසුකම් අඩුවෙත්ම සිසුන්ගේ කාර්ය සාධනයත් විභාග ප්‍රතිඵලත් දුර්වල වන බවය.

තවත් කැපී පෙනුණු කාරණයක් නම් දුප්පත් මෙන්ම මධ්‍යම පාන්තිකයින් පහළ මට්ටමේ මධ්‍යම පාන්තිකයින් තරම් දූෂණය ගැන උනන්දුවක් නොදක්වන බවයි. රජයේ පාසැල් ක්‍රමය ගැන වැඩි කැක්කුමක් ඇත්තේ පහළ මට්ටමේ මධ්‍යම පාන්තිකයින්ටය.

• සිංහල හා දෙමළ පාසැල්: මෙසේ පාසැල් වර්ග කිරීම වෙනස්කම් කිරීමක් ලෙසත් එයින් වාර්ගික එකමුතුකමට හානියක් සිදුවන බවත් ගුරුවරන් සහ නිලධාරීන් 80%කට වැඩි ප්‍රමාණයක් කියා සිටියහ.

## දරුවන්ගේ කාර්ය සාධනය පිළිබඳව දෙමව්පියන්ගේ හැඟීම්

විවිධ ගැටලු සහ දූෂණ මධ්‍යයේ සිය දරුවන් පාසැලේදී හොඳින් කටයුතු කරන බව බොහෝ දෙමව්පියෝ කීහ.

- දරුවන්ගේ කාර්ය සාධනය: දෙමව්පියන් 79.5%ක් සෑහීමට පත්වී සිටිති.
- විෂය මාලා සම්පූර්ණ කිරීම: නිවැසියන් 75%ක් සෑහීමට පත්වී සිටිති.
- ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම: නිවැසියන් 41.1%ක් සෑහීමට පත්වී නැත.
- 6, 10 සහ 11 ශ්‍රේණි වලට හඳුන්වාදී ඇති නව අධ්‍යාපන ක්‍රමය:නිවැසියන් 80%ක් සෑහීමට පත්වී නැත.

## දූෂණක්‍රියා තුරන් කිරීමට කළ යුතු දේ

පාසැල් ක්‍රමයේ දූෂණ ගැන පැමිණිලි කළේ හෝ දූෂණ ක්‍රියාවන් හෙළිකලේ දෙමව්පියන්, ගුරුවරුන් හෝ නිලධාරීන් අතළොස්සකි.

- දූෂණය ගණන් නොගැනීම: ගුරුවරුන් 62% සහ නිලධාරීන් 45%ක් එකඟයි
- දූෂණය ගැන පැමිණිලි කළේ නිවැසියන් 21%ක් පමණයි

## ගුරුවරුන්ගේ වැටුප් වැඩිවීම් සහ ගුරු මාරු

වැටුප් වර්ධක සැකසීම සහ ණය ලබාගැනීම ගැන ගුරුවරුන් සහ නිලධාරීන් බොහෝ දෙනෙක් අසතුට පළකළහ. ඒවා බෙහෙවින් දේශපාලනීකරණය වී ඇතැයි ඔවුහු චෝදනා කළහ. වැටුප් වර්ධක සැකසීම ප්‍රමාද වන බව පෙන්වාදුන් ඒ අය වැටුප් වර්ධක ඉක්මන් කරගැනීමට අල්ලස් දිය යුතු යයිද එසේ නැත්නම් දේශපාලන බලපෑම් කළයුතුයයි කීහ.

මාරුවීම්වලදීද වෙනස්කම් කෙරෙන බවත්. වසර ගණනාවක් දුෂ්කර පළාත්වල සේවය කර ඇති ගුරුවරුන්ට වඩා නගරබද පාසැල්වල ගුරුවරුන්ට වාසිදායක තත්ත්වයක් උදාවී ඇති බවත් ඔවුහු කීහ.

- වැටුප් වර්ධක සැකසීමේ ප්‍රමාදය:ගුරුවරුන් 82% සහ නිලධාරීන් 75%ක වැටුප් වර්ධක සැකසීම් ප්‍රමාදවී තිබුණි. ඒවා ඉක්මණින් ලබාගැනීම සඳහා අල්ලස් දුන් බව 10%ක් කීහ.
- දේශපාලන බලපෑම් මත ඉක්මණින් වැටුප් වර්ධක ලබාගැනීම: ගුරුවරුන් 40% සහ නිලධාරීන් 34%ක් එකඟයි.
- මාරුවීම් සඳහා අල්ලස්දීම: ගුරුවරුන් 47.5% සහ නිලධාරීන් 34%ක් ඒ ගැන අසා තිබුණි
- බලපෑම් මත මාරුවීම්: නිලධාරියෙකුගේ නෑයකුවීම හෝ දැනහැඳිනගෙන සිටීම ප්‍රයෝජනවත් බව ගුරුවරුන් 79% සහ නිලධාරීන් 72%ක් එකඟ වූහ. දේශපාලන බලපෑම් මත මාරුවීම් කෙරෙන බව ගුරුවරුන් 85% සහ නිලධාරීන් 90%ක් කියා සිටියහ.

## ස්වේච්ඡා ගුරුවරුන්, වැඩබලන විදුහල්පතිවරුන් සහ උපදේශකවරුන්

සාමාන්‍ය හැඟීම වූයේ ස්වේච්ඡා ගුරුවරුන් පත්කිරීම ගැන රෙගුලාසි නැතිකම නිසා විනිවිදභාවයකින් තොරව පාසැල් මට්ටමින් විදුහල්පතිවරු ඔවුන් පත්කරන බවයි. ප්‍රාදේශීය මට්ටමින්ද සුදුසුකම් නැති අය පවා වැඩබලන විදුහල්පතිවරුන් සහ සේවාස්ථ උපදේශකයින් ලෙස දේශපාලනමය හේතූන් මත පත් කර තිබිණි.

• ස්වේච්ඡා ගුරු පත්වීම්: විදුහල්පතිවරුන්ගේ ඥාතීන් හෝ ඔවුන් හොඳින් දන්නා අය පත්කරන බව ගුරුවරුන් 40% සහ නිලධාරීන් 45%ක් කීහ.

• වැඩබලන විදුහල්පති පත්වීම්: විශාල වශයෙන් දේශපාලන පත්වීම් කෙරෙන බව ගුරුවරුන් 56% සහ නිලධාරීන් 62%ක් පිළිගත්හ.

• සේවාස්ථ උපදේශකයින් සහ අධ්‍යක්ෂවරුන් පත්කිරීම: දේශපාලන පත්වීම් කෙරෙන අතර බොහෝදෙනෙක් නුසුදුසු පුද්ගලයින් බව ගුරුවරුන් 50% සහ නිලධාරීන් 60%ක් පිළිගත්හ.

# 2 හැඳින්වීම

## ප්‍රගතිය

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රගතිය ප්‍රශංසනීයය. ජනගහණයේ වැඩිහිටියන් අතර අකුරු කියවීමේ හැකියාවේ ප්‍රතිශතය 90.7% කි. මෙය දකුණු ආසියාවේ අනෙකුත් රටවලට වඩා බෙහෙවින් වැඩිය. අධ්‍යාපනයේ ප්‍රගතිය හේතුවෙන් රටේ මානව සංවර්ධනය ඉහළ මට්ටමක පවතී. 20 වෙනි සියවසේදී, ශ්‍රී ලංකාවේ රජයේ පාසැල් විද්වතුන් හා නායකයින් රැසක් බිහිකර ඇත. අද අවුරුදු 5 -14 දක්වා දරුවන්ට අධ්‍යාපනය අනිවාර්යය. දුගී දුප්පත් සිසුන්ට පවා ප්‍රාථමික සහ ද්විතීය අධ්‍යාපනය ලබාගන්නට රජය සියලු පහසුකම් සලසයි. ප්‍රාථමික මට්ටමින් පාසල් වලට ඇතුල්කර ගන්නා ප්‍රමාණය 98%කි. ඒ සියලුදෙනාම පාහේ පස්වෙනි ශ්‍රේණිය අවසන් කරති. 2007 වසරේ ශ්‍රී ලංකාවේ ප්‍රාථමික සහ ද්විතීය පාසැල් ගණන 9,678 කි. ශිෂ්‍ය සංඛ්‍යාව තිස් නව ලක්ෂ හතළිස් දහසක් පමණය. ගුරුවරුන් ගණන 2,09,198 කි.

## මුදල්

1990 දශකයේ මුල් වසරවල සමාජයීය දියුණුවට හේතුවූයේ අධ්‍යාපනය සඳහා කරන ලද වැදගත් ආයෝජන බව පිළිගැනේ. ඊට අමතරව, 'සැමට අධ්‍යාපනය' නමින් 1990 දී ප්‍රකාශිත එක්සත් ජාතීන්ගේ ජොම්ටියන් ප්‍රකාශණයත්, (UN Jomtien Declaration) වසර 2000 දී 'ඩකාර් ෆ්‍රේම්වක් ෆෝ ඇක්ශන්'(Dakar Framework for Action) නමැති වැඩපිළිවෙලට අනුකූලවීමත් නිසා අධ්‍යාපන ක්ෂේත්‍රයට ලැබෙන ආධාර වැඩිවිය.

කෙසේවුවද, දැන් එතරම් සැලකියයුතු මුදල් ප්‍රමාණයක් අධ්‍යාපනය සඳහා වෙන් නොකෙරේ. වෙනත් ආසියානු රටවල් දෙස බලනවිට, මෙරට රජය වැයකරන මුලු මුදල් ප්‍රමාණයෙන් අධ්‍යාපනයට වෙන්කෙරන්නේ ඉතාමත් අඩු ප්‍රමාණයකි. (2005 දී අධ්‍යාපනය සඳහා වෙන්කෙරුණේ අයවැය ලේඛනයෙන් 6.8% කි). පසුගිය දශකයේදී දේශීය දළ නිෂ්පාදනයෙන් අධ්‍යාපනය සඳහා වෙන්කෙරුණේ 2%-3% ප්‍රමාණයකි. ඒ දකුණු ආසියාවේ සාමාන්‍යය 3.5% ක්ව පවතිද්දීය.

මේ අතර, එදිනෙදා වියදම් වැඩිවෙමින් පවතින බැවින් ප්‍රාග්ධන ආයෝජනවලට ඉඩක් නොමැති තරම්ය. එසේවුවද, ගුරු වැටුප් බෙහෙවින් අඩුය. ඒක පුද්ගල ජාතික ආදයමේ සමානුපාතයක් වශයෙන් ඉන්දියාව, බංගලිදේශය, මැලේසියාව සහ තායිලන්තය සමග සසඳා බලනවිට ශ්‍රී ලංකාවේ ගුරුවරුන්ට සාපේක්ෂව ලැබෙන්නේ අඩක් හෝ ඊට අඩු ප්‍රමාණයකි.

## ගුණාත්මක බව හා සමානතාව

මෑත කාලයේදී මෙරට අධ්‍යාපන ක්‍රමයේ ගුණාත්මකභාවය දියුණුවී ඇතත් ජාත්‍යන්තර විශේෂඥයින් කියන්නේ එය එතරම් සතුටුදයක නැති බවයි. සංඛ්‍යාත්මක දත්ත අනුව ඉගැන්වීමේ දුර්වලතා සහ වියදම් පාලනයේ දුර්වලතා පෙනීයයි: 2007 දී සාමාන්‍ය පෙළ (11 ශ්‍රේණිය) සමත්වූයේ 49% කි. සාමාන්‍ය පෙළ 27% ක් සහ උසස් පෙළ (13 ශ්‍රේණිය) 35% ක් ලෙස ප්‍රධාන විභාග ශ්‍රේණිවල නැවත වරක් පෙනීසිටි ප්‍රමාණය වැඩිය. අධ්‍යාපනයේ ලැබෙන ප්‍රතිඵල දුර්වලය. ප්‍රාථමික අධ්‍යාපනය අවසනදී ළමුන් තිදෙනෙකුගෙන් දෙදෙනෙක් භාෂාව සහ ගණිතය සඳහා බලාපොරොත්තුවූ මට්ටම් ලබාගෙන තිබුණේ නැත. 2005 දී ඉංග්‍රීසි වලින් නියමිත නිපුණත්වය ලබා සිටියේ 10%ක් පමණි. දිස්ත්‍රික්ක සහ පළාත් අතරද විශාල පරතරයක් තිබුණි.

ජනප්‍රිය පාසැල් ඇත්තේ නගරබදවය. ඒවායේ පහසුකම් වැඩිය. විශ්ව විද්‍යාලවල වෛද්‍ය, ඉංජිනේරු සහ විද්‍යා පීඨ වලට ශිෂ්‍යයින් වැඩි දෙනෙක් ඇතුල්වන්නේ නගරබද පාසැල්වලිනි. මේ නිසා නගරබද 'හොඳ' පාසැල්වලට ඇතුල්වීමට තියුණු තරගයක් ඇත. විශේෂයෙන්ම ඒ තරගය ඇත්තේ පළමුවන ශ්‍රේණියට සහ පහේ ශිෂ්‍යත්ව විභාගයෙන් පසු හයවෙනි ශ්‍රේණියට සිසුන් බඳවාගන්නා අවස්ථාවේදීය.

මේ අතර, 2005 දී 30% කට ආසන්න පාසැල් ප්‍රමාණයක එක් පාසැලක සිටියේ සියයකට අඩු සිසුන් පිරිසකි. පාසැල් 15.8% සිටි සිසුන් ගණන පනහට අඩුය. මෙහි ප්‍රතිඵලය වූයේ ඒවාට ලැබෙන පහසුකම් අඩුවීමය. මේවා බොහොමයක විද්‍යාව ඉගැන්වීම සඳහා පහසුකම් නොතිබුණි. පස්වෙනි ශ්‍රේණිය තෙක් පන්ති ඇති ප්‍රාථමික පාසැල් 775 ක් පමණ වතුකරයේ ඇත. ඒවායේ සිසුන්ට නගරබදව හෝ වතුකරයෙන් පිටත ඇති ද්විතීය පාසැල්වලට ඇතුල්වීම අසීරුය. දුර ප්‍රමාණය, ආර්ථික ප්‍රශ්න සහ වෙනත් අයුරින් සැලකීම ඊට හේතුවයි. යටිතල පහසුකම් අඩුවීම, පාසැල් පොත් හා වෙනත් උපකරණ හිගය සහ පුහුණු ගුරුවරන් නැතිකම නිසා මේ පාසැල්වල විෂය මාලාවල සිදුකර ඇති වෙනස්කම් ක්‍රියාත්මක නොවේ. උතුරු නැගෙනහිර යුද්ධමය වාතාවරණය හේතුවෙන් අධ්‍යාපන කටයුතු වල වඩාත් අසමානකම් පවතී.

## පරිපාලනය


දැනට පවත්නා අධ්‍යාපන පරිපාලනය ක්‍රියාත්මක වීම ඇරඹුණේ 1987 පළාත් සභා ක්‍රමය යටතේය. ඒ අනුව පළාත් ආයතන වලට ස්වයං පාලනය ලැබී තීරණ ගැනීමේ අයිතිය පැවරෙන බව කියැවිණ. කෙසේවුවද, ඒ සමගම දේශපාලනීකරණය සහ ඇඟිලිගැසීම් වැඩිවී ඇතැයි මෙම අධ්‍යයනයේදී අනාවරණවිය.

දැන් පවත්නා පරිපාලන ව්‍යුහය පස්වැදෑරුම්ය:

- අධ්‍යාපන අමාත්‍යාංශය
- පළාත් සභා අධ්‍යාපන අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු
- කලාපීය අධ්‍යාපන කාර්යාල
- කොට්ඨාශ අධ්‍යාපන කාර්යාල
- පාසැල් (පළාත් සහ ජාතික)

රජයේ පාසැල් වලින් 96% ක් කලාපීය අධ්‍යාපන කාර්යාල සහ ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාල මගින් පළාත් සභා අටක් විසින් පාලනය කෙරේ. ගුරු මාරු ඇතුළුව පළාතේ අධ්‍යාපන කටයුතුවල කළමනාකාරිත්වය සහ පරිපාලනය පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ පාලනය යටතේ ක්‍රියාත්මකවන පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ වගකීමයි. පළාත් සභාව අධ්‍යාපන සැලැස්ම සහ අයවැය පිළියෙල කරයි. පළාත් මට්ටමින් ගුරුවරුන්, විදුහල්පතිවරුන් සහ පාලන නිලධාරීන් බඳවාගෙන සේවයේ යොදයි. කලාපීය මට්ටමින් ගුරුවරුන් සහ විදුහල්පතිවරුන්ගේ මාරුවීම් සහ ඔවුන් සේවයේ යෙදවීම කලාපීය අධ්‍යාපන නිලධාරීන්ගේ කාර්යයයි. කෙසේවුවද, කලාපීය සහ කොට්ඨාශ කාර්යාලද අධ්‍යාපන අමාත්‍යාංශයට වාර්තා කළ යුතුය. (1 වෙනි වගුව බලන්න)

වගුව 1: අධ්‍යාපන සංවිධාන ව්‍යුහය




මූලාශ්‍රය : අධ්‍යාපන අමාත්‍යංශ වෙබ් අඩවිය - http://www.moe.gov.lk/education_his_3.html

පළාත් අධ්‍යක්ෂ අධ්‍යාපන අමත්‍යාංශයටත්,පළාත් අධ්‍යාපන අමත්‍යාංශයටත් වගකිව යුතුය. මෙය පාලනය කර ගැනීමට අසීරු කාරණයකි. පළාත් සභාව විසින් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට එහි අධ්‍යාපන ඇමතිවරයා මාර්ගයෙන් මූල්‍ය සම්පත් සහ කාර්ය මණ්ඩලය වෙන්කරන හෙයින් දේශපාලන බලපෑම් ඇතිවෙනවා නියතය. දේශපාලන උපායන් යොදාගනිමින් පළාත් මට්ටමේ ගුරු මාරුවීම් සහ පත්වීම් සඳහා මෙයින් ඉඩ සැලසේ.

## ප්‍රතිපත්ති

වසර 2006-2010 දක්වා කාල පරිච්ඡේදය සඳහා රජය විසින් පිළියෙල කර ඇති අධ්‍යාපන ක්ෂේත්‍රයේ සංවර්ධන සැලැස්මේ ඉහත සඳහන් අභියෝග බොහොමයක් ගැන සඳහන්වේ. අසාමානකම් හා අධ්‍යාපන ගුණාත්මකභාවය මෙන්ම පාලනයේ දුර්වලතා ක්ෂේත්‍රයේ ගැටලු වශයෙන් හඳුනාගෙන ඇති අතර ඒවා විසඳීමට විවිධ වැඩ සටහන් සැලසුම්කර ඇත.

සංවර්ධන සැලැස්මේ තේමා ඉලක්ක හතරකි:

- එක හා සමාන මූලික සහ ද්විතීය අධ්‍යාපනයක් සැලසීම
- අධ්‍යාපනයේ ගුණාත්මකබව වැඩිදියුණු කිරීම
- සම්පත් වෙන්කිරීමේදී කාර්යක්ෂමතාව සහ සමානතාව වැඩිකිරීම
- අධ්‍යාපන පාලනය සභා සේවා සැලසීම ශක්තිමත් කිරීම

මෙම සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව ඇතුලු වෙනත් ආයතන වලින් 2008-1012 කාලසීමාව වෙනුවෙන් රුපියල් බිලියන 11.2 ක් දීමට පොරොන්දුවී ඇත. මේ මුදල් අධ්‍යාපනයේ සමානාත්මතාව සහ ගුණාත්මකබව වැඩිකිරීමේ යෝජනා ක්‍රම වෙනුවෙනි.

## දූෂණ සහ අක්‍රමිකතා

අධ්‍යාපනය වේවා, සෞඛ්‍යය වේවා, ජලය වේවා - සාමාන්‍යයෙන් දූෂණය සහ දුර්වල පාලනය හේතුවෙන් සේවා ඉටුකිරීමේදී නිෂේධ බලපෑමක් ඇතිවේ. මෙම අධ්‍යයනයේ සඳහන් බොහෝ ගැටලු අධ්‍යාපන ක්ෂේත්‍රයට පමණක් සීමාවූ ඒවා නොව දුර්වල පාලනය සහ රාජ්‍ය අංශයේ දුර්වල කළමනාකාරිත්වය හේතුවෙන් ඇතිවන ඒවාය. කෙසේවුවද, අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිදුවන දූෂණය අනාගත පරපුරේ අගයන් සහ හැසිරීමට බලපෑම නිසා තත්ත්වය වඩාත් බරපතලය. අධ්‍යාපනයේ දූෂණ සමාජයේ වෙනත් අංශයන්ටද බලපෑම හේතුවෙන් ඒ පිළිබඳව විශේෂ සැලකිල්ලක් දැක්විය යුතුවේ.

දූෂණය අධ්‍යාපනයට විවිධ අයුරින් බලපායි. පුලුල් වශයෙන් ගත් කළ දූෂණය රටේ තීරණ ගැනීමේ ක්‍රියාවලියට බලපායි. අධ්‍යාපනයට වෙන්කෙරෙන සම්පත් විකෘති කරයි. යටිතල පහසුකම් සහ සංවර්ධන වැඩ සටහන්වලට නුසුදුසු අයුරු ආයෝජන සිදුකෙරෙයි. කළමනාකාරිත්වය අතින් නිසි සුදුසකම් නැති ගුරුවරුන් පත්කිරීමෙන් අධ්‍යාපනයේ ගුණාත්මකභාවයට බලපායි. සමහරවිට ගුරුවරුන් පාසැලට පැමිණ

නැත, නැත්නම් ඔවුන් උගන්වන්නේ නැත. පෙළපොත් ගුණාත්මකබවින් අඩුය, නැත්නම් ඒවා කලට වේලාවට ලැබෙන්නේ නැත. එසේත් නැත්නම් කෙසේවත් ලැබෙන්නේ නැත. පාසැල්වලට සිසුන් ඇතුලත් කිරීමේදී කෙරෙන වෙනස්කම් නිසා එක හා සමාන ප්‍රවේශයක් නොමැත. පහළ මට්ටමේ පාසැල්වලට ලැබෙන පහසුකම් අඩුය. මෙවන් තවත් විෂමතා බොහෝය.

වගුව 2 න් දූෂණයට හේතු/විධි සහ ප්‍රතිඵල විග්‍රහ කෙරේ.

| වගුව 2: අධ්‍යාපනයේ දූෂණයට හේතු/විධි සහ ප්‍රතිඵල (උදාහරණ) | | |
|---|---|---|
| හේතු → | විධි → | ප්‍රතිඵල → |
| • දේශපාලන හිතවාදිකම් | ගුරුවරුන් සහ නිලධාරීන්ගේ පත්වීම් හා මාරුවීම් වලදී පක්ෂපාතීත්වය | • ඉගැන්වීමේ හා පරිපාලනයේ දුර්වලකම් <br> • සුදුසුකම් ඇති ගුරුවරුන් සහ නිලධාරීන්ගේ උනන්දුව අඩුවීම <br> • ඒ ඒ ප්‍රදේශවල ගුරුවරුන් නිසියාකාරව බෙදී නොයෑම |
| • දේශපාලන හිතවාදිකම් | සාමාන්‍ය ක්‍රියාපටිපාටියෙන් පිට වැඩබලන විදුහල්පතිවරුන් පත්කිරීම | • පාසැල් කළමනාකාරිත්වය දුර්වලවීම <br> • අධ්‍යාපන කටයුතු දුර්වලවීම |
| • දේශපාලන හිතවාදිකම් <br> • නොසැලකිල්ල | ගුරු ණය දීමේදී පක්ෂ භජනය ගුරු ණය දීමේදී නියමිත මිනුම් අනුගමනය නොකිරීම | • ගුරුවරුන්ගේ උනන්දුව පළුදුවීම <br> • සාධාරණත්වයක් නැතිකම |
| • පාසැල්වලට ඇතුල්කිරීමේදී පදිංචිය පිළිබඳ නියමයන්ට <br> • රෙගුලාසි අපැහැදිලියි | ඇතුල් කිරීමේදී වංචා සිදුවීම/පදිංචිය පිළිබඳ අයුතු ප්‍රයෝජන ගැනීම | • අධ්‍යාපන ප්‍රවේශයේදී සාධාරණත්වයක් නැතිකම <br> • සමාජයීය අසමානත්වයන් ශක්තිමත් කිරීම |
| • ජනප්‍රිය පාසැල්වල තියුණු තරගය | පාසැල්වලට ඇතුල්කිරීමේදී අල්ලස්දීම | • සමාජයීය අසමානත්වයන් ශක්තිමත් කිරීම |
| • නියමිත පාසැල් ගාස්තු නැතිකම <br> • රෙගුලාසි නොපිළිපැදීම | අයුතුයි නීත්‍යානුකූල නොවේ/ නීතිවිරෝධී ගාස්තු සහ ගෙවීම් | • දුප්පතුන්ට බරක් පැටවේ <br> • සමාජයීය අසමානත්වයන් ශක්තිමත් කිරීම |
| • පහේ ශිෂ්‍යත්ව විභාගයෙන් පසු ජනප්‍රිය පාසැල්වලට ඇතුලවීමටත් තෘතීයික අධ්‍යාපනයටත් තියුණු තරගයක් <br> • අඩු ගුරු වැටුප් | ගුරුවරුන් පාසැල් වෙලාවෙන් පසුවත් සතිඅන්තවලත් ටියුෂන් පන්ති පැවැත්වීම | • දුප්පතුන්ට අවාසි <br> • සමාජයීය අසමානත්වයන් ශක්තිමත් කිරීම |
| • පාලනයන් ක්‍රියාවේ නොයෙදීම | පාසැල් දේපලවලින් අයුතු ප්‍රයෝජන ගැනීම | • රාජ්‍ය සේවයේ අවංකභාවය ගැන විශ්වාසය කඩවීම |
| • නොසැලකිලිමත්කම <br> • අඥානකම <br> • අපැහැදිලි රෙගුලාසි | ගුණාත්මක යෙදවුම් වැරදි ලෙස යොදාගැනීම/අනිසි ලෙස වෙන්කිරීම | • අධ්‍යාපනය දුර්වලවෙයි |
| • නොසැලකිලිමත්කම | පාසැල පොත් බෙදදීමේදී අක්‍රමිකතා සහ ප්‍රමාදයන් | • අධ්‍යාපනය දුර්වලවෙයි |
| • නොසැලකිලිමත්කම | වැටුප් වර්ධක සැකසීමේ ප්‍රමාදය | • ගුරුවරුන්ගේ උනන්දුව අඩුවෙයි |
| • නොසැලකිලිමත්කම | පස්වැනි ශ්‍රේණියේ ශිෂ්‍යාධාර ගෙවීම් ප්‍රමාදය | • සිසුන් සහ ගුරුවරුන්ගේ උනන්දුව අඩුවෙයි |

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය දූෂණය, අර්ථ කථනය කරන්නේ ''පැවරී ඇති බලය පුද්ගලික වාසිය සඳහා අනිසි ලෙස පාවිච්චි කිරීම'' යනුවෙනි.

කෙසේවුවද, ඇත්ත වශයෙන්ම, හිතාමතා බලය අනිසි ලෙස පාවිච්චි කිරීම, නොසැලකිලිමත්කම, නොමනා පාලනය (පුද්ගලික වාසියක් නොමැතිව බලය අනිසි ලෙස පාවිච්චි කිරීම), සහ සත්‍ය වශයෙන්ම වැරදි සිදුවීම අතර වෙනසක් දැකීම අසීරුය. සමහර අවස්ථාවලදී සිසුන්ගේ අභිවෘද්ධිය තකා නිලධාරීන් විසින් ක්‍රියාපටිපාටි සහ රෙගුලාසි මගහැරිය හැකිය. කෙසේවුවද, රජයේ මෙන්ම පෞද්ගලික නිලධාරීන්ගේ අසම්මත ක්‍රියාවන් හේතුකොටගෙන සම්පත් සහ සේවාවන් නිසි ලෙස පාවිච්චි නොකිරීමෙන් වෙනස්කම් කිරීම් වලට තුඩුදිය හැක. අකාර්යක්ෂමතාව, නොමනා පාලනය, සහ දුර්වල ක්‍රියාශීලීත්වය දූෂණය හා අතිනත ගනී. එයින් අසාධාරණකම් වලට සහ අධ්‍යාපනයේ ගුණාත්මකභාවයේ ඌනතාවයට මග පෑදේ. මෙවන් ක්‍රියාවන් සාමාන්‍යයෙන් මහජන අභිමතයට පටහැණිවේ.

එබැවින් මෙම අධ්‍යයනයේදී දූෂණය යනු නිලධාරී බලය මහජන සුභසිද්ධියට විරුද්ධව යොදගැනීම ලෙස අර්ථ කථනය කළ හැක. ශ්‍රී ලංකාවේ රාජ්‍ය අධ්‍යාපන ක්‍රමය පිළිබඳව කෙරෙන මෙම අධ්‍යයනයේ බොහෝ අංග මෙම අර්ථකථනයට යටත්වෙයි. ගුරුවරුන්, නිලධාරීන් සහ පාලකයින්ගේ නොසැලකිලිමත්කම, විනය පිරිහීම, නීතිරීති හා රෙගුලාසි නොතැකීම,දූෂණ ක්‍රියා ලෙස සැලකේ. එවන් ක්‍රියාවලින් අධ්‍යාපන අමාතාංශයේ මෙහෙවරෙන් කියැවෙන පරිදි ''පාර්ශවකරුවන් තෘප්තිමත්භාවයට පත්වන අයුරින් කාර්යක්ෂමතාව හා උසස් ගුණාත්මකතාවය බිහිකිරීම'' උගහටය.

දූෂණය සහ එයින් සංවර්ධනයට ඇතිවන ප්‍රතිවිපාක ගැන රජයේ සැලකිල්ල යොමුවූයේ 19 වෙනි සියවසේදීය. 1883 සිට අල්ලස් ගැනීම දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම් ලැබිය හැකි වරදකි. රාජ්‍ය සේවයේ අල්ලස් අඩුකිරීමේ අරමුණින් 1954 දී අල්ලස් පනත නීතිගත කරන ලදී. 1994 දී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පිහිටුවනු ලැබුවේ දූෂණය මැඩලීමේ පරමාර්ථයෙනි.

කෙසේවුවද, දූෂණය මැඩලීම සඳහා මහජනයාද දැනුවත්ව සිටීම වැදගත්ය. අධ්‍යාපන අයිතිවාසිකම් ගැනත්, සාධාරණව හා ගුණාත්මකව තමන් බලාපොරොත්තුවන මට්ටමින් අධ්‍යාපනය ලැබෙන බවටත් ඔවුන් දැනුවත්ව සිටිය යුතුය. දූෂණයට එරෙහිව ක්‍රියාකිරීම පිණිස පුරවැසියන්ට සිය රජයන් විසින් ඉටුවියයුතු වගකීම් ගැන දැනගතහැකි වැඩ පිළිවෙලක් අවශ්‍ය බව ජාත්‍යන්තර සංවිධාන පවා පිළිගනිති.

දූෂණය මැඩලීම සඳහා සිය වගකීම් ගැන සිවිල් සමාජය දැනුවත්කිරීමට මෙම අධ්‍යයනය ඉවහල් වනු ඇත. ඒ අතරම අධ්‍යාපනයේ යහපාලනය, සමානතාව සහ

ගුණාත්මක බව ශක්තිමත් කිරීමේ වැඩ සටහන් නිර්මාණය කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයට අවශ්‍ය වටිනා තොරතුරු ලබාදීමටද මෙයින් අදහස් කෙරේ. අධ්‍යාපනයේ සමානතාව සහ ගුණාත්මක බව සඳහා දූෂණය බලපාන අන්දම ගැන මෙහිදී විශේෂ අවධානය යොමු කෙරිනි. මෙම මූලික ඉලක්ක ඉටුකරගැනීමේදී දූෂණයේ හා ඊට අදාළ අක්‍රමිකතාවන්ගේ බලපෑම විමසිල්ලට ලක්විය.

# 3 අරමුණු සහ අධ්‍යයනයේ ක්‍රමවේදය

මෙම අධ්‍යයනයෙන් බලාපොරොත්තුවන්නේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ දූෂණය මැඩලීමටත්, දූෂණ විරෝධී ක්‍රියාමාර්ගයන් සැකසීමටත්, අධ්‍යාපනයට වැයකරන වියදම් වඩාත් ඵලදායි අයුරින් යොදාගැනීමටත්, අධ්‍යාපන අමාත්‍යාංශයට ප්‍රයෝජනවත් දත්ත ගබඩාවක් ලබාදීමයි. එමෙන්ම මහජනයා අතර මෙය සාකච්ඡාවට භාජනය කිරීමත්, සුදුසු ක්‍රියාමාර්ගයන් ගැනීමට විවිධ පාර්ශවකරුවන් පෙළඹවීමත් මෙයින් බලාපොරොත්තුවේ.

## අරමුණු

අධ්‍යයනය සඳහා හඳුනාගනු ලැබූ අරමුණු මෙසේය:

1. රාජ්‍ය අධ්‍යාපන ක්‍රමයේ ඇති දූෂණ වර්ග හා රටාවන් ගැන අවබෝධයක් ලබාගැනීම
2. රාජ්‍ය අධ්‍යාපන ක්‍රමයේ දූෂණ වර්ග ව්‍යාප්තිය සහ විශාලත්වය තක්සේරු කිරීම
3. අධ්‍යාපනයේ දූෂණය සම්බන්ධයෙන් සිවිල් සමාජය සහ පාර්ශවකරුවන් දැනුවත්කර දූෂණය මැඩලීම සඳහා විසඳුම් සෙවීමට ඔවුන් උනන්දුකරවීමට පසුබිම සැපයීම

## අධ්‍යයනයේ ක්‍රමවේදය

අධ්‍යයනය සඳහා යොදාගත්තේ ගුණාත්මක සහ ප්‍රමාණාත්මක ක්‍රම දෙකේ සංකලනයකි. දත්ත එකතුකරන ලද්දේ අවධි දෙකකදීය. එකක් පූර්ව පර්යේෂණ නිර්මාණ අවධියයි. අනෙක පර්යේෂණ අවධියයි. මේ අවධි දෙකම අන්‍යොන්‍ය වශයෙන් පෝෂණයවී එකිනෙකට සම්බන්ධවෙයි. පූර්ව පර්යේෂණ නිර්මාණ අවධියේදී දත්ත එකතු කිරීමට යොදාගනු ලැබුවේ ගුණාත්මක ක්‍රමයන්ය. එමගින් විචල්‍ය රටාවන් හඳුණාගැනීමට හැකිවූ අතර පර්යේෂණ අවධියේදී ප්‍රමාණාත්මක ක්‍රමයන් භාවිතා කරන ලදී.

## පූර්ව පර්යේෂණ නිර්මාණ අවධිය

පූර්ව පර්යේෂණ නිර්මාණ අවධියේදී මෙරට රාජ්‍ය පාසැල් ක්‍රමයේ ප්‍රමාණාත්මක තොරතුරු මගින් විවිධ පාර්ශවකරුවන් හඳුනාගන්නා ලදී. දැනට ඉගෙනුම ලබන ගැහැණු පිරිමි ශිෂ්‍යයින්, ආදි ශිෂ්‍යයින්, සිසුන්ගේ දෙමව්පියන් සහ පවුලේ සාමාජිකයින්, ගමේ නායකයින්, ගුරුවරුන් සහ කලාපීය, පළාත් සහ අමාත්‍යාංශ මට්ටමේ අධ්‍යාපන නිලධාරීන් ඒ අය අතරවූහ. පාර්ශවකරුවන් සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡා, සාකච්ඡා සහ ගැඹුරු අධ්‍යයන කණ්ඩායම් සාකච්ඡා මගින් දූෂණ ක්‍රියාවන්ගේ

විධි, රටාවන්, කාර්යයන් සහ සංවිධානය මෙන්ම භූගෝලීය ලෙස බෙදී යන ආකාරය ගැන තොරතුරු එකතුකර ගන්නා ලදී.

මෙම දෙයාකාරයේදීම ප්‍රතිචාරකයින් හඳුනාගත්තේ දැනුවත්කරුවන් ආශ්‍රයෙනි. ඒ ඒ විෂයයන් හා අනු කණ්ඩායම් වලට අදාල ලිපි ලේඛන එකතුකිරීමට අමතරව සෑම ස්ථරයකදීම අඩුම වශයෙන් සම්මුඛ සාකච්ඡා 3-10 දක්වාත්, ගැඹුරු අධ්‍යයන කණ්ඩායම් සාකච්ඡා එකක් හෝ දෙකකුත් පවත්වන ලද අතර නිරීක්ෂණ මගින්ද කරුණු එකතුකර ගන්නා ලදී. පූර්ව පර්යේෂණ නිර්මාණ අවධියේදී එකතුකරගත් තොරතුරු, ප්‍රශ්නාවලි පිළියෙල කිරීමටත් ප්‍රමාණාත්මක නිගමන සනාථකරගැනීමටත් යොදාගන්නා ලදී.

පර්යේෂණ අවධියේදී පරීක්ෂණ තුනකදී මිනුම් දත්ත එකතුකරන ලද්දේ තෝරාගත් ප්‍රජා නියැදි සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡා මගිනි. ක්ෂේත්‍ර කාර්යයන් ඇරඹීමට කලින් සහායකයින් පුහුණුකර ප්‍රශ්නාවලි අත්හදාබැලීමෙන් පසු යළි ඒවා සකස්කර මුද්‍රණය කරන ලදී.

වගුව 3 පූර්ව පර්යේෂණ නිර්මාණ අවධියේදී පවත්වන ලද සම්මුඛ සාකච්ඡා සහ සාකච්ඡා

| පාසැල් සිසුන් | සිසුන්ගේ දෙමව්පියන් | ආදි සිසුන් | සිවිල් සමාජ සංවිධාන | ගමේ නායකයෝ | පළාත් සහ කලාපීය අධ්‍යාපන නිලධාරීන් | ගුරුවරුන්/ විදුහල්පති වරුන් | අධ්‍යාපන අමාත්‍යාංශ/දෙපාර්ත මේන්තු නිලධාරීන් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| 7 | 13 | 10 | 4 | 3 | 6 | 9 | 7 | 59 |

## පර්යේෂණ අවධිය

## අධ්‍යයනය පැවැත්වූ ප්‍රදේශ

අධ්‍යයනය පැවැත්වූ ප්‍රදේශවලට මහනුවර දිස්ත්‍රික්කයේ නගරබද පෙදෙස්වල අඩු ආදායම් ලබන්නන්, නුවරඑළියේ වතුකරය, දකුණේ මුහුදුබඩ පෙදෙස් (අම්බලන්ගොඩ සහ හික්කඩුව), අනුරාධපුරය, මහියංගනය සහ ගිරාඳුරුකෝට්ටේ අඩුවෙන් සංවර්ධනයවී ඇති ප්‍රදේශ, පුත්තලමේ යුද ගැටුම් වලින් පෙලෙන ප්‍රජාවද අයත්විය. සෑම දිස්ත්‍රික්කයකින්ම ග්‍රාම නිලධාරී කොට්ඨාස දෙකක් අහඹු ලෙස තෝරගනු ලැබුවේ දිස්ත්‍රික්ක ලේකම් විසින් ලබාගත් ලැයිස්තුවකිනි. උතුර සහ නැගෙනහිර පළාත් මෙම අධ්‍යයනයෙන් ඉවත්කිරීමට සිදුවූයේ ඒ පළාත්වල පැවති තත්ත්වය හේතුකොටගෙනය.

අනුරාධපුරය, ගාල්ල, මහනුවර, නුවරඑළිය, බදුල්ල සහ පුත්තලම දිස්ත්‍රික්ක වලින් එකකින් නිවෙස් 200 බැගින් අහඹු ලෙස තෝරාගනු ලැබීය. අධ්‍යයනය සඳහා අධ්‍යයන ප්‍රදේශ 11 ක නිවෙස් නියැදි දහසක් තෝරාගනු ලැබුවේ ග්‍රාම නිලධාරී නිවෙස් ලැයිස්තු වලිනි. නිවෙස් 200 ට යමක් කමක් ඇති මධ්‍යම පාන්තික පවුල්ද අයත් වූහ.

ගුරුවරුන් සියයක් තෝරාගනු ලැබුවේ දෙආකාරයකටය. මුලින් පාසැල් ලැයිස්තු වලින් පාසැල් තෝරාගෙන ඉන්පසු අහඹු ලෙස ගුරුවරුන් තෝරාගනු ලැබූහ. එක් පාසැලකින් ගුරුවරුන් 10-15 දක්වා තෝරාගන්නා ලදී. සියයකට වැඩියෙන් සිටි පාසැල්වලින් ඊට වැඩි ගණනක් තෝරාගනු ලැබීය. සෑමවිටකම ඒ ඒ පාසැල්වල විදුහල්පතිවරුන්ගේ සහාය ලබා ගන්නා ලදී. ගුරුවරුන් සඳහා වෙනම ප්‍රශ්නාවලියක් පාසැලේදී හෝ නිවසේදී බෙදාදෙන ලදී. කීපවිටකදී තෝරාගත් ගුරුවරුන්ට ප්‍රශ්නාවලිය බාරදෙනු ලැබුවේ ඒ පිළිබඳව පංතියක් පැවත්වීමෙන් අනතුරුවය.


අධ්‍යාපන නිලධාරීන් සියය තෝරාගනු ලැබුවේ කලාපීය අධ්‍යාපන නිලධාරී කොට්ඨාස වලිනි. පංතියක් පවත්වා සමහර නිලධාරීන්ට ප්‍රශ්නාවලිය තේරුම්කරදෙනු ලැබූ අතර සමහරුන්ට එය උපදෙස් සහිතව බාරදෙනු ලැබුවේ නියමිත දිනකදී ආපසු භාර දෙන ලෙස දන්වමිනි.

සම්පූර්ණ නියැදිය 1200 ක් වුවත් නිවැසියන්, ගුරුවරුන් හා නිලධාරීන්ගේ ප්‍රශ්නමාලා සම්මුඛ සාකච්ඡා වෙන් වශයෙන් විග්‍රහකරනු ලැබුවත් උචිත අවස්ථාවලදී ඒවා එකට ගොනුකරන ලදී.

## නියැදි සංයුතිය

විවිධත්වයකින් සැදුණු නිවෙස් නියැදිය දෙමව්පියන් සහ භාරකරුවන් (82%) පාසැලින් පිටවූ අය (3.9%) සිසුන්ගේ ඥාතීන් (4.8%) සහ ගමේ නායකයින් (6.9%) යනුවෙන් විවිධ කොටස්වලින් සමන්විතවිය.


රූපය 1 නිවෙස් නියැදියේ වාර්ගික ව්‍යාප්තිය




ගුරුවරුන් සියයෙන් 23 ක් මහියංගනයෙනි. 18 ක් මහනුවරය. 8 ක් පුත්තලමිනි. 12 ක් ගාල්ලෙන් සහ 23 ක් නුවරඑළියෙනි. ඉතිරි 16 දෙනා ඒ ස්ථානවල පදිංචිකරුවන් වුවත් ඔවුන් ඉගැන්වූයේ විවිධ පළාත්වල පාසැල්වලය: කුරුණෑගල (1) බදුල්ල (5) අම්පාර (1) මඩකලපුව (1) ත්‍රිකුණාමලය (4) මොණරාගල (2) සහ මාතර (1) වශයෙනි.

නිලධාරීන් මහනුවර (29) පුත්තලම (14) නුවරඑළිය (17) අනුරාධපුරය (30) සහ ගාල්ල (10) යන ප්‍රදේශවලිනි. ඔවුන් අතර අතිරේක ලේකම්වරයෙක්ද අධ්‍යක්ෂවරුන් හය දෙනෙක්ද සහකාර අධ්‍යක්ෂවරුන් 61 දෙනෙක්ද වෙනත් නිලධාරීන් 32 දෙනෙක්ද වූහ.

රූපය 2: නිවෙස් නියැදියේ භූගෝලීය ව්‍යාප්තිය




## නියැදි ගතිලක්ෂණ

අධ්‍යයනයට තෝරාගත් නිවෙස් එක් දහසේ පදිංචිකරුවන්ගේ ගණන 4934 ක් විය. සාමාන්‍යයෙන් එක් පවුලක ප්‍රමාණය 4.93 කි. නිවසක අඩුම සංඛ්‍යාව දෙදෙනෙකු වූ අතර වැඩිම සංඛ්‍යාව 19 කි. වැඩියෙන් සිටි නිවෙස්වල පවුල් දෙකක් හෝ ඊට වැඩියෙන් සිටියහ. මහනුවර අඩු ආදායමක් ඇති දුප්පත් නිවෙස් වල පවුල් කීපයක් පදිංචිවී සිටි අතර අධ්‍යයනය සඳහා තෝරාගනු ලැබුවේ එක් පවුලක් පමණය.

සමහර නිවෙස්වල ගෘහමූලිකයන් වූයේ පාසැල් යන දරුවන්ගේ දෙමව්පියන් නොව නිවසේ අයිතිකරුවූ සීයා, ආච්චි, මාමා කෙනෙක් හෝ නැන්දෙ කෙනෙක්. දෙවතාවක් ගොස් දෙමව්පියන් මුණ නොගැසුණ අවස්ථාවලදී වෙනත් ජ්‍යෙෂ්ඨයකු හෝ ප්‍රතිචාරකයෙකුවීමට කැමැත්තෙන් ඉදිරිපත්වූ කෙනෙක් තෝරාගනු ලැබීය. ඉතාමත් සුළු ප්‍රමාණයක් දෙමව්පියන්ට පිටස්තරව ළමුන් රැකබලාගත් අය හමුවූ අවස්ථාවලදී ගෘහමූලිකයාට ඔවුන්ගේ නෑකම සඳහන් කරන ලදී. මේ නිසා සියලුම ප්‍රතිචාරකයින් දෙමව්පියන් නොවන බව සැලකිය යුතුය.

## පාසැල් ළමුන්

නිවෙස් දහසේ සිටි පාසැල් සිසුන් ගණන 1800 කි. එක් සිසුවකගේ සිට සිසුන් හතර දෙනෙකු දක්වා එක නිවසක සිටියහ. සිසුන් හතරදෙනා බැගින් සිටියේ 7% කට අඩු ප්‍රමාණයකය. සාමාන්‍යයෙන් සිටි ගණන දෙදෙනෙකි.


## ආදායම අතින් වර්ග කිරීම

පහළ පාන්තික නිවෙස්වලින් පාසැල් යන ළමුන්ගේ සංඛ්‍යාව වැඩියැයි පෙනීගියත් පන්ති වලට බෙදීමත්, පාසැල් යන ළමුන්ගේ සංඛ්‍යාවත් අතර එතරම් සම්බන්ධයක් නැතැයි කිව හැක. අධ්‍යයනයේදී හෙළිවුණු පාසැල් නොයන ළමුන් 45 දෙනා පහළ මධ්‍යම සහ පහළ පාන්තික නිවෙස් වලිනි.

නිවෙස් කොටස් තුනකට වර්ග කරනලදී. ඒ පහළ, පහළ මධ්‍යම, සහ මධ්‍යම යනුවෙනි. මෙසේ වර්ග කරනු ලැබුවේ විදුලිය ඇද්ද, පානීය ජලය ලබාගන්නේ කෙසේද වැනි කරුණු මෙන්ම ශීතකරණයක්/රූපවාහිණී යන්ත්‍රයක් සහ දුරකතනයක් වැනි පහසුකම් සිය නිවෙස්වල භාවිතා කෙරෙන්නේදැයි විමසා බැලීමෙනි. මෙලෙස වර්ගකිරීම අධ්‍යයනයට තෝරාගත් නියැදියේ සමාජ ආර්ථික රටාව තේරුම් ගැනීමට ප්‍රමාණවත් විය.

එසේ හඳුනාගත් නිවෙස් ඒ ඒ කොටස්වලට බෙදුණේ මෙසේය:

රූපය 3: ආදායම් අනුව පන්ති වලට වර්ගකළ විට නිවෙස් ප්‍රමාණයන්




නිවෙස් නියැදියේ වැඩි ප්‍රතිශතයක් මධ්‍යම පන්තියට අයත්වීම හේතුවෙන් අධ්‍යයනයේ අවසන් ප්‍රතිඵලවලට යම්කිසි බලපෑමක් සිදුවන්නට ඇත. මේ නිසා ප්‍රතිඵල සෝදිසියෙන් විමසා බැලිය යුතුය. ඒවා සාමාන්‍යයෙන් රටේ ජනගහණය නිරූපණය නොවන බව සැලකිල්ලට ගත යුතුය.

## දෙමව්පියන්ගේ අධ්‍යාපනය

දෙමව්පියන් අතුරින් මව්වරු 24.7% ක් සහ පියවරු 27.9% ක් ඉගෙනගෙන සිටියේ 9 වෙනි ශ්‍රේණිය දක්වාය. තවත් මව්වරු 25.2% ක් සහ පියවරු 22.4% ක් 11 වෙනි ශ්‍රේණිය හෝ ඊට ඉහළ අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණකර සිටියහ. පියවරු 41.1% ක් සහ මව්වරු 44% ක් 9, 10 හෝ 11 ශ්‍රේණිය සම්පූර්ණ කර තිබුණි. අධ්‍යාපනයක් නොලැබූවන් සිටියේ පියවරු 0.3% සහ මව්වරු 1.3% ක් පමණි.

සෙසු වාර්ගික කොටස් හා සසඳාබලන විට දෙමළ සහ මුස්ලිම් දෙමව්පියන් ලබා සිටියේ අඩු අධ්‍යාපනයකි. දෙමළ දෙමව්පියන් භාගයක් පමණ (මව්වරු 47.3% ක් සහ පියවරු 47.3% ක්) ද මුස්ලිම් මව්වරු 45.5% ක් සහ පියවරු 49% ක් අධ්‍යාපනය ලබා සිටියේ 9 වෙනි ශ්‍රේණිය දක්වා හෝ ඊට අඩුවෙනි. මුස්ලිම් මව්වරු 0.7% ක් 13 වෙනි ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලබා සිටි අතර එකම පියෙකුවත් එකී දුර අධ්‍යාපනයක් ලබා සිටියේ නැත. දෙමළ දෙමව්පියන් අතුරින් 13 වෙන ශ්‍රේණිය දක්වා හෝ ඉන් ඔබ්බට ඉගෙනුම ලබා සිටියේ පියවරු 0.6% ක් පමණි.

සමාජ ආර්ථික රටාවේ විවිධ පන්ති සහ අධ්‍යාපන මට්ටමේ නිතැතින්ම සම්බන්ධකමක් තිබුණි. 9 වෙනි ශ්‍රේණියට වඩා අඩුවෙන් අධ්‍යාපනය ලබා සිටි පියවරුන් අතුරින් මධ්‍යම පන්තියට අයත්වූයේ 17.6% කි. 13 වෙනි ශ්‍රේණියට හෝ ඊට වඩා අධ්‍යාපනය ලත් පියවරුන් 79.2% ක් මධ්‍යම පාන්තිකයන් වූහ. මව්වරුන් අතුරින් 13 වෙනි ශ්‍රේණියට හෝ ඊට වඩා අධ්‍යාපනය ලත් මව්වරු 86.7% ක් මධ්‍යම පන්තියට අයත් වූහ.


## රැකියාව

ගෘහමූලිකයාගේ රැකියාව සඳහන්කර තිබුණේ නිවෙස් 896 ක් (89.6%) පමණය. උසස් යයි සම්මත රැකියා කළ අය සිටියේ 5.5% ක් වැනි සීමිත ප්‍රමාණයකි. ව්‍යාපාර සහ වෙළඳාමේ නියුතුවූවන් 19.8% කි. වැඩිම පිරිසක් යාන්ත්‍රික රැකියාවල යෙදී සිටි අතර කම්කරුවන් සහ රැකියා නොමැති ගණයට අයත්වූ ප්‍රමාණය 22% කි. පන්ති සහ රැකියා අතර බෙහෙවින් සම්බන්ධකමක් පෙනුණි.

# 4 හෙළිවූ කරුණු

සමස්තයක් වශයෙන් නිවෙස් අධ්‍යයනයෙන් හෙළිවූයේ අධ්‍යාපන ක්‍රමය පිළිබඳව සාමාන්‍යයෙන් කවුරුත් බෙහෙවින් සෑහීමට පත්ව සිටින බවයි. ඉගැන්වීම ගැන දෙමව්පියන් දැරූ මතය රැඳී තිබුණේ පන්තියේදී සිය දරුවන් ලත් ප්‍රතිඵල අනුවය. පන්තියේදී සිය දරුවා මුල් 20 - 25% අතරට පැමිණුනේ නම් ඉගැන්වීම හොඳයැයි ඔවුහු පිළිගත්හ. ගුරුවරුන් පන්තිවලට පැමිණීම, ගෙදරදී කරන පාසැල් වැඩ පරීක්ෂාකර බැලීම, විෂය මාලා ආවරණය සහ ඉගැන්වීමේ පැහැදිලිකම වැනි කරුණුද ගණන් ගැනුණි. පාසැල් සිසුන් 1,756 ක් සිටි අධ්‍යයනයට ලක්වූ නිවෙස් එක් දහසෙන් 968 ක් පන්තිවල ඉගැන්වීම ගැන ප්‍රතිචාර දැක්වූහ. සියයට 80 ක් කීවේ තමන් සෑහීමට පත්වී සිටින බවයි.

රූපය 4: දරුවන්ගේ පාසැල් අධ්‍යාපනය ගැන දෙමව්පියන්ගේ හැඟීම්.




මෙවන් නියත අදහස් පළවෙද්දී අධ්‍යාපනයේ විවිධ දූෂණ හා අක්‍රමිකතා ඇතැයි සම්මුඛ සාකච්ඡා වලින් හෙළිවිය. පහසුවෙන් කරුණු හැදෑරීම සඳහා පර්යේෂණයෙන් හෙළිවූ කරුණු කොටස් හතරකට වෙන්කළ හැක:

## 4.1 පාසැල් මට්ටමේ දූෂණ

මෙම පුලුල් කොටසට පාසැල්වලට සිසුන් ඇතුලත්කර ගැනීම පිළිබඳ ගැටලු, දුර්වල මූල්‍ය පරිපාලනය සහ ගුණාත්මක යෙදවුම් කළමනාකාරිත්වය, පාසැල් දේපල අනිසි ලෙස පරිහරණය කිරීම, ගුරුවරුන් පන්තියේදී ඉගැන්වීම පසෙක තබා ටියුෂන් දීම, ගුරුවරුන්ගේ හැසිරීමේ දුර්වලතා හා පක්ෂපාතීත්වය, සහ විදුහල්පතිවරුන් සිය නෑදෑයින් ස්වේච්ඡා ගුරුවරුන් වශයෙන් බඳවා ගැනීම අයත්වේ.

## 4.2 ගාස්තු සහ ගෙවීම්

අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නියම කෙරුණු හෝ එසේ නොකළ ගෙවීම් හඳුනාගෙන අධ්‍යාපනය වෙනුවෙන් නිවෙස්වලට දැරීමට සිදුවන වියදම් මෙම කොටසින් පරීක්ෂා කෙරිණි. වැඩි වියදමක් දැරීමට සිදුවන එක් හේතුවක් නම් විදුහල්පතිවරුන්ට, පාසැල් සංවර්ධන සමිතිවලට හා නිලධාරීන්ට හොර රහසේ කෙරෙන ගෙවීම් විය හැකිය. මෙවන් ගෙවීම් කරන්නේ පාසැලට ඇතුලත්කිරීම් සඳහා වාසියක් අපේක්ෂාවෙන් හෝ පාසැල් අධිකාරීන් සමග හාදකම් පැවැත්වීමේ බලාපොරොත්තුවෙනි. එවන් ගෙවීම් ඔප්පු කිරීමට අසීරු වුවත් ඒවා දෙමව්පියන්ට සිය දරුවන් පාසැලේ රඳවා ගැනීමට උපකාරීවන්නට පුලුවන. මෙම ගෙවීම් දරුවන්ට සාධාරණව අධ්‍යාපන පහසුකම් ලැබීමේ අයිතියට බලපෑම් කළ හැකිය.

## 4.3 පරිපාලනය හා සම්බන්ධ දූෂණය

මෙයින් විස්තර වන්නේ කලාපීය, පළාත් සහ අමාත්‍යාංශ මට්ටමින් සිදුවන අක්‍රමිකතාවන්ය. මේවා විශේෂයෙන්ම ගුරුවරුන්ගේ සහ විදුහල්පතිවරුන්ගේ මාරුකිරීම්, පත්වීම් සහ උසස්වීම් හා සම්බන්ධ වෙයි.

## 4.4 දූෂණයට එරෙහි පැමිණිලි

දූෂණ හා අක්‍රමිකතා පිළිබඳ ආකල්ප සහ මෙම ගැටලු ගැන මහජනයා පැමිණිලි කරන්නේද නැත්නම් උදාසීන බවක් දක්වන්නේද යනුවෙන් මහජනයා ප්‍රතිචාර දක්වන ආකාරය මෙම කොටසින් විමර්ශණය කෙරේ.

## 4.1 පාසැල් මට්ටමේ දූෂණ

මෙම කොටසින් අවධානය යොමුවන්නේ ළමුන්ට බලපාන කාරණා සමූහයක් පිළිබඳවය. කාගේත් කතාබහට ලක්වී ඇති පදිංචිය පිළිබඳ කොන්දේසි ඇතුලුව සිසුන් පාසැල්වලට ඇතුලත්කිරීමේ ගැටලු, පෙළ පොත්, ගුණාත්මක යෙදවුම් මෙන්ම පහසුකම් අඩු පෙදෙස්වල සිසුන්ට විශ්ව විද්‍යාලයට ඇතුල්වීමට අතදීමක් ලෙස ආරම්භ කළ දිස්ත්‍රික්ක අනුපාත ක්‍රමය අනිසි ලෙස යෙදීම වැනි කරුණු මෙහිදී සාකච්ඡා කෙරේ. පන්තියේදී සිදුවන පක්ෂභජනය වැනි කාරණාද අවධානයට යොමුකෙරේ.

සමස්තයක් වශයෙන් නිවෙස් වැඩි ප්‍රමාණයක් (57.1%) කීවේ ක්‍රමයේ දූෂණයන් නැති බවය. පහෙන් එකක් (21.5%) කීවේ රාජ්‍ය පාසැල් ක්‍රමය දූෂිත බවය. තවත් 21.4% ක් පැත්තක් නොගෙන සිටියහ.

1970 ට පෙර තිබූ තත්ත්වයට වඩා දැන් පාසැල් ක්‍රමය පිරිහී ඇත්දැයි විමසූවිට නිවෙස් 29% ක් කීවේ පිරිහීමක් ඇති බවයි. ගුරුවරුන් 30.6% ක් සහ නිලධාරීන් 42.4% ක් ගුරු වෘත්තිය පිරිහී ඇතැයි කීහ.

### 4.1.1 පාසැල් වලට ඇතුලත්කිරීම්

විශේෂයෙන්ම පළවෙනි ශ්‍රේණියට සිසුන් ඇතුලත් කිරීමේදී ඇතිවන දූෂණ පාසැල් ක්‍රමය තුළ බෙහෙවින් කතාබහට යොමුවන මාතෘකාවකි. කෙසේවුවද, ප්‍රතිචාරකයින් වැඩිදෙනෙක් නීත්‍යානුකූල නොවන ගෙවීම් කිරීම හෝ බලපෑම් කිරීම ගැන සඳහන් කළේ නැත.

දෙමව්පියෝ පළවෙනි ශ්‍රේණියට සිය දරුවන් ඇතුල්කිරීමේදී පාසැල්වල කීර්තිය හා හොඳ නම සැලකිල්ලට ගනිති. මධ්‍යම පාන්තික දෙමව්පියෝ පාසැලක විභාග ප්‍රතිඵලවලට අමතරව විෂය මාලාවට පිටස්තරව කෙරෙන කටයුතු, ක්‍රීඩා පහසුකම්, සහ ඉංග්‍රීසි ඉගැන්වීම ගැන සැලකිලිමත් වෙති. තමන්ගේ දරුවන් විභාග වලින් අසමත්වූවත් හොඳ පාසැලක ආදි ශිෂ්‍යයන් නම් පෞද්ගලික අංශයේ රැකියා ලබාගැනීමට පුලුවනැයි බොහෝ දෙමව්පියෝ කල්පනා කරති.

නම් දැරූ පාසැල් වලට ඇති මෙම ඉල්ලුම නිසා බෙහෙවින් තරගකාරී තත්ත්වයක් ඇතිවෙයි. එහි ප්‍රතිඵලය පාසැල් අතර අසමානකම් ඇතිකිරීමයි. ඒ බව පහේ ශිෂ්‍යත්ව සහ සාමාන්‍ය හා උසස් පෙළ විභාග ප්‍රතිඵල වලින් පෙනීයයි. තරගකාරීත්වය වැඩිවෙත්ම, පාසැල් වලට ඇතුල්කිරීමේදි අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය පිළිබඳ අධ්‍යාපන අමාත්‍යාංශයේ 2006/20 අංක චක්‍රලේඛයත්, පහසුකම් ගාස්තු සහ පාසැල්

සංවර්ධන සමිතිවලට ගෙවන ගාස්තු හැරෙන්නට වෙනත් ගාස්තු අයකිරීම තහනම් කරන 1.5 කොටසත් උල්ලංඝනය කිරීමෙන් දූෂණයට දොර ඇරෙන බවට නිලධාරීන් 50% ක් එකඟවූහ.

### 4.1.1.1 'පදිංචිය' අයුතු ප්‍රයෝජනයට ගැනීම

පළවෙනි ශ්‍රේණියට සිසුන් ඇතුලත්කිරීමේ කොන්දේසි අතර පාසැලට නුදුරින් සිටීම වැදගත් එකකි. එය දූෂණයට තුඩුදෙන කරුණක්වී ඇත. බොහෝ දෙමව්පියන් සිය දරුවන් පාසැල්වලට ඇතුලත්කිරීමට සූදානම්වන්නේ නියමිත කාලයට වඩා බොහෝ කලින්ය. සමහරවිට දරුවා ඉපදුනු වේලේ සිටමය. වැඩියෙන්ම සිදු කෙරුණේ පාසැලට නුදුරින් නිවසක් මිලදී ගැනීම, කුලියට ගැනීම හෝ බද්දට ගැනීමයි. කෙටි මං සෙවූ බොහෝ දෙමව්පියෝ ඒ ගමනේදී දූෂණයට පෙළඹුනහ. පාසැලට නුදුරු ස්ථානයක පදිංචිය තහවුරු කරන ග්‍රාම නිලධාරියෙකුගේ සහතිකයක් අවශ්‍ය නොවුවත් පදිංචිය පරීක්ෂා කරන ලෙස විදුහල්පතිවරු ග්‍රාම නිලධාරීන්ට කීහ. මෙයින් සමහරවිට සිදුවූයේ සහතික කරවාගැනීමකට වඩා දෙමව්පියන් විසින් මිලදී ගැනීමකි.

අනෙක් අතට, ගුරුවරුන් 90% ක් සහ නිලධාරීන් 95% ක් කියා සිටියේ පදිංචිය පිළිබඳ කොන්දේසිය කුලියට හෝ බද්දට ගත් නිවෙස් වල සිටි ළමුන්ටත් අනවසරයෙන් පදිංචිවී සිට දුප්පත් පවුල්වල ළමුන්ටත් බලපෑ බවයි. බොහෝ පවුල් පරම්පරා ගණනාවන් මුළුල්ලේ මහනුවර ජනප්‍රිය පාසැල් අවට පන්සල්වලට අයත් ඉඩම්වල කුලියට හෝ බද්දට සිටියද, 'නියමාකාර' ලියවිලි නොමැතිකම නිසා පදිංචිය තහවුරු කිරීමට බැරිවීමෙන් ඔවුන්ගේ දරුවන්ට එම පාසැල් වලට ඇතුල්වීමට බැරිවූ අවස්ථා ගැන සඳහන් කෙරුණි.

පදිංචිය පිළිබඳ කොන්දේසියේ අඩුලුහුඬුකම් ඇතැයි ගුරුවරුන් 80% ක් සහ නිලධාරීන් 81% ක් අදහස් පළකළ අතර ඔවුන් සියයට 60 - 70 ක් එය දූෂණයට පෙළඹවිය හැකියයි පිළිගත්හ. ළමුන් පාසැල් වලට ඇතුලත්කිරීමේ ලකුණු ක්‍රමය ගැන සමහර දෙමව්පියෝ ප්‍රශ්න කළහ.

### 4.1.1.2 අතරමැදියන්ගේ ක්‍රියා කලාපය

සමහර පළාත්වල අවශ්‍ය ලියවිලි සකස්කරදුන් අතරමැදියෝ, ගාස්තුවකට ළමයා ඇතුල්කරදීමටද පොරොන්දුවූහ. තමන් විදුහල්පතිවරුන් හා ඇතුලත්කිරීමේ මණ්ඩලවල සිටින නිලධාරීන් අඳුනන බව කියමින් අතරමැදියෝ විශාල මුදල් ප්‍රමාණ ඉල්ලා සිටියහ. සමහරවිට රුපියල් සිය දහස් ගණනක් පවා ඉල්ලීමට ඔවුහු මැලි නොවූහ. වෙනත් ප්‍රදේශ වලට වඩා අතරමැදියන් ගැන සඳහන් කෙරුණේ ගාලු ප්‍රදේශයේදීය.

කඳුකරයේ පියෙක් මෙසේ කියයි:

මගේ දුව පළාතේ ජනප්‍රිය පාසැලකට ඇතුලත්කරවාගන්න රුපියල් අසූ දහසක් ගෙවුවත් වැඩක් වුණේ නෑ. පොරොන්දුවූ තැනැත්තා දැන් කොටස් වශයෙන් මුදල් ආපසු ගෙවනවා.

කියන කාරණා රහසිගතව තබාගන්නා බව කොතරම් කීවත් බොහෝදෙනා ළමුන් ඇතුලත්කිරීම ගැන කියන්නට මැලිවීම කැපීපෙනුණු කාරණයකි. සිය දරුවන් දැනට පාසල්වලට ඇතුල්වී සිටි නිසා යමක් කීමෙන් තමන්ගෙන් පළිගන්නට පුලුවන් යැයි සිතා ඒ අය කතාකිරීමට මැලිවූහ.

### 4.1.1.3 මුදල් සහ බලපෑම්

නිවෙස් 81 (81.1%) ක දෙමව්පියෝ තමන් විදුහල්පතිවරුන්ට අල්ලස් දුන් බව පිළිගත්හ. ඔවුන් අතුරින් 38% ක් මහනුවරිනි. 18.5% ක් අනුරාධපුරයෙනි. සෙසු අයගෙන් වැඩිදෙනෙක් හික්කඩුවෙන් සහ නුවරඑළියෙනි. අල්ලස් දුන් අයගෙන් 57% ක් මධ්‍යම පාන්තිකයන්ය. ගුරුවරුන් සහ නිලධාරීන්ගෙන් 14% ක්ද තමන්ගේ ළමයින් ඇතුලත්කරවා ගැනීමට විදුහල්පතිවරුන්ට අල්ලස් දී ඇත.

දුෂ්කර පළාතක පාසැලක විදුහල්පතිවරයෙක්:


ජනප්‍රිය පාසැල්වල විදුහල්පතිවරු වාහන නඩත්තු කරන්නේ කොහොමද? ඒ අය සුඛෝපභෝගී ගෙවල්වල ඉන්නේ කොහොමද? අපි දෙගොල්ලන්ටම හම්බ වෙන්නේ එකම පඩිය.

විදුහල්පතිවරුන්ට අල්ලස් දී ඇති පවුල් ගැන දන්නවාදැයි ඇසූ විට ගුරුවරුන් 36% ක් සහ නිලධාරීන් 34% ක් කීවේ එවැනි පවුල් ගැන දන්නා බවයි. ගුරුවරුන් 89% ක් සහ නිලධාරීන් 81% ක් කීවේ ළමුන් පාසැල්වලට ඇතුලත් කිරීමට විදුහල්පතිවරුන් අල්ලස් ගන්නා බව යි. ගුරුවරුන් සහ නිලධාරීන් 90% ක්ම මේ පුරුද්ද හෙලාදැක්කාහ.

නිවෙස් 155 ක (15.5%) ප්‍රතිචාරකයින් කීවේ තමන් විශාල මුදලක් පාසැල් සංවර්ධන සමිතිවලට දුන් බවයි. 5% ක් පමණ දේශපාලනඥයෙකුගේ උදව් පැතූ බවත් 7%ක් උසස් අධ්‍යාපන නිලධාරියෙකුගේ උදව් ලබාගැනීමට තැත් කළ බවත් කීහ. දේශපාලනඥයින්ගේ මාර්ගයෙන් දරුවන් ඇතුල්කරවා ගැනීමට තැත්කළ දෙමව්පියන් ගැන තමන් දන්නා බව ගුරුවරුන් 19% ක් සහ නිලධාරීන් 41% ක් කියා සිටි අතර


ගුරුවරුන් 98% ක් සහ නිලධාරීන් 89% ක් කීවේ අධ්‍යාපන නිලධාරීන් පවුලවලට සහ ඥාතීන්ට උදව්කළ බව දන්නා බවයි.

රූපය 5: ඔබේ දරුවා පාසැලට ඇතුලත්කිරීමේදී පහත සඳහන් සිද්ධීන්ට මුහුණ දුන්නාද?




බොහෝවිට දෙමව්පියන් පාසැල්වලට මුදල් තෑගිකළ අතර සමහරු පන්ති කාමර සාදදුන්හ. නැත්නම් පාසැලට පුටු මේස ලබාදුන්හ. මේවා දූෂණ ක්‍රියා නොවේදැයි ඇසූවිට ගුරුවරුන් 21.4% ක් සහ නිලධාරීන් 23% ක් කීවේ ඒවා පාසැලේ දියුණුවට ආධාර වශයෙන් ස්වේච්ඡාවෙන් දුන් ඒවා ලෙස සලකන බවයි. කෙසේවුවද, සෙසු ගුරුවරුන් 78.6% ක් නිලධාරීන් 77% ක් ඒවා සැලකුවේ දූෂණයන්ට ඉඟියක් කරන ක්‍රියාවන් හැටියටය.

රූපය 6: පාසැල්වලට ඇතුලත්කිරීම




පාසැල්වලට ඇතුලත්කිරීම ගැන විධිමත් වැඩ පිළිවෙලක් නොමැතිකම නිසා විවිධාකාරයේ දූෂණ ඇතිවන බව බොහෝ දෙනෙකුගේ මතය විය. ගුරුවරුන් සහ නිලධාරීන් 80-85% කගේ අදහසවූයේ සිසුන් ඇතුලත්කිරීමේ 2008/21 නව චක්‍රලේඛය ගැටලුවලට තුඩුදෙන බවය. එයින් පාසැල් ආසන්නයේ සිටින අයට හෝ පාසැලේ ආදි ශිෂ්‍යයින්ට වැඩක් නැතැයි දෙමව්පියෝ කල්පනා කළහ.

> මවකගේ කියමනක්:
>
> ඉස්කෝලෙට සිමෙන්ති දුන්න දෙමව්පියන්ගේ ළමයින්ට වැඩිපුර ලකුණු ලැබුණා.

ඇතුලත්කිරීමේ ගැටලු නිසා සමහර ළමුන්ට අවුරුද්දක් පමණ කාලයක් වුවත් පාසැල්යෑමට බැරිවිය. එවැනි ළමයින් ගැන දන්නා ගුරුවරුන් 8% ක් සහ නිලධාරීන් 22% ක් සිටියහ.

වැඩි ප්‍රමාණයක් වාර්තා නොවුවත් පාසැල්වලට ළමුන් ඇතුලත්කිරීමේදී අයුතු ක්‍රියාවන් සිදුවන බව පෙනේ. ඇතුලත්කිරීමේ කොන්දේසිවල ඇති දුර්වලතා මෙන්ම ජනප්‍රිය පාසැල්වලට ළමුන් ඇතුලත්කිරීමට ඇති තියුණු තරගය දූෂණය වැඩිකිරීමට හේතුවෙයි. මෙයින් ළමුන්ට අධ්‍යාපනය ලබාගැනීමට ඇති ඉඩ ප්‍රස්ථා ඇහිරෙනවා පමණක් නොව පොහොසත් දෙමව්පියන්ට අල්ලස්දීමේ හැකියාවත් යම් යම් අයගෙන් උදව් ලබාගැනීමට ඇති හැකියාවත් නිසා අනෙත් අයට අවාසිදයක තත්ත්වයක් ඇතිවීමෙන් සාධාරණත්වයද නැතිවෙයි.


අධ්‍යාපන අමාත්‍යාංශ නිලධාරියෙක්:

මගේ බෑණා කෙනෙක් සාමාන්‍ය පෙළ ඉහලින් සමත්වෙලා දකුණේ ජාතික පාසැලකට ඇතුලත්වීමට තැත්කළාම විදුහල්පති රුපියල් හැත්තෑපන්දහක් ඉල්ලුවා. එතරම් මුදලක් දෙන්න බැරියයි කීවාම පළාත් අධ්‍යක්ෂගෙන් ලිපියක් ගේන්න කිව්වා. ලියුම ලබාගෙන ඉදිරිපත්කළත් පන්ති කාමරයක් හදන්න කියා ආයිත් සැරයක් මුදල් ඉල්ලුවා. අන්තිමට කිව්වා පන්ති කාමරයක් හදදෙන්න නැත්නම් මුදල් ගෙවන්න කියා. තවම එහි අවසානයක් නෑ. ශිෂ්‍යයා පාසැලට අරගෙනත් නෑ.

### 4.1.2 පෙළ පොත්

ශ්‍රී ලංකාවේ පාසැල් සිසුන්ට පෙළ පොත් සහ පාසැල් නිල ඇඳුම් නොමිලේ බෙදදෙනු ලැබේ. පෙළ පොත් බෙදීමේදී ඇතිවන ප්‍රමාද සහ පෙළ පොත් වල මුද්‍රණ දුර්වලකම් දූෂණ ලෙස හැඳින්විය නොහැකිවුවත් එයින් සංවිධානාත්මක අකාර්යක්ෂමතාවය මෙන්ම සැලසුම් ක්‍රියාවලියේත් අධීක්ෂණයේත් ඇති දුර්වලතා ඉස්මතුවෙයි. මේ පිළිබඳව සිසුන්ගේ භාරකරුවන් 96.7%ක් (1,741) ප්‍රතිචාර දැක්වූ අතර 6.2% කට පොත් නොලැබුණ බවත්, 23.3% කට කලට වේලාවට පොත් නොලැබුණ බවත් පැවසූහ. ගුරුවරුන් සහ නිලධාරීන් 95% කට වඩා පෙළ පොත් බෙදීමේදී ප්‍රමාදයන් සිදුවන බව පිළිගත්හ. ගුරුවරුන් 58% ක් සහ නිලධාරීන් 56% ක් කීවේ ඊට හේතුව ප්‍රවාහණයේ දුර්වලතා බවයි.

රූපය 7: වසර තුළ ළමුන්ට නියම වේලාවට පෙළ පොත් ලැබුණාද?




පෙළ පොත්වලට මුදල් ගෙවූ බව කීවේ කීපදෙනෙකු පමණය. එසේ කී අය වැඩියෙන් නුවරඑළිය, හැටන් සහ මහනුවරිනි. පොත් ගැනීමට හෝ ඡායා පිටපත් ලබාගැනීමට එක් සිසුවකු 2008 දී සාමාන්‍යයෙන් මසකට රුපියල් 525 ක් වැයකර ඇත. පෙළ පොත් නැතිව සිටියේ, එසේ නැත්නම් ඒවා මිලදී ගත්තේ සුලු පිරිසක් වුවත් පොත් බෙදාහැරීමේදී ඇතිවූ ප්‍රමාදයන් අධ්‍යාපනයේ ගුණාත්මක බවට බලපෑවේය.

### 4.1.3 ගුණාත්මක යෙදවුම්

ගුණාත්මක යෙදවුම් වලට මුදල් දෙනු ලබන්නේ දෙමව්පියන්ට බරක් දැරීමට ඉඩ නොතබා සිසුන්ට පංතියේදී ප්‍රායෝගික කටයුතු සඳහා අවශ්‍ය පොත් හැර වෙනත් ලිපි ද්‍රව්‍ය, ඉගැන්වීමට අවශ්‍ය අමතර උපකාරකයන් වැනි මූලික අවශ්‍යතා සපුරාලම සඳහාය. ගුණාත්මක යෙදවුම් පිළිබඳව චක්‍රලේඛ කීපයක්ම නිකුත්කර ඇති අතර කලාපීය සහ පළාත් මට්ටමින් විදුහල්පතිවරුන්ට සහ ගුරුවරුන්ට පුහුණු වැඩ සටහන් ගණනාවක්ම පවත්වා ඇත. මේ හේතුවෙන් නිවෙස් විශාල ප්‍රමාණයක් ගුණාත්මක යෙදවුම් ගැන දැනසිටියහ. ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් මේ මුදල් අනිසි ලෙස පාවිච්චි කරනවා ඇද්දැයි ඇසූ විට දෙමව්පියන් 20% ක් ඒ ගැන දැනසිටියේ නැත. 35% ක් පමණක් එම මුදල් අනිසි පාවිච්චි කිරීමට ඉඩ ඇතැයි කීහ.

පියෙකුගේ කියමනක්:

මම ගුරු දෙගුරු සංගමයේ ක්‍රියාකාරී සාමාජිකයෙක්. ගුණාත්මක යෙදවුම් ගැන මම දන්නවා. ගුරු දෙගුරු සංගමයේ මුදල්පාලක තෝරාපත්කරගන්නේ දෙමව්පියන් අතුරෙන්. දැන් (අධ්‍යයනය පැවැත්වෙන කාලසීමාවේදී) ඒ තනතුර දරන්නේ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙක්. පසුගිය රැස්වීමේදී ගිණුම් පිළබඳව ප්‍රශ්න කිරීමට මම සූදානම්ව සිටියත් දේශපාලනඥයා ඉක්මනට හොරෙන්ම වාගේ ගිණුම් අනුමතකරවා ගත්තා. සහකාර මුදල් පාලක හැටියට කටයුතු කළේ ගුරුවරයෙක්. ඔහු කීපවතාවක්ම මගේ සාප්පුවට ඇවිත් සාප්පුවෙන් පාසැලට ගත්ත ලිපි ද්‍රව්‍ය හා වෙනත් දේවල් වලට දුන්න රිසිට් නැතිවෙලා කියලා අලුත් ඒවා ඉල්ලුවා. මට එතකොට තේරුණා ගුණාත්මක යෙදවුම් සල්ලි වලට මොනවා වෙන්න ඇතිද කියල. මම මේ ගැන ඊළඟ රැස්විමේදී අහනවා.


ගුණාත්මක යෙදවුම්වල නාස්තියක් තිබෙන බව ගුරුවරුන් 98% ක් සහ නිලධාරීන් 91% ක් පිළිගත්හ. බොහෝ පාසැල් මේ මුදල් කෙසේ පාවිච්චිකළ යුතු දැයි හරිහැටි අවබෝධයක් නොමැතිකමින් මනාව පාලනය නොවන බව ගුරුවරුන් 94% ක් සහ නිලධාරීන් 98% ක් කියා සිටියහ. ගුරුවරුන් 89% ක් සහ නිලධාරීන් 86% ක් කීවේ විශේෂයෙන්ම වතුකරයේ සහ බෙහෙවින් පිටිසර පළාත්වල පාසැල් ගුණාත්මක යෙදවුම් නුසුදුසු අයුරු භාවිතාකරන බවයි.

ගුරුවරුන් සමග සාකච්ඡාවකින්:

අධ්‍යාපන අමාත්‍යාංශයෙන් උපදෙස් දී ඇතත් මුදල් රෙගුලාසිවලට බියෙන් විදුහල්පතිවරුන් මේ මුදල් පාවිච්චි නොකිරීම නිසා ගුණාත්මක යෙදවුම්වලට වෙන්කෙරන මුදල් නාස්තිවෙනවා. හුඟක් වෙලාවට එහෙම වෙන්නේ විදුහල්පතිවරුන්ට දැනුමක් නැතිකම නැත්නම් උදාසීනකම නිසා.

ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් බොරු රිසිට් පත් ඉදිරිපත් කරමින් වංචාකරන නිසා හුඟක් පාසැල්වල ළමයින්ට ගුණාත්මක යෙදවුම්වලින් වැඩක් වන්නේ නෑ. මේ පාසැල්වල ළමයින්ට පන්තියේ පාවිච්චියට වාරය මුලදී ලිපි ද්‍රව්‍ය, පැන්සල් ආදී දේවල් ගේන්න කිව්වත් ශිෂ්‍යයින්ට දෙන්නේ එයින් සුලු ප්‍රමාණයක් පමණයි. අනිත් ඒවාට මොනවා වෙනවාද කියා දන්නේ නෑ.

රූපය 8: ගුණාත්මක යෙදවුම්




මුදල් පාවිච්චි නොකිරීම, ගුණාත්මක යෙදවුම් මුදල් අනිසි ලෙස පාවිච්චි කිරීම, පාසැල් සංවර්ධණ කමිටු රැස්වීම්වලදී ගිණුම් ඉදිරිපත් නොකිරීම, ගුණාත්මක යෙදවුම් ගැන දෙමව්පියන් දැනුවත් නොකිරීම වැනි දූෂණ ක්‍රියා විදුහල්පතිවරුන් සහ ගුරුවරුන් අතින් සිදුවේ. මෙයින්ද අධ්‍යාපන ගුණාත්මකභාවයේ ඇති ගැටලු ඉස්මතුවෙයි.

### 4.1.4 පස්වෙනි ශ්‍රේණියේ ශිෂ්‍යාධාර

වැඩි දෙනෙක් සඳහන් නොකළත්, පස්වෙනි ශ්‍රේණියේ ශිෂ්‍යාධාර කලට වේලාවට නොලබාදීම දූෂණයක් ලෙස පෙන්වා දෙනු ලැබීය.

### 4.1.5 ශිෂ්‍යයින්ට විභාග නිවාඩු

සාමාන්‍ය සහ උසස් පෙළ විභාගයට පෙනී සිටින සිසුන්ට දෙවෙනි වසර අවසානයේදී විභාගයට පාඩම් කිරීම සඳහා සමහරවිට තුන් මාසයක් පවා නිවාඩු ලැබුණි. මෙය අධ්‍යාපන අමාත්‍යාංශයේ 2006/45 චක්‍ර ලේඛයට පටහැණිය. ජ්‍යෙෂ්ඨ අධ්‍යාපන අමාත්‍යාංශ නිලධාරියෙකු කී අන්දමට අවසන් වාරයේ අවසන් දිනය දක්වා ඉගැන්වීමේ

කටයුතු කළ යුතුය. විභාග නිවාඩු දීමෙන් සිසුන්ට විභාගවලට පෙනීසිටීමට අවශ්‍ය 80% ක පාසැලට පැමිණීමේ අවශ්‍යතාවය සම්පූර්ණ කර ගැනීම අසීරුය. ඔහු කියන පරිදි සිසුන් විභාග නිවාඩු පිට යැවීම නීති උල්ලංඝනය කිරීමක් මෙන්ම බරපතල දූෂිත ක්‍රියාවකි.

> සිවිල් සමාජ සංවිධානයක් කී දේ:
>
> උසස් පෙළ විභාගයට කලින් ශිෂ්‍යයන්ට තුන් මාසයක් නිවාඩු ලැබෙනවා. එතකොට ගුරුවරුන් කරන්නේ මොකක්ද? බොහෝවිට ඔවුන් ටියුෂන් පන්ති පවත්වනවා. බොහෝ අය උදේ තමන්ගේ පන්තිවලට එන ශිෂ්‍යයින්ට හවස්වරුවේ ටියුෂන් පන්ති පවත්වනවා. මෙය ආචාර ධර්ම වලට බෙහෙවින්ම පටහැණියි. ඒ වගේම මේක දූෂණයක්.

සාමාන්‍ය සහ උසස් පෙළ සිසුන්ට මාසයක සිට මාස තුනක් දක්වා තමන්ගේ පාසැල්වල නිවාඩු දෙන බව ගුරුවරුන් 35% ක් කියා සිටියහ. නිලධාරීන් 25% ක් මෙම ක්‍රියාව දැන සිටියත් ඒ ගැන කිසිදු ක්‍රියාමාර්ගයක් අනුගමනය කළේ නැත. සිවිල් සමාජ සංවිධානයක් කීවේ ගුරුවරුන් මුදල් අයකරමින් නිවාඩු පිට සිටින සිසුන් සඳහා ටියුෂන් පන්ති පවත්වන බවයි.

## 4.1.6 විශ්ව විද්‍යාලයට ඇතුල්වීමේ දිස්ත්‍රික්ක අනුපාත ක්‍රමය

විශ්ව විද්‍යාලවලට ඇතුල්වීම් සඳහා ලකුණු ගණන් ගැනීමේදී අධ්‍යාපන පහසුකම් අඩුයැයි සැලකෙන නුවරඑළිය සහ මොනරාගල දිස්ත්‍රික්කවලින් උසස් පෙළ විභාගයට පෙනී සිටින සිසුන්ට විශේෂ සහන ලැබේ. මේ හේතුවෙන් වැඩි පහසුකම් ඇති කොළඹ, ගාල්ල හෝ මහනුවර වැනි පෙදෙස්වල සිසුන් මෙහි පැමිණ විභාගයට පෙනී සිටිති. විදුහල්පතිවරුන් සහ නිලධාරීන් අල්ලස් ගෙන මෙම දිස්ත්‍රික්කවල පාසැල්වලට ඒ අය ඇතුල්කර ගන්නා බව අධ්‍යයනයේදී හෙළිවිය.

ප්‍රාදේශීය නිලධාරීන් සාකච්ඡාවකදී කී දේ:

එක් දිස්ත්‍රික්කයකින් උසස් පෙළ විභාගයෙන් සමත්වෙලා විශ්ව විද්‍යාලයට ඇතුල්වුණු ශිෂ්‍යයන් බොහොමයක් වෙනත් දිස්ත්‍රික්කවලින් පැමිණි අය බව මේ ගැන සොයාබැලූ නිලධාරියෙකුට පෙනී ගියා. සිංහල සහ දෙමළ ළමයි මේ අය අතර සිටියා. සමහරු ඇවිත් සිටියේ සරණාගතයින් හැටියට. මේ දිස්ත්‍රික්කයේ හුඟක් පාසැල්වල විද්‍යා හෝ ගණිත ගුරුවරුන් නැති නිසා සිසුන් පන්ති 'කට්' කරල දිස්ත්‍රික්කයේම නැත්නම් පිට පළාත්වල ටියුෂන් පන්තිවලට ගියා. විභාගයට පෙනී සිටින්න 80% ක් පැමිණීම තියෙන්න ඕන නිසා ගුරුවරුන් සමග එකතුවෙලා ඒ අය පැමිණීම ලකුණු කර තිබෙනවා.

කොළඹ, මහනුවර සහ වෙනත් දිස්ත්‍රික්කවල පොහොසත් දෙමව්පියන් නුවරඑළිය සහ මොණරාගලින් ඉඩම් හා ගෙවල් මිළදී ගෙන ළමයින් විභාගයට සමත්වූ පසු ඒවා වැඩි ගණනට විකුණා දැමූ බවත් හෙළිවිය. ඒවා විකුණන්නට ඇත්තේ එවැනිම වෙනත් දෙමව්පියන්ට වන්නට පුලුවන. ඒ දිස්ත්‍රික්කවල ගෙවල් විකිණීමට හෝ බදු දීමට පුවත්පත් දැන්වීම් පළවූයේ මේ නිසාය.

රාජ්‍ය නොවන සංවිධානයක් සමග පැවැත්වූ සාකච්ඡාවකදී..

නොදියුණු දිස්ත්‍රික්කවල ශිෂ්‍යයින් විශේෂයෙන්ම දෙවෙනි වතාවට උසස් පෙළ විභාගයට පෙනී සිටින්නට කලින් මහනුවර, මාතර වගේ තැන්වල ටියුෂන් පන්තිවලට ගිහින් ඉගෙන ගන්නවා. හැබැයි විභාගෙට පෙනී ඉන්නේ ඒ අය පදිංචි දිස්ත්‍රික්කවලින්. මෙයින් ඒ අයට විභාගයේදී වාසියක් ලැබෙනවා. අපි දන්නවා පදිංචිය ඔප්පු කරන්න නොදියුණු දිස්ත්‍රික්වල ගෙවල් කුලියට ගන්න අය ගැන. මේක ලොකු අපරාධයක්. දුප්පතුන්ට ලබාදීල තියෙන පහසුකමක් අයුතු ලෙස ප්‍රයෝජනයට ගැනීමක්.

ප්‍රජා නායකයෙක්:

දියුණු ප්‍රදේශ වල අය සියඹලාණ්ඩුව, මොනරාගල වගේ පැතිවලින් ගෙවල් කුලියට අරන් ඒ අය ඒ පැතිවල පදිංචිකාරයින්ය, ළමයි යන්නේ එහෙ පාසැල්වලටය කියා කියනවා. ඇත්ත වශයෙන්ම ළමයි යන්නේ මහනුවර, මාතර නැත්නම් කොළඹ පාසැල්වලට. හැබැයි විභාගෙ ගන්නේ මොනරාගල දිස්ත්‍රික්කයෙන්. දෙවෙනි වතාවට මොනරාගලින් උසස් පෙළ විභාගයට පෙනී සිටින ශිෂ්‍යයෝ පන්ති වලට යන්න නුවරට ගාල්ලට මාතරට යනවා. මේ තත්ත්වය ගැන මොනරාගල දිස්ත්‍රික්කයේ නොදියුණු පාසැල්වල ගුරුවරුන්ටත් විදුහල්පතිවරුන්ටත් දෙස් කියන්න ඕනෑ. තමන්ගේ පාසැල්වල ඇතිතරම් ශිෂ්‍යයින් ඉන්නවාය, සාමාන්‍ය, උසස් පෙළ විභාගවල හොඳ ප්‍රතිඵල ලබනවාය කියා ඒ අය අමාත්‍යාංශයට පෙන්වනවා. ඒ අයට දෙමව්පියන්ගෙන් වටිනා තෑගි බෝග ලැබෙනවා. මේක ඇත්තටම දූෂණයක්.

දෙමව්පියන් මෙසේ ගුරුවරුන් සහ නිලධාරීන් සමග එකතුවී කූට උපක්‍රම යොදගැනීමෙන් සිදුවන්නේ අමාරුකම් මධ්‍යයේ ඉගෙනගන්නා සිසුන්ට උසස් අධ්‍යාපනයක් ලැබීමේ අවස්ථාව ගිලිහී යෑමයි.

## 4.1.7 ගුරුවරුන්ගේ හැසිරීම සහ පක්ෂභජනය

ගුරුවරුන් පන්තියේ ඉගැන්වීමට පෙර පාඩම් සැලසුම් පිළියෙල කරගත යුතුය. මේවායේ අවශ්‍යතාවය සියලුම ගුරුවරුන් සහ නිලධාරීන් පිළිගත් නමුත් ගුරුවරුන් 61.6% ක් සහ නිලධාරීන් 82% ක් කීවේ මේවා සිදුනොකෙරෙන බවයි. බොහෝ ගුරුවරුන් පන්තිවලට යන්නේ කිසිදු සූදානමක් නොමැතිවයැයි ගුරුවරුන්, විදුහල්පතිවරුන් සහ අධ්‍යාපන නිලධාරීන්ගේ මතය විය. විෂය මාලා සම්පූර්ණ කිරීම ගැන දෙමව්පියන් 70% ක් සෑහීමට පත්ව සිටීම ඉගැන්වීමේ සාර්ථකත්වයේ සලකුණක් ලෙස සැලකිය නොහැක. සුදුසු ක්‍රමවේදයන් අනුගමනය කිරීම වැනි වෙනත් කරුණුද සැලකිල්ලට ගතයුතුය.

මේ අතර, පාසැල් තෑගි සහ ශිෂ්‍ය නායකයින් පත්කිරීමේදී මෙන්ම විශේෂ අවස්ථා සඳහා සිසුන් තේරීමේදී පක්ෂභජනය සිදුවන බව බොහෝ දෙනෙක් කීහ. ශිෂ්‍ය නායකයින් පත්කෙරෙන්නේ ගුරුවරුන් කැමති අය අතුරෙන් දැයි ඇසූවිට ගුරුවරුන් 68% ක් සහ නිලධාරීන් 87% ක් ඊට එකඟවූහ. තෑගි ප්‍රදානෝත්සවයේදී තෑගි දෙනු

ලැබුවේ සුදුසුකම් වලට වඩා ගුරුවරුන් තේරූ අයට යැයි ගුරුවරුන් 68% ක් සහ නිලධාරීන් 79% ක් කීහ. තෑගි සඳහා තෝරාගනු ලැබුවේ නිතිපතා පැවැත්වෙන වාර විභාග අනුව නොව විශේෂ විභාගයක් පැවැත්වීමෙනි.

මවක සමග සාකච්ඡාවකදී..

ශිෂ්‍ය නායකකම් ලබාගන්ටත්, පාසැල් තෑගි ලබාගන්ටත් දෙමව්පියන් ගුරුවරුන්ට තෑගි දෙනවා. දෙස්තර කෙනෙකුගේ පුතෙක් ඉංග්‍රීසි තෑග්ග දිනාගත්තේ ඒ විධියට බව කවුරුත් දන්නවා. ශිෂ්‍ය නායකයන් තෝරාගන්න ගුරුවරුන් ඡන්දෙ දෙනවා. එතකොට පක්ෂභජනයක් ඇතිවෙනවා. ඉංග්‍රීසි දිනය නැත්නම් විවිධ ප්‍රසංග පවත්වනකොට ඒවාට ළමයි තෝරාගන්නේ දෙමව්පියන්ගේ තත්ත්වයේ හැටියට. වැඩියෙන්ම තේරන්නේ දෙස්තරවරුන්ගේ නැත්නම් උසස් නිලධාරීන්ගෙ ළමයි.

ගුරුවරුන් 65% ක් සහ නිලධාරීන් 74% ක් කී හැටියට ක්‍රීඩාවලට පිරිනැමෙන පාසැල් වර්ණ සහ තෑගි, සුදුසුකම් ඇති සිසුන්ට නොලැබේ. ඒවා ප්‍රදානය කිරීම ප්‍රමාද කරන අවස්ථාද ඇත. මෙවැනි අනිසි ක්‍රියාවන් ගැන දෙමව්පියන් 30-35% ක් පමණ දැන සිටියහ.

ගුණාත්මක සම්මුඛ සාකච්ඡාවලදීත් මෙම අනිසි ක්‍රියාවන් හෙළිවිය.

පන්තිවල ඉගැන්වීම සඳහා සූදානමක් නොමැතිකම අධ්‍යාපනයේ ගුණාත්මක බවට බලපාන බව මෙම අධ්‍යයනයේදී පෙනීගිය කාරණයකි. විශේෂයෙන්ම නව අධ්‍යාපන ක්‍රමය යටතේ පාඩම් කියාදීමට වඩා සිසුන්ගේ සහභාගිත්වය ඇතිව පන්ති පැවැත්විය යුතු හෙයින් මෙය බෙහෙවින් බලපායි. අනෙක් අතට, ගුරුවරුන් යුක්තිය සහ සාධාරණත්වය විදහාපාමින් උසස් සදාචාරාත්මක චරිතයක් ලෙස පෙනීසිටියයුතු වුවත්, පක්ෂභජනයෙන් කටයුතුකිරීම නිසා ළමුන්ගේ සිතේ මැවෙන්නේ මොනවා කළත් ප්‍රශ්නයක් නැති බවයි.

# 4.2 ගාස්තු සහ ගෙවීම්

මෙරට නිදහස් අධ්‍යාපන ක්‍රමය යටතේ ළමුන් පළවෙනි ශ්‍රේණියේ සිට 13 වෙනි ශ්‍රේණිය දක්වා පාසැලේ සිටිය යුතුය. මේ කොටසින් පෙන්වාදෙනු ලබන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නියම කර ඇති ගාස්තු වලට අමතරව අධ්‍යාපනය සඳහා වැයකළ යුතු වෙනත් වියදම්ය. ගාස්තු වල නාමයෙන් විවිධ දූෂණ ක්‍රියාවන් සිදුවන බවට සාධක ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශයෙන් උපරිම ගාස්තු නියමකර නොතිබීම නිසා සිසුවෙකුගෙන් අයකළ හැකි ඇතුලත්කිරීමේ ගාස්තු පිළිබඳව ගුරුවරුන් සහ විදුහල්පතිවරු විවිධ අදහස් පළකළහ. පහසුකම් ගාස්තු සහ පාසැල් සංවර්ධන කමිටුවට ගෙවියයුතු ගාස්තු වලට අමතරව වෙනත් ගාස්තු අයකළ නොහැකියයි අංක 2006/20 චක්‍රලේඛයෙන් නියම කර ඇතත්, ඇත්ත වශයෙන්ම වෙනත් විවිධ වර්ගයේ ගාස්තු අයකෙරේ. බොහෝවිට එම ගාස්තු නොයෙකුත් කටයුතු මුල්කරගෙන අයකෙරෙන ඒවාය.

නිවෙස් 21% ක් කීවේ අධ්‍යාපනයට යන වියදම අධික බවයි. එහෙත් මධ්‍යම පාන්තික පවුල් එය එසේ නොවන බව කීහ. ඔවුන් කියා සිටියේ එවැනි වියදම් දරන්නේ නැතිව පාසැල් කටයුතු කරගෙන යා නොහැකි බවයි. වියදම් අධිකයැයි කීවේ පුත්තලමේ සිංහල ගැමි පෙදෙස්, හැටන් දෙමළ ප්‍රදේශ, ගිරාඳුරුකෝට්ටේ, මහියංගනය සහ හික්කඩුව වැනි ප්‍රදේශවල අඩු දියුණුවක් ලබා ඇති ප්‍රජාව සහ මහනුවර අඩු ආදයම් ජන කොටස්ය.


## 4.2.1 ගාස්තු සහ පරිත්‍යාග

සිසුන් 1 ශ්‍රේණියට ඇතුළත්කළ විට ගෙවිය යුතු ගාස්තු පිළිබඳව රජය අනුමත කළ යුතු ගාස්තු ක්‍රමයක් නොමැත. දෙමව්පියන් අදාළ කොන්දේසි නොදන්නා බැවින් සිය දරුවන් පාසැලට ඇතුලත්කිරීමේදී ගෙවූ සියලුම මුදල් හැඳින්වූයේ 'ඇතුළත්කිරීමේ ගාස්තු' වශයෙනි. බොහෝ සිසුන් විවිධ ගණන් ගෙවා තිබුණි. සමහරුන් ගෙවා තිබූ ගණන් බෙහෙවින් අධිකය. 62% ක් ඇතුලත්කිරිමේ ගාස්තු ගෙවූ බව කී අතර හරියටම ගෙවූ ගණන කීවේ 52% කි. සාමාන්‍යයෙන් එක් ළමයෙකුට වියදම්වූ ගණන රුපියල් 3,977.09 කි.

පුත්තලමේ දෙමළ ප්‍රදේශ සහ නාගරික ප්‍රදේශ මෙන්ම අම්බලන්ගොඩ සිසුන් ගෙවූ මුදල් හා සසඳා බැලූ විට හික්කඩුව, මහනුවර සහ නුවරඑලියේ සිසුන් ඉතා වැඩියෙන් මුදල් ගෙවා තිබණි.

ගුරුවරුන් සහ නිලධාරීන් 91% ක් පමණ කීවේ මෙම ගාස්තු දෙමව්පියන්ට බරක් බවයි. කෙසේවුවද, සිසුන් ඇතුලත්කිරීමේ ගාස්තු සම්බන්ධයෙන් බෙහෙවින්ම විනිවිදබවක් දක්නට තිබුණි. නිලධාරීන් 57% ක් කීවේ මෙම ගාස්තු සඳහා රිසිට් පත් නිකුත්කෙරුණු බවයි. ගුරුවරුන් 10% ක් සහ නිලධාරීන් 15% ක් රිසිට් පත් නිකුත් නොකෙරුණු බව කීහ.

රූපය 9: පාසැල්වලට දෙමව්පියන් කළ ගෙවීම්




පාසැල්වල නඩත්තුව සහ ඉගෙනීමෙන් පිටස්තර කටයුතු සඳහා ගාස්තු අවශ්‍යයැයි ගුරුවරුන් 16% ක් සහ නිලධාරීන් 19% ක් කීහ.

ගුරුවරුන් වැඩි ප්‍රමාණයක් (60.2%) කී අන්දමට පාසැල් ගාස්තු පිළිබඳ ගිණුම් වාර්තා ගුරු දෙගුරු සමිති හා පාසැල් සංවර්ධන සමිති වලට ඉදිරිපත් කෙරේ. ගුරුවරුන් 62.2% ක් සහ නිලධාරීන් 86.3% ක් කීවේ විවිධ අරමුදල්, ගාස්තු සහ ප්‍රසාද මුදල් විගණනය නොකෙරෙන බවයි.

වෙනත් ගෙවීම් පිළිබඳව සිසුන් 349 ක් වෙනුවෙන් දෙමව්පියන් 22.1% ක් එක් ළමයෙකුට වසරකට සාමාන්‍යයෙන් රුපියල් 1,543 ක් ගෙවා තිබුණි. පරිත්‍යාග වශයෙන් වැඩි වශයෙන් මුස්ලිම් ජාතිකයින් සිටින පුත්තලම නාගරික ප්‍රදේශයේ දෙමව්පියන්ද, අඩු මට්ටමකට මහනුවර, හික්කඩුව සහ අනුරාධපුරයේ දෙමව්පියන්ද රුපියල් 4 සිට

රුපියල් 20,000 දක්වා මුදල් ගෙවා තිබුණි. හැටන්, ගිරාඳුරුකෝට්ටේ සහ අම්බලන්ගොඩ ප්‍රදේශවලින් කෙරුණු පරිත්‍යාග අඩුය. පුත්තලම දිස්ත්‍රික්කයේ සිංහල සහ දෙමළ ප්‍රදේශවල කිසිදු ගෙවීමක් කර නැත.

පියෙක්:

පාසැලේ පිහිනුම් තටාකය ඉදිකිරීමට කළුගල් ලබාදුන් නඩුකාරවරයෙකුගේ දියණිය 8 වෙනි ශ්‍රේණියට ඇතුලත් කළා.

### 4.2.2 පාසැල් සංවර්ධන කමිටුවලට ගෙවීම්


පාසැල් සංවර්ධන කමිටු පිහිටුවීමෙන් පසු ගුරු දෙගුරු සමිති අහෝසි කරන ලද නමුත් දෙමව්පියන් අතර මෙම සමිති දෙක ගැන ව්‍යාකූල තත්ත්වයක් පවතී. ගුරු දෙගුරු සමිතිය පාසැල් වාරය අවසනදී සිය දරුවන්ගේ ඉගෙනීමේ වැඩවල ප්‍රගතිය සහ ගැටලු ගැන කතාබස් කිරීමට රැස්වූ මිත්‍රශීලී සංවිධානයකි. පාසැල් සංවර්ධන සමිතිය විධිමත් ලෙස සභාපතිවරයෙකු, ලේකම්වරයෙකු සහ භාණ්ඩාගාරවරයෙකු තෝරාපත්කරගනු ලබන සංවිධානයකි. සමිතියේ වාර්ෂික රැස්වීම් පැවැත්වෙන අතර පාසැල් කටයුතු සඳහා අරමුදල් එකතුකිරීම පිළිබඳව වෙහෙසෙයි.

නිවෙස් 94 ක සිටින සිසුන් 10% ක් පමණ ගුරු දෙගුරු සමිති වලට සාමාන්‍යයෙන් පවුලකට රුපියල් 1,021 ක් ගෙවා ඇත. ප්‍රදේශ අනුව ගෙවූ මුදල් ප්‍රමාණය වෙනස්වූ අතර වැඩියෙන්ම මුදල් ගෙවා ඇත්තේ අම්බලන්ගොඩ, මහනුවර සහ නුවරඑළිය ප්‍රදේශවලිනි.

දරුවන් 66% ක පමණ භාරකරුවන් පාසැල් සංවර්ධන සමිති වලට ගෙවීම් සිදුකර ඇත. එසේ කර ඇති වැඩිම පවුල් සංඛ්‍යාව මහනුවර, පුත්තලම නාගරික ප්‍රදේශය, අම්බලන්ගොඩ, හික්කඩුව සහ අනුරාධපුරයෙනි. සිසුන් 1,198 ක් වෙනුවෙන් නිවෙස් 689 ක් පාසැල් සංවර්ධන සමිති වලට මුදල් ගෙවූ බව කීවත් ගෙවූ ප්‍රමාණය කීවේ සිසුන් 999 දෙනෙකු සිටි නිවෙස් 597 ක් පමණකි. එක් ළමයකු වෙනුවෙන් ගෙවන ලද සාමාන්‍ය මුදල රුපියල් 794 කි.

පාසැල් සංවර්ධන සමිති වලට ගෙවීම් වැඩියෙන් නියම කෙරුණේ නගරබද පාසැල්වලිනි. වැඩියෙන්ම ගෙවුවේ මධ්‍යම පාන්තික දෙමව්පියන්ය. වැඩියෙන් ගෙවීම් කළේ සිංහල සහ මුස්ලිම් දෙමව්පියන්ය.

රූපය 10: වාර්ෂික ගෙවීම් මධ්‍යන්‍යය




## 4.2.3 ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම

නිවෙස් 58.9% ක් ලිපි ද්‍රව්‍ය සඳහා මුදල් ගෙවා තිබුණි. ඒ සඳහා සාමාන්‍යයෙන් ශිෂ්‍යයෙකු වෙනුවෙන් වසරකට වැය කළ මුදල රුපියල් 3,653 කි. පන්ති වැඩ සඳහා ලිපි ද්‍රව්‍ය ගෙනෙන ලෙස ගුරුවරුන් කී බව පහළ සහ පහළ-මධ්‍යම පාන්තික නිවෙස් 55% ක් සහ මධ්‍යම පාන්තික නිවෙස් 50% ක් කීහ. මෙස් කෙරෙන ඉල්ලීම් දෙමව්පියන්ට සෑහෙන බරකි.

## 4.2.4 ගුරුවරුන්ට තෑගි බෝග

සිසුන් 702 ක් සිටින නිවෙස් 41.2% ක් කීවේ මුදල් ඇතුළුව ගුරුවරුන්ට නොයෙකුත් තෑගි බෝග දෙන බවයි. බොහෝවිට දෙමව්පියන් එකතුවී තෑගි මිළදී ගත්හ. වැඩියෙන්ම තෑගි දී ඇත්තේ පුත්තලම නාගරික ප්‍රදේශය, අනුරාධපුරය, හික්කඩුව, මහනුවර සහ නුවරඑලිය ප්‍රදේශ වලිනි. එක් තෑග්ගකට සිසුවකු ගෙවූ මුදල සාමාන්‍යයෙන් රුපියල් 250 කි. (එය රුපියල් පහේ සිට රුපියල් 5,000 ක් අතර අඩු වැඩි විය)

දකුණේ පියෙක්:

මගේ ළමයා පළවෙනි ශ්‍රේණියේ ඉන්න කොට ගුරුතුමිය මාලයක් පෙන්නා ඒ වගේ එකක් ඉල්ලුවා. කොහොම වුණත් සමහර දෙමව්පියෝ අමාත්‍යාංශයට පැමිණිලි කළාම ඇයට අවවාද කෙරුවා. පළවෙනි ශ්‍රේණියේ සිට හතරවෙනි ශ්‍රේණිය දක්වා තෑගි ඉල්ලීම ගුරුවරු පුරුද්දක් කරගෙන තියෙනවා.


බුලත් දීම පාසැල් ක්‍රමයේ චාරිත්‍රයක්. ඒ කෙළෙහිගුණය සහ ප්‍රසාදය පෙන්වීමට කරන දෙයක්. වටිනා තෑගි දීම ගුරුවරුන්ගෙන් වාසියක් බලාපොරොත්තුවෙන් බලපෑමක් කිරීමේ සිතින් කරන දෙයක් නම් එහි දූෂණය ගැබ්වී ඇත.

## 4.2.5 උපකාරක (ටියුෂන්) පන්ති

මුදල් අයකර ටියුෂන් පන්ති පවත්වන්නේ ඒවාටම කැපවූ ගුරුවරුන් පමණත් නොව පාසල් ගුරුවරුන්ද බව අධ්‍යයනයේදී හෙළිවිය. සමහර ගුරුවරු තමන්ගේ පන්ති වලට එන ලෙස සිසුන්ට බලකළහ. පාසැල් වේලාවෙන් පසුවත් සති අන්තයේ මෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 2006/45 චක්‍රලේඛය නොතකා පාසැල් වේලාවේද මේ පන්ති පවත්වන අවස්ථා වාර්තාවිය.

ටියුෂන් දැන් ජීවන රටාවක්. නිවෙස් 68% ක සිසුන් 1,118 ක් මුදල් ගෙවා මේ පන්තිවලට ගියහ. සාමාන්‍යයෙන් වසරකට එක් සිසුවකු වැය කළ මුදල රුපියල් 4,695 කි. ඒ ඒ පවුල්වල ආදායම් තත්ත්වය අනුව මෙය අඩු වැඩි විය. (රූපය 11 බලන්න)

රූපය 11: ආදායම් පන්ති අනුව ටියුෂන් සඳහා වියදම



සිසුන් 107 ක් සිටින නිවෙස් 9% ක් (82) ටියුෂන් පන්ති සඳහා මුදල් ගෙවූහ. පාසැල් වේලාවෙන් පසුව පන්ති පැවැත්වුණේ පාසැලේදීමය. සාමාන්‍යයෙන් පන්ති පැවැත්වෙන වේලාවේදී අවශ්‍ය දේ උගන්වන්නේ නැතිව ටියුෂන් පන්තියට ඒමට සිසුන් පෙළඹවීමට මෙය උපක්‍රමයක් කරගන්නට පුලුවන. මෙවැනි පන්ති සඳහා එක් සිසුවකු 2008 දී වැය කළ මුදල රුපියල් 1,760 කි.

මධ්‍යම පළාතේ ප්‍රාදේශීය නිලධාරීන් කීවේ....

ගුරුවරුන් තමන්ගේ ටියුෂන් පන්ති වලට එන ශිෂ්‍යයින්ට වැඩි ලකුණු දෙනවා. තෑගි වලට තෝරාගන්නවා. බැරිවෙලාවත් වෙන කෙනෙකුගේ පන්තියකට ගිහිල්ලා අහුවුණොත් පාසැලේ හිටියේ නැත්තේ ඇයිද කියා ප්‍රශ්න කරනවා.

සාකච්ඡාවකදී ප්‍රජා නායකයන් කීවේ...

එක පාසැලක වාණිජ්‍ය ඉගැන්වූ ගුරුවරුන් දෙන්නෙක් තරගයට සාමාන්‍ය සහ උසස් පෙළ ශිෂ්‍යයින්ට ඔවුන්ගේ ටියුෂන් පන්තිවලට එන්න බලකළා. පන්තිවලට නාවොත් ශිෂ්‍යයින්ගෙන් පළිගත්තා.

මේ සිද්ධීන් වාර්තාවූයේ නුවරඑළිය, හැටන් සහ පුත්තලම නාගරික ප්‍රදේශවලිනි. ඒ පළාත්වල වැඩිපුර සිටියේ දෙමළ සිසුන්ය. එයින් පෙනීයන්නේ දුෂ්කර පළාත්වල ගුරුවරුන් පාසැල් වේලාවෙන් පසු ටියුෂන් පන්ති පවත්වන බවයි.

ටියුෂන් පන්ති පවත්වන ගුරුවරුන් ඒවාට පැමිණෙන ළමුන්ට තෑගි ප්‍රදනෝත්සවයේදී තෑගි ලැබීමට සුදුස්සන් ලෙස තෝරාගැනීමෙන් සහ වාර සහ වාර්ෂික විභාගවලදී වැඩි ලකුණු දීමෙන් කෘතඥතාවය පළකළහ.

ගුරුවරුන් සහ නිලධාරීන් වැඩිදෙනෙක් මේ පුරුද්ද අනුමත නොකළහ. ගුරුවරුන් 40% ක් සහ නිලධාරීන් 46% ක් කීවේ වාණිජමය පදනමකින් පාසැලින් පිටත ටියුෂන් පන්ති පැවැත්වීම පිළිගත නොහැකි බවයි. පාසැල් වේලාවෙන් පසුවත් සති අන්තවලත් පන්ති බාර ගුරුවරයා ටියුෂන් පන්ති පැවැත්වීම දූෂණ ක්‍රියාවක් බව ගුරුවරුන් සහ නිලධාරීන් 85% ක් කියා සිටියහ.

### 4.2.6 වෙනත් ගෙවීම්

වෙනත් ගෙවීම් ගණයට අයත්වූයේ ශ්‍රමදාන සහ ක්‍රීඩා කටයුතු, පුස්තකාලය, පරිගණක පාවිච්චිය සහ ආරක්ෂක කටයුතු ය. (රූප 10, 11 බලන්න)

මෙවැනි ගෙවීම් දෙමව්පියන්ට බරක්වූ අතර සමහර සිසුන් පාසැලට නොපැමිණ සිටීමටද හේතු විය. අමාත්‍යාංශය පහසුකම් සහ පාසැල් සංවර්ධන කමිටුවලට ගෙවන ගාස්තු නියම නොකිරීම හේතුවෙන් දූෂණය පැතුරුණු අතර විදුහල්පතිවරු හිතුමනාපයට තීරණ ගත්හ.

මෙම අධ්‍යයනයෙන් පෙනීයන්නේ සිය දරුවන්ට අධ්‍යාපනයක් ලබාදීම සඳහා දෙමව්පියන් සෑහෙන වියදමක් දරන බවය. නිදහස් අධ්‍යාපනයක් ලබාදීම ගැන ශ්‍රී ලංකාව උදම්වෙයි. එහෙත් ඇත්ත වශයෙන්ම නිදහස් අධ්‍යාපනයක් තිබේදැයි ප්‍රශ්නයකි. අධ්‍යාපනය සඳහා රජය වෙන්කරන මුදල අල්ප නිසා සිය දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබාදීම සඳහා සැඟවුණු වියදම් සියල්ල දරන්නේ දෙමව්පියන්ය.

## 4.3 පරිපාලනය හා සම්බන්ධ දූෂණය

මාරුවීම්, වැටුප් වර්ධක හෝ ණය ලබාගැනීම සඳහා අල්ලස්දීමටත්, බලපෑම් කිරීමටත් සිදුවී තිබීම නිසා ගුරුවරුන් අතර ඇත්තේ මහත් කලකිරීමක් හා දෙම්නසකි. විදුහල්පතිවරුන් විසින් තාවකාලික ගුරු පත්වීම් දීමේ පටන්, වැඩබලන විදුහල්පතිවරුන් සිට අධ්‍යක්ෂවරුන් දක්වා උසස් පත්වීම් සම්බන්ධයෙන් ඥාතිත්වය සහ දේශපාලනීකරණය බලපා ඇත.

දේශපාලනීකරණය දූෂණය වැඩිවීමට ප්‍රධාන හේතුව වශයෙන් පෙන්වාදෙනු ලැබීය. පාසැල්වලත් අධ්‍යාපන අමාත්‍යාංශයේත් පත්වීම් දේශපාලන පත්වීම් බව නිවෙස් 28.6% ක් කී අතර 15.5% ක් කීවේ එසේ නොවන බවය. පත්වීම් සහ උසස්වීම් දේශපාලන ඒවා යැයි කී වැඩිදෙනා මධ්‍යම පාන්තිකයන්වූ අතර අනෙක් අය අඩු ආදායම් ලබන්නවුන්ය. නිවෙස් 41.1% ක් සුදුසුකම් ඇති අය පත් නොකෙරෙන බව කී අතර, 13% ක් කීවේ යෝග්‍යතාවය අනුව පත්වීම් දෙන බවය. පන්ති වශයෙන් බෙදීමේදී ලැබුණේද ඉහතින් සඳහන්වූ ප්‍රතිඵලමය.


අධ්‍යාපන සැලසුම්කරණය බෙහෙවින්ම දේශපාලනීකරණය වී ඇතැයි නිවෙස් 31.4% ක් කීහ. ප්‍රමාණාත්මක සම්මුඛ සාකච්ඡාවලදී පළවූයේද එවැනිම අදහසකි. සෑම රජයක්ම අධ්‍යාපන ක්‍රමය දේශපාලනමය වශයෙන් හසුරුවන බව කියැවිණ.

### 4.3.1 පාසැල්වලට අදල ප්‍රශ්න - දෙමළ පරිවර්තන

දෙමළ කතාකරන පෙදෙස්වල අවශ්‍ය පාසැල්වලටත් කලාපීය කාර්යාලවලටත් චක්‍රලේඛවල දෙමළ පරිවර්තන ලබානොදීම වෙනස්කම් කිරීමක් ලෙස නුවරඑළිය සහ පුත්තලමේ කලාපීය අධ්‍යක්ෂවරු සැලකූහ. කොළඹ ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයෙකු කී හැටියට ප්‍රමාදවීම් සිදුවීමට හේතුව දෙමළ පරිවර්තකයින් එක්කෙනෙක් පමණක් සිටීමය.

නිලධාරීන් 56% ක් කීවේ මේ හේතුවෙන් සැලසුම්කරණයට බාධා ඇතිවූ බවයි. දෙමළ බසින් පෝරම නොමැතිකම නිසා පාසැල්වලින් තොරතුරු ලබාගැනීම අසීරු කරුණක් විය. චක්‍රලේඛ සහ වෙනත් ලියවිලි දෙමළ බසින් නොතිබීම හේතුවෙන් බොහෝ ගුරුවරුන්, විදුහල්පතිවරුන් සහ නිලධාරීන් රෙගුලාසි ගැන නොදැනසිටීම නිසා නියමිත ක්‍රියාවලියන් අනුගමනය කළේ නැත. එමෙන්ම තමන්ට ලැබීමට තිබුණු සම්පත් ගැනද වැටහීමක් නොතිබීම නිසා ඒවා ලබාගැනීමට බැරිවිය. මෙයින් නොයෙකුත් පරිපාලනමය ගැටලු වලට තුඩුදුන් අතර අධ්‍යාපන සැලසුම්කරණයටත්, අධ්‍යාපනයේ සාධාරණත්වයටත් බාධක ඇතිවූයේ සිංහල පාසැල් හා සසඳාබලන විට දෙමළ පාසැල් වලට අවාසියක් ඇතිවන්නට පුලුවන් බැවිනි.

රූපය 12: ''දෙමළ බසින් පෝරම නැතිකම නිසා අධ්‍යක්ෂවරුන් වශයෙන් අපට තොරතුරු ලබාගැනීම බෙහෙවින් අසීරුවිය''




### 4.3.2 පාසැල්වල සහ අධ්‍යාපන කාර්යාලවල අක්‍රමිකතාවන්

කෘෂිකාර්මික ප්‍රදේශවල ඇති ග්‍රාමීය පාසැල් සතුව අක්කර ගණන් ඉඩම් ඇත. මේවා නිල වශයෙන් අනුමතකර ඇති ක්‍රියා පටිපාටි යටතේ වගාකළ හැක. එහෙත් බොහෝ විදුහල්පතිවරුන් මෙම ඉඩම් පෞද්ගලික ගොවීන්ට බදු දී තමන් මුදල් ලබාගත් බව ගුරුවරුන් 32% ක් සහ නිලධාරීන් 27% ක් දැන සිටියහ.

ඉදිකිරීම් කටයුතුවලදී විදුහල්පතිවරුන් දූෂිතයැයි කීම නිලධාරීන් 54.8% ක් ප්‍රතික්ෂේප කළ අතර ඉදිකිරීම් හා සම්බන්ධ දූෂණ සිදුවන පාසැලක් ගැන තමන් දන්නේයැයි කීවේ 30.5% ක් පමණි.

මේ අතර, ගුරුවරුන් 77% ක් සහ නිලධාරීන් 63% ක් කියා සිටියේ අධ්‍යාපන කාර්යාලවලට අනවශ්‍ය බඩුමුට්ටු සහ සේවාවන් ලබාගන්නා බවයි.

### 4.3.3 වැටුප් වර්ධක ප්‍රමාදවීම

වැටුප් ගෙවීම සහ වැටුප් වර්ධක පිළියෙල කිරීම ප්‍රමාදවීම දූෂණය හා සම්බන්ධයැයි නිත්‍යවශයෙන් කිව නොහැක. මෙම ප්‍රමාදවීම් පරිපාලන අකාර්යක්ෂමතාවය හේතුකොටගෙන සිදුවීමෙන් සිතුසේ අයුතු ක්‍රියාවලට මං පෑදෙයි. භාණ්ඩාගාරය ප්‍රමාදවී අධ්‍යාපන අමාත්‍යාංශයට මුදල් යැවීම හේතුවෙන්ද මෙය සිදුවිය හැක. ගුරුවරුන් 82% ක් සහ නිලධාරීන් 75% කගේ වැටුප් වර්ධක ප්‍රමාදවී ඇති අතර ගුණාත්මක සම්මුඛ සාකච්ඡාවලට සහභාගිවූ ගුරුවරුන් කීවේ අවුරුදු 2-4 කට කලින් උසස්වීම් ලැබුණද තමන්ගේ මාසික වැටුප් වලට වැටුප් වර්ධක ඇතුලත්කර නොමැති

බවයි. ගුරුවරුන් 52% ක් සහ නිලධාරීන් 37% ක් අධ්‍යාපන අමාත්‍යාංශයට පැමිණිලි කළ අතර සමහර ගුරුවරුන්ට සම්පූර්ණ වර්ධක මාසික වැටුපට එකතු කරන තුරු ඉන් කොටසක් පමණක් ලැබුණි. ගුරුවරුන් සහ නිලධාරීන් 75% ක් පමණ වර්ධක ලබාගැනීම ඉක්මන්කර ගැනීමට ලිපිකරුවන්ට අල්ලස් දුන් බව පිළිගත්හ. වැටුප් වර්ධක ප්‍රමාදවීම නිසා තමන්ට මාසය අවසනදී ලැබෙන වැටුප සැලකියයුතු ප්‍රමාණයකින් අඩුවීම හේතුවෙන් ගුරුවරුන් අතර ඇත්තේ ඉමහත් කලකිරීමකි.

කණ්ඩායම් සාකච්ඡාවකදී ගුරුවරුන් .....

වැටුප් වර්ධක එකතුකරන්න දීර්ඝ කාලයක් ගතවෙනවා. ඒ ගැන ලිපිකරුවෝ උනන්දුවක් දක්වන්නේ නෑ. ඔවුන් පගාවක් බලාපොරොත්තු වෙනවා. විදුහල්පති නැතිනම් ගුරුවරු ලිපිකරු ළඟට ගිහිල්ල ගතමනාවක් දීල තමයි වැඩේ කරව ගන්නෙ. ඒක ගුරුවරුන්ගෙවත් විදුහල්පතිවරුන්ගෙවත් තත්ත්වෙට ගැලපෙන්නේ නෑ. 2004 ඉඳල පඩි වැඩිනොවුණු විදුහල්පතිවරයෙක් ඉන්නවා.

පුහුණු ගුරුවරියක්....

අපිට වැටුප් වැඩිවුනාම හරියට පඩිය හඳන්න අවුරුද්දක් විතර යනවා . මේක අපිට මුහුණ පාන්නවෙලා තියෙන ලොකු ප්‍රශ්නයක්

### 4.3.4 දුෂ්කර දීමනා

2007 ජාතික මාරුවීම් ප්‍රතිපත්තිය 2007/20 - 2007/12/13 යටතේ ගුරුවරුන් සහ නිලධාරීන් මුල්වරට පත්වීම් ලැබූ විට අවුරුදු තුනේ සිට පහ දක්වා කාලසීමාවක් දුෂ්කර ප්‍රදේශයක සේවය කළ යුතුය. මේ ක්‍රමය යටතේ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඔවුන්ට අමතර 'දුෂ්කර දීමනාවක්' ගෙවනු ලැබේ.

ගුරුවරුන් 76% ක් සහ නිලධාරීන් 70% ක් තමන් දුෂ්කර පෙදෙස්වල සේවය කර ඇතැයි කී අතර ගුරුවරුන් 46% ක් සහ නිලධාරීන් 38% ක් තමන්ට දුෂ්කර දීමනාව ලැබී නැතැයි කීහ. ගුණාත්මක සම්මුඛ සාකච්ඡාවලදීත් ගුරුවරුන් කියා සිටියේ මෙම දීමනාව ගෙවනු ලැබුවේ පක්ෂපාතීත්වය සහ දේශපාලන දැනහැඳුනුම්කම් මත බවය. සමහර අවස්ථාවලදී පළිගැනීමේ ආයුධයක් ලෙසද මෙය පාවිච්චි කෙරුණි.

මෙයින් ගුරුවරුන්ගේ උනන්දුව හීනවෙයි. එවිට එය ඉගැන්වීමේ කටයුතු වලටද බලපායි.

### 4.3.5 ගුරු ණය

තමන්ට ලැබෙන පඩිය මාසේ වියදමට පවා ප්‍රමාණවත් නොවේයයි බොහෝ ගුරුවරු කීහ. (ශ්‍රී ලංකාවේ ගුරු වැටුප් දකුණු ආසියාවේ අඩුම වැටුප් බව ලෝක බැංකුව 2005 දී පෙන්වා දුන්නේය). දුෂ්කර පළාත්වල සේවය කරන සමහර ගුරුවරු සති අන්තයේදී සිය නිවෙස් කරා යෑමට සතියකට රුපියල් 1,000 ක් පමණ නැත්නම් මසකට රුපියල් 5,000 ක් පමණ වියදම් කරති. කෑම බීම සහ ඉඳුම් හිටුම් වලට වියදම් කළායින් පසු අනෙක් වියදම් සඳහා ඉතිරිවන්නේ සුලු මුදලකි. ටියුෂන් දීමට අමතරව ගුරුවරුන් සියලුදෙනාම පාහේ රජයෙන් ණය ලබාගන්නට ඉල්ලුම් කරති. (ගුරුවරුන්ට සහ ඔවුන්ගේ පවුලේ අයට ලෙඩ රෝග සඳහා වියදමට 'අග්‍රහාර' නමින් ඇති රක්ෂණ ක්‍රමය යටතේ මුදල් ද, ආපදා ණය සහ හත් අවුරුදු දේපළ ණය' යනුවෙන් හැඳින්වෙන නිවාස ණය ද ලබාගන්නට පුලුවන).

කණ්ඩායම් සාකච්ඡාවකදී ගුරුවරයෙක් .....

ආපදා ණය කලට වේලාවට ගෙවන්නේ නෑ. කලාපීය කාර්යාලයට හෝ දෙපාර්තමේන්තුවට කිට්ටු අයට ප්‍රමුඛත්වය ලැබෙනවා. මේ ළඟදී එක් කාර්යාලයක මුරකාරයාට රුපියල් අසූදහක් ලැබුණා. අවුරුදු ගණනාවකට කලින් ඉල්ලුම්කළ විදුහල්පතිවරයෙක් තවමත් බලාඉන්නවා.

සාමාන්‍යයෙන් කවුරුත් කීවේ මේ ණය ලබාගැනීමට බෙහෙවින් අසීරු බවත්, මුදල් අතට ලැබීමට අවුරුදු ගණන් ගතවෙන බවත්ය. ඉල්ලුම වැඩිවීමත් සමග දේශපාලන බලපෑම් සහ අල්ලස් වලට ඉඩකඩ සැලසේ.

ගුරුවරියක් සමග සම්මුඛ සාකච්ඡාවකදී...

නිවාස ණය සඳහා අයකෙරෙන්නේ අවුරුද්දකට 4% ක් වැනි සුලු පොලියක්. මේ නිසාම ඉල්ලුම වැඩියි, ණය ලබාගන්න ලොකු තරගයක් තියෙනවා. ණය ලබාගන්න පුළුවන් දේශපාලන බලයක් ඇත්නම් පමණයි. අග්‍රහාර රක්ෂණයත් එහෙමයි. පොරොත්තු ලේඛනයෙන් පිටතින් ගිහින් දේශපාලන බලයක් තියෙන්න ඕනෑ.

ආපදා ණය වලටත් ලොකු ඉල්ලුමක් තියෙනවා. ඒ වගේම දූෂණය තියෙනව කියලත් කියන්න පුලුවන්. ආපදා ණය දෙන්නේ අවුරුද්දකට සීමිත ප්‍රමාණයක්. ඒවා ලැබෙන්නේ දේශපාලන බලය තියෙන නැත්නම් හරි සම්බන්ධකම් තියෙන අයට. මේ ණය ලබාගන්න බැරි ගුරුවරු එක්කෝ සීට්ටු දමනවා. නැත්නම් පොලියට සල්ලි දෙන ටියුෂන් මාස්ටර්ල ළඟට යනව

දේශපාලන බලපෑම් මත ණය ඉක්මණින් ලබාගන්න පුළුවන් බව ගුරුවරුන් 40% ක් සහ නිලධාරීන් 34% ක් කීහ. දිග පොරොත්තු ලේඛනයෙන් පිට පැන බොහෝ ගුරුවරුන් ණය ලබාගත්තේ ඒ අයුරිනි. අග්‍රහාර රක්ෂණ ලබාගැනීමට දේශපාලන බලපෑමක් අවශ්‍ය යැයි ගුරුවරුන් සහ නිලධාරීන් 30% ක් පෙන්වාදුන් අතර ගුරුවරුන් 60% ක් සහ නිලධාරීන් 41% ක් කීවේ ප්‍රාදේශීය පරිපාලනය සමග සම්බන්ධකම් ඇත්නම් ඉක්මනින් ඉල්ලුම් පත්‍ර සකස්කරගත හැකි බවයි.

අධ්‍යාපන අධ්‍යක්ෂවරයෙකු සමග සම්මුඛ සාකච්ඡාවකින්....

මේ පළාතේ සේවය කරන ගුරුවරුන්, නිලධාරීන් සහ වෙනත් කාර්ය මණ්ඩල දහදහක් පමණ පළාත් සභාව මාර්ගයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ණය ලබාගෙන තිබෙනවා. මේ හැම කෙනෙක්ම මාස්පතා මුදලක් ආපසු ගෙවනවා. එයින් විශාල මුදලක් මාසිකව එකතුවෙනවා. මේ මුදල් වලින් ලේසියෙන්ම තවත් ගුරුවරුන්ට ණය දෙන්න පුලුවන්. එත් ආපසු ලැබෙන මුදල් ප්‍රාදේශීය අමාත්‍යාංශය එදිනෙදා වැඩ වලට යොදවන නිසා ණය ලබාගන්න ඉන්න ගුරුවරුන්ට අවුරුදු ගණන් බලාඉන්නවෙලා. ළඟදි ඉඳන් මහනුවර පළාත් සභාව ණය දීම නවත්වලා. ඒක ගුරුවරුන්ටත් නිලධාරීන්ටත් ලොකු පාඩුවක්.


### 4.3.6 මාරුවීම්

ගුරු මාරු ප්‍රතිපත්තිය යටතේ මාරුවීමක් ලබාගැනීමට නම් ගුරුවරයකු අඩුම ගණනේ වසර තුනක් ‘අති දුෂ්කර’ හෝ ‘දුෂ්කර’ පාසැලක හෝ වසර හතරක් යෝග්‍ය නැතැයි සැලකෙන පාසැලක, නැත්නම් වසර අටක උපරිම කාලසීමාවක් වරප්‍රසාද ඇති පාසැලක, එසේත් නැත්නම් වසර හයක උපරිම කාලසීමාවක් වඩාත් වරප්‍රසාද ඇති පාසැලක සේවය කර තිබිය යුතුය. සාමාන්‍ය නිර්නායක අනුව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පාසැල් වර්ගීකරණය කර ඇති අතර ඒ පිළිබඳව කලාපීය අධ්‍යාපන කාර්යාල දැනුවත් කර ඇත.

ඒ හැර මාරුවීම් සිදුකෙරෙන විශේෂ අවස්ථාද වෙයි. විනයානුකූල හේතූන් මත හෝ වෛද්‍ය අධීක්ෂණ මණ්ඩලවල නිර්දේශ අනුවත් මාරුවීම් සිදුකෙරේ. අපහසුතා ඇති පාසැල් සහ වඩාත් යෝග්‍ය පාසැල් වල සේවය කරන ගුරුවරුන් අන්‍යොන්‍ය එකඟතාවයෙන් මාරුවීම් ලබාගන්නා අවස්ථාද ඇත.

ගර්භනී ගුරුවරියන් විසින් කෙරෙන ආයාචනා, වයස 53 ට වැඩිගුරුවරුන් හෝ ගුරුවරියන් මෙන්ම අවුරුද්දකට අඩු දරුවකු සිටින ගුරුවරියන් කරන ආයාචනා සලකා බලා මාරුවීම් අත්හිටුවනු ලබයි.

රූපය 13: වසර තුනක් සම්පූර්ණ කිරීමට කලින් සිදුකෙරෙන මාරුවීම්





විස්තරාත්මක චක්‍රලේඛ නිකුත්කර ඇතත් ගුරු මාරුවීම් සම්බන්ධයෙන් දූෂණ සිදුවන බවට හැඟීමක් ගුරුවරුන් සහ නිලධාරීන් අතර පවතී. මාරුවීම් පිළිබඳ ප්‍රතිපත්තිය අකුරටම පිළිපදින්නේ නැතැයි ගුරුවරුන් 67.7% ක් සහ නිලධාරීන් 58% ක් කීහ. ගුරුවරුන් සහ නිලධාරීන් 85% ක් කියා සිටියේ ගුරු මාරවීම් වලදී දූෂණ සිදුවන බව ඔවුන් අසා ඇති බවයි. මාරුවීම් ක්‍රමයේ දූෂණ නැතැයි කීවේ ගුරුවරුන් 4% ක් සහ නිලධාරීන් 2% ක් පමණය.

අතිරේක අධ්‍යාපන අධ්‍යක්ෂවරයෙක්....

ගුරු මාරු සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ වෙනත් මාරුවීම් හරිහැටි සිදුකරන්නේ නෑ. අක්‍රමිකතා එමටයි. දේශපාලනඥයින් තුන්වෙනි ශ්‍රේණියේ ගුරුවරුන් කෙලින්ම අතිරේක අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරුවලට පත්කරනවා. මධ්‍යම පළාතේ ඒ වගේ අලුත් පත්වීම් 120 ක් පමණ කරල තියෙනවා.


අසීරු පළාත්වල සිට වෙනත් පළාත්වලට නියමිත කාල සීමාව සම්පූර්ණවීමට කලින් සිදුකළ පත්වීම් දූෂණයට යටත්ව කෙරුණු ඒවා ලෙස සැලකේ. ගුරුවරුන් වසර තුනේ කාල සීමාවට කලින් දියුණු නාගරික පෙදෙස්වලට මාරුවීම් සාදාගත් අවස්ථා එමටය. ගුරුවරුන් 66% ක් සහ නිලධාරීන් 86% ක් කීවේ මෙවැනි මාරුවීම් දේශපාලන බලපෑම් මත සිදුකෙරුණු ඒවා බවයි. ගුරුවරුන් පාසැල්වලට බෙදා හැරීමේදී ඇති අසමානකම් වලට අමතරව මාරුවීම් වලදී සිදුවන අක්‍රමිකතා නගරබද සහ ගම්බද පාසැල් අතර පරතරය තවත් වැඩිකරයි. එය අධ්‍යාපනයේ ගුණාත්මක බවට බලපායි.

රූපය 14: බොහෝ ගුරුවරුන් නියමිත තුන් අවුරුදු කාලසීමාවට කලින් දුෂ්කර පෙදෙස්වලින් වඩාත් හොඳ පෙදෙස්වලට මාරුවීම් සාදාගන්නවාදැයි ඔබ සිතනවාද?





මාරුවීම් ලබාගැනීමට අල්ලස් දෙන බව ගුරුවරුන් 47.5% ක් සහ නිලධාරීන් 34% ක් අසා තිබුණි. අධ්‍යාපන අමාත්‍යාංශයේ, නැත්නම් පළාත් හෝ කලාපීය කාර්යාලයේ නිලධාරියෙකු දැන හැඳින ගෙන සිටීම මාරුවීමක් ලබාගැනීමට උපකාරී විය. නිලධාරියෙකු දැනගැනීම හෝ ඥාතියෙකුවීම ප්‍රයෝජනවත් බව ගුරුවරුන් 79% ක් සහ නිලධාරීන් 72% ක් කියා සිටියහ. අල්ලස් දීමට වඩා පුද්ගලික දැනහැඳුනුම්කම එලදායී බව ඔවුහු කීහ. ගුරු මාරුවීම් වල දූෂණය සිදුවන්නේ මුදල් ගණුදෙනුවලට වඩා ඥාති සංග්‍රහ සහ පක්ෂභජනය මත යැයි කියනු ලැබීය.

රූපය 15: නිලධාරීන් දන්නා හඳුනන නිසා මාරුවීමක් ලබාගන්න පුලුවන්




රූපය 16: අල්ලස් දීමෙන් මාරුවීම් කරගන්නා බව ඔබ අසා තිබේද?





ගුරු මාරු දේශපාලනඥයින් මගින් කරගන්නා බව ගුරුවරුන් 85% ක් සහ නිලධාරීන් 90% ක් කියා සිටියහ. දේශපාලන බලපෑම් කිරීමට ගුරුවරුන් සතුව පවත්වා බලය හේතුවෙන්, ගුරුවරුන් අවශ්‍ය එහෙත් පහසුකම් අතින් අඩුයැයි සැලකෙන පාසැල්වලට ගුරුවරුන් මාරුකර යැවීම ගැටලුවක්වී ඇත. ගුරුවරුන් සහ නිලධාරීන් 90% ක් පමණ කීවේ නගරබද සහ ජනප්‍රිය පාසැල්වල ගුරුවරුන්, උසස් සම්බන්ධකම් ඇති පවුල්වල අය බවත්, වෛද්‍යවරුන්, ඉංජිනේරුවරුන්, විශ්ව විද්‍යාල කථිකාචාර්යවරුන් වැනි අයගේ භාර්යාවන් හෝ ස්වාමි පුරුෂයන් බවත් ය. තමන්ගේ බලපුළුවන්කාරකම සහ

සම්බන්ධකම් නිසා ඒ අය ගුරු වෘත්තියේ යෙදී සිටින මුළු කාලයේම උගන්වා ඇත්තේ එකම පාසැලකය. මේ අතර, පස් අවුරුද්දකට වඩා දුෂ්කර පෙදෙස්වල සේවය කළ බොහෝ ගුරුවරුන්ට මාරුවීම් ලබාගැනීමට බැරිව ඒ පාසැල්වලම සේවය කිරීමට සිදුවූ බව ගුරුවරුන් සහ නිලධාරීන් 65 - 75% ක් කීහ.

වෘත්තීය සමිතිවල ක්‍රියාමාර්ගයන් නිසාද මාරුවීම් ප්‍රතිපත්තිය හරියාකාර ලෙස ක්‍රියාවේ යෙදීමට අපහසු බව ගුරුවරුන් සහ නිලධාරීන් 50% ක් පෙන්වාදුන්හ. දේශපාලන ඇඟිලි ගැසීම් නිසා මාරුවීම් ප්‍රතිපත්තිය නිසි අයුරින් ක්‍රියාත්මක කළ නොහැකි යයි ගුරුවරුන් සහ නිලධාරීන් 85% ක් පමණ කීහ.

රූපය 17: දේශපාලනඥයකු මගින් ගුරු මාරු හදගන්නවා කියා ඔබ සිතනවාද?




මේ අතර, කලාපීය ගුරු මාරු සම්බන්ධයෙන් කලාපීය සහ පළාත් අධ්‍යාපන කාර්යාල අතර සම්බන්ධතාව දුර්වල බවට ගුරුවරුන් සහ නිලධාරීන් 50% ක් එකඟවූහ. පාසැල්වල තත්ත්වය වැඩිදියුණු කිරීමට කලාපීය අධ්‍යක්ෂවරුන් තැත්කළ අවස්ථාවලදී ඇපකැපවී කටයුතු කරන ගුරුවරුන් හදිසියේම පළාත් කාර්යාලය මගින් මාරුකිරීම හේතුවෙන් ඒ කටයුතු අඩාලවෙයි. මෙයින් කාර්යාල අතර සන්නිවේදනය අතින් යම් යම් අඩුපාඩු ඇති බව හෙළිවිය. පරිපාලන ව්‍යුහයේ පහළ මට්ටමේ නිලධාරීන් කළමනාකාරිත්වයේ කොටස්කරුවන් නොවීම නිසා ඔවුන්ට සිය රාජකාරිය හරිහැටි ඉටුකිරීමට අපහසුවිය. මෙයින් අකාර්යක්ෂමතාවයන්ට තුඩුදෙනවා පමණක් නොව පහළ මට්ටමේ නිලධාරීහු තමන්ට උපරිම වශයෙන් සිය හැකියාවන් ප්‍රයෝජනයට ගැනීමට බැරිවීම නිසා අධෛර්යට පත් වෙති.

ගුරු කළමනාකරණයට අදාල ගැටලු 16 ක් පරිපාලනය සම්බන්ධ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) ආචාර්ය ආර්.බී. රණරාජා විසින් බස්නාහිර පළාතේ අධ්‍යාපන ලේකම් වෙත යවා ඇත ලිපියක සඳහන්වේ. ඒවා නම්:

1 ගුරුවරයාගේ හෝ ගුරු මාරු මණ්ඩලයක ඉල්ලීමක් නොමැතිව ගුරුවරුන් මාරුකිරීම

2 ප්‍රමාණවත් කාලසීමාවක් නොමැතිව ගුරුවරුන් මාරුකිරීම

3 කිසිදු පරිපාලනමය අවශ්‍යතාවයක් නොමැතිව ගුරුවරුන් මාරුකිරීම

4 විනයානුකූලව කිසිදු නරක හැසිරීමක් නොමැතිව ගුරුවරුන් මාරුකිරීම

5 නියමිත වැඩසටහනක් නොදී නැත්නම් ඔවුන් කලින් කල වැඩ අත්හැරීමට ඉඩදෙමින් ගුරුවරුන් මාරුකිරීම

6 මාරුවීම් බලපැවැත්වෙන දිනයේ සිට අලුත් තනතුරේ වැඩකිරීමට ඉඩනොදෙමින් ගුරුවරුන් මාරුකිරීම

7 වාරයක් මැදදී ගුරුවරුන් මාරුකිරීම

8 කලාපීය අධ්‍යක්ෂවරයා හෝ විදුහල්පති අකැමැති ගුරුවරුන්ට පාසැල්වල වැඩ නොදීම

9 ඇතැම් විෂයයන් ඉගැන්වීමට විශේෂ පුහුණුවක් ලබා සිටින ගුරුවරුන්ට එම විෂයයන් ඉගැන්වීමට ඉඩ නොදීම

10 සුදුසුකම් වැඩි ගුරුවරුන් සිටියදී සුදුසුකම් අඩු ගුරුවරුන් උසස් කිරීම

11 සුදුසුකම් ඇති, පන්තිවල ඉගැන්වීමට පුහුණුවක් ලත් ගුරුවරුන් පුස්තකාලයාධිපතිවරුන් ලෙස යැවීම

12 මාරුකර ඇති ගුරුවරුන්ට පාසැල්වල කිසිම වැඩක් නොකර නිදැල්ලේ සිටීමට ඉඩදීම

13 සිසුන් සහ දෙමව්පියන් ගුරු මාරු, ප්‍රශ්න ලෙස ඉදිරිපත් කිරීම

14 වයස අවුරුදු 60 ඉක්මවූ අය කිසිදු හේතුවක් නොමැතිව සේවයේ රඳවා ගැනීම

15 අධ්‍යක්ෂවරුන් ඉදිරිපත්කරන වාර්තා සැලකිල්ලට යොමු නොකිරීම

16 ගුරුවරුන් මෙවන් අක්‍රමිකතා ගැන පැමිණිලි කළ විට ඊට විරුද්ධවීම

2008 මැයි 28 දිනය දරණ මේ ලිපිය මෙම වාර්තාවේ පළකෙරෙන්නේ ආචාර්ය ආර්.බී. රණරාජාගේ අවසරයෙනි.

### 4.3.7 පත්වීම්

#### 4.3.7.1 ස්වේච්ඡා ගුරුවරු

ස්වේච්ඡා ගුරුවරුන් පත්කිරීම දූෂණයෙන් පිරිපවත්නා විෂයයක් ලෙස සැලකේ. නීත්‍යානුකූලව ස්වේච්ඡා ගුරුවරුන් පත්කිරීමට ඉඩක් නැතිවුවත් උතුර හා නැගෙනහිර ගුරු හිගය නිසා ඇමති මණ්ඩලයේ අනුමැතිය ඇතිව එවැනි පත්වීම් කෙරුණි. විදුහල්පතිවරුන්ගේ නිර්දේශය පිට ස්වේච්ඡා ගුරුවරුන් ස්ථිර කිරීමට පෙර ඔවුන් වසර තුනක් පාසැල් වල සේවය කර තිබිය යුතුය.

සමීක්ෂණයෙන් හෙළිවූයේ බොහෝවිට විදුහල්පතිවරුන් කිසිදු විනිවිදභාවයකින් තොරව සිය නෑදෑයින් හෝ දන්නා හඳුනන අය ස්වේච්ඡා ගුරුවරුන් ලෙස පත්කරන බවයි. ගුරුවරුන් 39% ක් සහ නිලධාරීන් 45% ක් මේ බව සනාථ කළහ.

කණ්ඩායම් සාකච්ඡාවකදී ගුරුවරුන් කීවේ....

මේ පත්වීම් දූෂිතයි. ස්වේච්ඡා ගුරුවරුන්ගේ වැඩ ගැන වාර්තා පොත් තබාගෙන ඒ අය ගුරුවරුන් හැටියට බඳවාගත යුත්තේ අවුරුදු කීපයකට පසුවයි. මෑතක් වන තුරු විදුහල්පති මෙසේ කළත් දැන් එහෙම සිද්ධවෙන්නේ නෑ.


ස්වේච්ඡා ගුරුවරුන් වශයෙන් පත්වීමක් ලබන්න විෂයයන් තුනකින් උසස් පෙළ සමත්වෙන්න ඕනෑ. ඒ වගේම පාසැලේ ඇබෑර්තුවක් තියෙන්න ඕනෑ. දැන් සුදුසුකම් ඇති අය සිටිද්දී පත්වීම් දෙන්නේ නෑදෑයින්ට.

සමහර ස්වේච්ඡා ගුරුවරු පත්වීම ලැබුණාට පස්සෙම පාසැලට ඇවිත් නෑ. ඔවුන් විදුහල්පතිවරුන්ට පගාදීලා වාර්තා පොත් ලබාගන්නවා. ස්වේච්ඡා ගුරුවරුන් උගන්වන්න දන්නේ නෑ. අකුරුවල හැඩයවත් දන්නේ නෑ.මෙයින් ශිෂ්‍යයින්ට සිද්ධවන්නේ බලවත් අපරාධයක්.

#### 4.3.7.2 වැඩබලන විදුහල්පතිවරු/විදුහල්පතිවරු

විදුහල්පතිවරුන් පත්කෙරෙන්නේ විභාගයකින් පසු විදුහල්පති සේවාව මාර්ගයෙනි. මෙම වාර්තාව පිළියෙළ කළ අවධියේදී පාසැල් 9,678 න් බාගයක පමණ සේවය කරන වැඩබලන විදුහල්පතිවරුන් මේ විභාගයට පෙනී නොසිටි අයය. මේ පත්වීම් වැඩබලන විදුහල්පතිවරුන් පත්කිරීම සම්බන්ධව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත්කර ඇති 34/2000 චක්‍රලේඛයට පටහැණිව කළ ඒවාය.

රූපය 18: විදුහල්පති පත්වීම් සහ තේරීම් සිදුකිරීමේ ක්‍රියාමාර්ගයේ විෂමතා ඇතැයි ඔබ සිතනවාද?




වැඩබලන විදුහල්පතිවරුන් පත්කිරීමේදී විශාල වශයෙන් දූෂණය සිදුවන බව ගුරුවරුන් 56% ක් සහ නිලධාරීන් 62% කගේ මතය විය. මේ තනතුරුවලට පත්කිරීම සඳහා සුදුසුකම් ඇති ගුරුවරුන් සිටින හෙයින් ඒ අය පත්කළයුතුව තිබූ බව ගුරුවරුන් 50% ක් සහ නිලධාරීන් 62% ක් කියා සිටියහ. අධ්‍යාපන ක්ෂේත්‍රයේ බොහෝ වැදගත් තනතුරු වලට කෙරෙන පත්වීම් දේශපාලන ඒවා යැයි ගුරුවරුන් 50% ක් සහ අධ්‍යක්ෂවරුන් 60% ක් කීහ.

කණ්ඩායම් සාකච්ඡාවකදී ගුරුවරුන් කීවේ....

බොහෝ වැඩබලන විදුහල්පතිවරුන්ට සුදුසුකම් නෑ. ඒවා දේශපාලන පත්වීම්. ජ්‍යෙෂ්ඨ, සුදුසුකම් ඇති ගුරුවරුන්ට උසස්වීම් නෑ. වැඩබලන විදුහල්පතිවරුන් පත්කිරීම ගැන විධිමත් වැඩ පිළිවෙළක් නෑ. සමහරවිට විදුහල්පතිවරුන් පත්කරන්නේ දේශපාලනඥයින් මිස කොමිසම නෙවෙයි. උසස් පෙළේ දේශපාලනඥයෙක් ඒ වගේ දේශපාලන පත්වීම් කරනවා. ලොකු මහත්තයට ඕනැ විටියටයි ඔක්කොම කෙරෙන්නෙ


මෙයද ඉගැන්වීමේ ගුණාත්මකභාවයට තදින්ම බලපායි. එයින් සුදුසුකම් නැති අය රජයේ සේවයට එක්වෙනවා පමණක් නොව නිත්‍ය විධියට පත්වූ විදුහල්පතිවරුන්ගේ උනන්දුව සහ උද්යෝගය ද නැතිකර දමයි.

### 4.3.7.3 අධ්‍යක්ෂවරුන් සහ සේවාස්ථ උපදේශකවරුන්

ඕනෑවට වඩා අධ්‍යක්ෂවරුන් පත්කිරීම සහ ඒ ඒ විෂයයන් වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට යයි කියමින් පළපුරුදු ගුරුවරුන් සේවාස්ථ උපදේශකයින් ලෙස පත්කිරීමත් ගුරුවරුන්ගේ සහ විදුහල්පතිවරුන්ගේ විවේචනයට ලක්විය. පාසැල්වල සේවය කළ යුතු වුවත් සමහර සේවාස්ථ උපදේශකයින් පාසැල්වලට නොයන බව වාර්තාවී ඇත. ඔවුන් ටියුෂන් පන්ති පවත්වන බවත් තමන්ගේ 'ක්ෂේත්‍ර' ගමන් වේලාවේදී කාලය ගතකළේ ටියුෂන් පන්තිවල බවත් කියැවිණ. මෙම අධ්‍යයනයට ලක්වූ එක් කලාපීය පෙදෙසක බොහෝ අතිරේක අධ්‍යක්ෂවරුන් සහ සේවාස්ථ උපදේශකවරන් සිටි අතර ගුරුවරුන් ප්‍රමාණවත් තරම් නොසිටියහ.

ගුරුවරුන් 50% ක් සහ නිලධාරීන් 55% ක් කීවේ අලුත පත්කෙරුණු අධ්‍යක්ෂවරුන් ඒ තනතුරු දැරීමට අවශ්‍ය සුදුසුකම් නොමැති පුද්ගලයින් බවයි. සිසුන් හවුල්කරගන්නා ඉගෙනීමේ ක්‍රම අඩංගු නව අධ්‍යාපන ක්‍රමය යටතේ බොහෝ අධ්‍යක්ෂවරුන් සිටීම ගැන ඇසූ විට ගුරුවරුන් 44% ක් සහ නිලධාරීන් 18% ක් පෙන්වා දුන්නේ එය ගැටලුවක් මිස විසඳුමක් නොවන බවය. සෙසු අය පරස්පර මත දැරූහ.

රූපය 19: නව අධ්‍යාපන ක්‍රමය තුළ අධ්‍යක්ෂවරුන් බොහෝදෙනෙක් සිටීම නිසා විසඳුම්වලට වඩා ගැටලු මතුවී තිබේයයි ඔබ එකඟවන්නේද?



සේවාස්ථ උපදේශකවරුන් කලාපීය අධ්‍යක්ෂවරුන්ගේ අධීක්ෂණයට යටත් වුවත් එක් කලාපීය අධ්‍යක්ෂවරයෙක් කීවේ තමන් ඔවුන් පාලනය නොකරන බවය. මෙයින් හැඟෙන්නේ කලාපීය අධ්‍යක්ෂවරුන් සිය බලය පාවිච්චි නොකිරීම හෝ තමන්ගේ බලතල සහ අධීක්ෂණ කාර්යය ගැන අවබෝධයක් නැති බවයි. මෙම කලාපීය අධ්‍යක්ෂවරයා සේවාස්ථ උපදේශකවරුන් සිටින ස්ථාන දැනගැනීම සඳහා වැඩ පිළිවෙලක් හඳුන්වාදීමට තැත්කළවිට ඔවුන් ඊට විරෝධය පළකරමින් කියා සිටියේ එය ඔහුගේ වගකීමක් නොවන බවය. පරිපාලනමය වගකීම් සහ බලතල පිළිබඳව අවුල් සහගත තත්ත්වයක් පවතී. මේ නිසා මානව සහ මූල්‍ය සම්පත්වල අකාර්යක්ෂම බවක් සහ නාස්තියක් දක්නට පුලුවන.

සේවාස්ථ උපදේශකවරුන්ගේ අධීක්ෂණය මගින් පාසැල් අධ්‍යාපනයේ ගුණාත්මකබව වැඩිකිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය දරන ප්‍රයත්නය ප්‍රශංසාත්මක වුවත් ඇත්ත වශයෙන්ම එයින් ගැටලු පැන නැගී ඇති බව පෙනුණි.

කඳුකරයේ කලාපීය අධ්‍යක්ෂවරයෙක් ...

සේවාස්ථ උපදේශකයින් කාර්යාල වේලාවේදී ටියුෂන් පන්ති පවත්වනවාය, වෙනත් පෞද්ගලික වැඩවල යෙදෙනවාය කියා චෝදනා එල්ලවෙනවා.

සමස්තයක් වශයෙන් බොහෝ ප්‍රතිචාරකයින් පෙන්වාදුන්නේ මේ තත්ත්වය ගැන කළයුතු කිසිවක් නැති බවයි. එයින් අධ්‍යාපන ක්‍රමයේ ඇතිවන ප්‍රතිවිපාක එමටය. සුදුසුකම් නැති, කිසිදු උනන්දුවක් නොදක්වන දුර්වල ගණයේ පුද්ගලයින් විසින් ඉගැන්වීම පහතට ඇද දමනු ලබන අතර දේශපාලන බලපෑම් පත්වීම් වලට පමණක් නොව මාරුවීම් සහ ණයදීමේ ක්‍රම වලට පවා බලපා ඇත.

## 4.4 දූෂණයට එරෙහිව පැමිණිලි

පාසැල් යන දරුවන්ට සහ දෙමව්පියන්ට මෙන්ම ගුරුවරුන්ටත් විදුහල්පතිවරුටත් පරිපාලනයට සම්බන්ධ නිලධාරීන්ටත් මුහුණපාන්කට සිදුවන ගැටලු එමටය. සමහරු දූෂණය ගැන අසා ඇත. තවත් සමහරු දූෂණය ගැන දන්නේ අත්දැකීමෙනි. ඔවුන් ඒ ගැන කුමක් කළේද?


ගුරුවරුන් 62% ක් සහ නිලධාරීන් 45% ක් කීවේ දූෂණයට එරෙහිව කිසිවක් නොකළ බවයි. නිලධාරීන් 63% ක් කිසිදිනෙක පැමිණිල්ලක්වත් කළේ නැත. ගුරුවරුන් 12% ක් සහ නිලධාරීන් 3% ක් ප්‍රශ්නයට පිළිතුරු සැපයුවේවත් නැත.

නිවැසියන් අතුරින් 21% ක් හෙවත් පහෙන් එකක් දූෂණයට එරෙහිව ගුරුවරුන්ට සහ විදුහල්පතිවරුන්ට පැමිණිලි කළහ. 78.3% ක් පැමිණිලි කළේ නැත.

බොහෝදෙනෙක් වැරදිවලට යම්කිසි සහනයක් ලබාගැනීමට මැලිවූ අතර තවත් අය සිතුවේ අනිසි හැසිරීම් වලට නිතිපතා දඬුවම් දිය යුතු බවය. අනිසි හැසිරීම් වලට හැමවිටම දඬුවම් නුදුන් බව නිලධාරීන් 75% ක් කීහ. බාගයක් පමණ කීවේ ගුරුවරුන්ගේ හැසිරීම ගැන අධ්‍යක්ෂවරුන්ට යවන වාර්තා ගණන් ගත්තේ නැති බවයි. කෙසේවුවද, නිවැසියන් 41.7% ක් සහ නිලධාරීන් 42.7% ක් කියාසිටියේ ගුරු වෘත්තියේ වැරදිකරන්නන්ට දඬුවම් දියයුතු බවය. 19% ක් ඊට එකඟවූයේ නැත.

ගුරුවරුන්, නිලධාරීන් සහ දෙමව්පියන් බොහොමයකට ප්‍රශ්නයක් ඇතිවූවිට හෝ දූෂණයට අදාල සිද්ධියක් සම්බන්ධයෙන්, තමන් සතු පැමිණිලි කිරීමේ අයිතිය අනුව ක්‍රියාකිරීමට බැරිවී ඇති බව සමීක්ෂණයේදී හෙළිවිය. එසේත් නැත්නම් ඔවුන්ට එසේ කිරීමට ඕනෑකමක් නොතිබුණි. මෙසේ ක්‍රියාකිරීමට හේතුව එවන් අයිතියක් තමන් සතුව ඇති බව හෝ මහජන සුභසිද්ධිය තකා එසේ කළයුතු බව නොදැන සිටීම විය හැක. ආයතනික මට්ටමින් සංවිධානයක් නොතිබීමද ඊට හේතුවිය හැක.

රූපය 20: අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිදුවන දූෂණ පිළිබඳව ඔබ කවදා හෝ පැමිණිල්ලක් කර තිබේද?



# 5 නිගමන

මහජන සුභසිද්ධිය සඳහා අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සහ සාධාරණත්වය පවත්වාගෙනයෑම අවශ්‍යවේ. අධ්‍යාපන අමාත්‍යාංශයේ දැක්මද එයයි. දූෂණයෙන් ගුණාත්මකබව අඩුවෙයි. පාසැල්වලට ඇතුල්වීමට එයින් අසාධාරණයක් සිදුවන අතර අවසනදී සමාජයීය අසමානත්වයක් ඇතිවේ. මෙම අධ්‍යයනයේදී හෙළිවූ අන්දමට බෙහෙවින්ම දූෂණ වාර්තා වී ඇත්තේ ළමුන් පාසැල්වලට ඇතුලත්කිරීම සහ ගුරුවරුන්, විදුහල්පතිවරුන් සහ නිලධාරීන්ගේ පත්වීම්, උසස්වීම් සහ මාරුවීම් සම්බන්ධයෙනි. මේවායේ අක්‍රමිකතා හේතුවෙන් ගුරුවරුන්ගේ සහ නිලධාරීන්ගේ චිත්ත ධෛර්යය, උනන්දුව සහ පෙළඹවීම බිඳවැටේ. එහි ප්‍රතිඵලය ඉගැන්වීමේ උපරිමය නොලැබීමත් දුර්වල අධ්‍යාපන කළමනාකාරිත්වයත්ය.

සංවිධානාත්මක දුර්වලකම් හෝ පාලනමය දුර්වලකම් නිසා තවත් බොහෝ දේ සිදුවෙයි. පාසැල්වලට සිසුන් ඇතුලත්කිරීමේදි අයකෙරෙන ගාස්තු වැනි කාරණා පිළිබඳ චක්‍රලේඛ හෝ නීති රීති හරියාකාර ලෙස ක්‍රියාවේ නොයෙදීමෙන් සමාජයේ අසමානතාව ඇතිවෙයි. එයින් පීඩා විඳින්නේ දුප්පත් සහ පහළ-මධ්‍යම පාන්තික පවුල්ය. අවසනදී එහි ඵලවිපාක විඳීමට සිදුවන්නේ දරුවන්ටය.

පෞද්ගලික උපකාරක (ටියුෂන්) පංති විශ්ව විද්‍යාලවලට ඇතුල්වීමට බලාපොරොත්තුවන සිසුන්ට ප්‍රයෝජනවත්ය. විශේෂයෙන්ම වෘත්තීයමය උපාධි විෂයයන්ට ඒවායින් සෙතක් සැලසේ. මේ පංති වැඩි ආදයම් පවුල්වල සිසුන්ට වාසියකි. එහෙත් ගෙවීමට මුදල් නැති, නගරයෙන් එපිට ග්‍රාමීය සහ දුර බැහැර පෙදෙස්වල සිසුන්ට එයින් ආසාධාරණයක් සිදුවෙයි. අඩු පඩි ලැබීම හේතුවෙන් ගුරුවරු තමන්ගේම සිසුන්ට පාසැල් වේලාවෙන් පසු ටියුෂන් පංති පැවැත්වීමට පෙළඹෙති. මෙසේ ටියුෂන් පංති පැවැත්වීම ගුරුවරුන් විසින් දුප්පත් සිසුන්ට කෙරෙන හානියක් විය හැකි නිසා එය විවාදයට ලක්ව ඇත. ඕස්ට්‍රේලියාවේ සහ සිංගප්පූරුවේ මෙන් තමන්ගේ පන්තිවල සිසුන්ට මෙම පංති පැවැත්වීම තහනම් කිරීමෙන් එම ඌනතාව මගහරවා ගත හැකිය.

ගුරුවරුන් ඇතුලු වෙනත් සම්පත් නිසියාකාර ලෙස බෙදනොහැරීම සැලකියයුතු අයුරින් මෙරට අධ්‍යාපන ක්ෂේත්‍රයට බලපා ඇත. වෙනත් බොහෝ රටවල මෙන් ශ්‍රී ලංකාවේද ඈත පෙදෙස්වවල පාසැල්වල අවශ්‍ය තරම් ගුරුවරුන් නැති අතර නගරබද පෙදෙස්වල ඕනැවටත් වඩා වැඩියෙන් ගුරුවරු සිටිති. ගුරුවරුන්ගේ හිගය නිසා අධ්‍යාපනයෙන් ලැබෙන ඵලය අල්පය. ග්‍රාමීය සිසුන්ට එය අවාසියකි. උදහරණයක්

වශයෙන්, මෙම අධ්‍යයනයේදී ග්‍රාමීය සහ වතු පාසැල් සිසුන්ට විෂයයන් තෝරාගැනීමේදී විකල්පයක් නොතිබුණු බව පෙනීගියේය. විශේෂයෙන්ම සෞන්දර්ය හෝ කාර්මික විෂයයන් අතින් මෙය හොඳින් පෙනුණි. ඊට හේතුව ගුරුවරුන් හිඟකමයි.

මාරුවීම් පිළිබඳ රෙගුලාසි අකුරටම පිළිපැදීම සිදුනොවන හෙයින් ගුරුවරුන් අසමාන ලෙස බෙදහැරේ. එයින් දූෂණය ශක්තිමත්වේ. තමන්ගේ සම්බන්ධකම් මගින් හෝ අල්ලස් දීමෙන් ගුරුවරුන් වැඩි වැඩියෙන් දුෂ්කර පළාත්වල සේවයට යෑමෙන් වැලකී සිටීමට තැත්කරනු ඇත. සල්ලිකාර පවුල් ද පුද්ගලික දැනහැඳුනුම්කම් යොදගනිමින් හෝ අල්ලස් දීමෙන් සිය දරුවන් පහසුකම් අඩු පාසැල්වලට නොයවා සිටීමට තැත්කරනු ඇත.

විශේෂයෙන්ම පාසැල් සහ ප්‍රදේශීය මට්ටමින් අධ්‍යාපනයට අදල දූෂණයට හේතු රාශියක් ඇති බව මෙම අධ්‍යයනයෙන් අනාවරණය විය. ඒ අතර ප්‍රධාන හේතුවක් වන්නේ පාලනයේත්, ක්‍රියාත්මක කිරීමේත්, අඩුපාඩු තිබීමයි. සැලසුම් සකස්කිරීමේදී ප්‍රාදේශීය වෙනස්කම් සහ අධ්‍යාපනයේ අසමානත්වය පිළිබඳ ගැටලු විසඳීමට පුලුවන්වී නැත. විශ්ව විද්‍යාලවලට සහ වෘත්තීයමය පාඨමාලා සඳහා ඇතුල්වීමට ඇත්තේ තියුණු තරගයකි. ඒ අතරතුරේදී විශේෂයෙන්ම සාමාන්‍ය සහ උසස් පෙළ විභාග වලදීත්, පස්වෙනි ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේදීත් ඇත්තේ 'මිනීමරු' තරගයකි. පිටිසරබද, අඩු දියුණුවක් ලබා ඇති පළාත්වල දුප්පත් ජනතාවට සහනයක් වශයෙන් රජය විසින් සලසා ඇති යම් යම් අධ්‍යාපන පහසුකම් පොහොසතුන් විසින් කූට උපක්‍රම මගින් ඔවුන්ගේ ප්‍රයෝජනයට යොදගනු ලැබේ. විශ්ව විද්‍යාලවලට ඇතුල්වීම සඳහා දිස්ත්‍රික්ක අනුපාත ක්‍රමයෙන් අයුතු ප්‍රයෝජන ගන්නා ආකාරය නුවරඑළියෙන් වැඩි ගණනක් විශ්ව විද්‍යාලවලට ඇතුල්වන ආකාරයෙන් මනාව පැහැදිලිවෙයි.

චක්‍රලේඛ සහ රෙගුලාසි අක්‍රියවීමත්, නිසියාකාරව ක්‍රියාවේ නොයෙදීමත් ඇතැම් දූෂිත ක්‍රියාවන්ට මගපාදන බව අනාවරණය විය. සමහර අවස්ථාවලදී නීති රීති වැරදි ලෙස අර්ථකථනය කෙරෙන අතර තවත් අවස්ථාවලදී ඒවා කොහෙත්ම අනුගමනය නොකෙරේ. උදහරණයක් වශයෙන්, පළාත් සභා ඒ ඒ පළාත්වල ගුරු පත්වීම් සහ මාරුවීම් පිළිබඳව රාජ්‍ය සේවා කොමිසම මෙන්ම එවන් බලතල යොදගනිමින් ක්‍රියාකළයුතු නමුත් දේශපාලන හේතූන් මත ආණ්ඩුකාරවරුන්, ප්‍රධාන ඇමතිවරුන් සහ පළාත් ඇමතිවරුන්ට මෙම 'කොමිෂන් සභා' හෝ 'කමිටු' වල ඇත්තේ තීරණාත්මක භූමිකාවකි.

ගුරුවරුන්, විදුහල්පතිවරුන් සහ නිලධාරීන් කළමනාකරණයේදී නොයෙකුත් ගැටලු ඇති බව මෙම අධ්‍යයනයේදී පෙනී ගිය තවත් කරුණකි. ගුරු මාරුවීම් වලදී අයුතු බලපෑම් නිතර සිදුවෙයි. දේශපාලනඥයින් සහ නිලධාරීන් සමග පවත්නා සම්බන්ධය මාරුවීමක් ලබාගැනීමේ නිර්ණායකයයි. මෙසේ සිදුවන්නේ ජාතික ගුරු මාරු ප්‍රතිපත්තියක් ප්‍රකාශයට පත්කර එය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික සහ පළාත් මට්ටමේ මාරුවීම් මණ්ඩල ස්ථාපිත කර තිබියදීය.

ස්වේච්ඡා ගුරුවරුන් සහ වැඩබලන විදුහල්පතිවරුන් පත්කිරීම තවත් ගැටලු සහගත කාරණයකි. නීතිමය අවසරයක් නැතත් පුහුණුවක් නොමැති ගුරුවරුන් බඳවා ගැනීම දිගටම සිදුකෙරේ. 2006 වසරේදී 7,643 දෙනෙක් බඳවාගනු ලැබූහ. මෙයද අධ්‍යාපන ගුණාත්මකභාවයට අහිතකරය. අධ්‍යාපන අමාත්‍යාංශයේ 2000/34 චක්‍රලේඛය යටතේ වැඩබලන විදුහල්පතිවරුන් පත්කිරීම තහනම්ය. එහෙත් විදුහල්පති සේවයෙන් පිටස්තරව මෙම පත්වීම් රැසක් සිදුකෙරේ. මේ අතර, සුදුසුකම් ඇති පුද්ගලයින්ට නිසි තනතුරු නොලැබෙන අතර නුසුදුස්සන් රාජ්‍ය සේවයට බඳවාගන්නවා පමණක් නොව නිසි අයුරු විදුහල්පති පත්වීම් ලබන අය එයින් අධෛර්යමත්වෙති.

අධ්‍යාපන සේවයේ දේශපාලන පත්වීම් සිදුවන වාර ගණන බෙහෙවින් වැඩිවී ඇති බව පෙනේ. මෙයින් අධ්‍යාපන කළමනාකාරිත්වයේ ගුණාත්මකභාවයට අහිතකර බලපෑමක් ඇතිවෙයි. මෙය පිළිගන්නා අධ්‍යාපන අමාත්‍යාංශය අක්‍රමවත් පත්වීම් ක්‍රමවත් බවට කෙසේ පත්කළ හැකිදැයි සොයාබැලීමට කොමිසමක් පත්කර ඇත.

සමස්තයක් වශයෙන් ඉගැන්වීමේ කටයුතු පිළිබඳව දෙමව්පියන් සෑහීමට පත්වී සිටියද, ගුරුවරුන් සමග පැවති සම්මුඛ සාකච්ඡාවලින් පෙනී ගියේ අධ්‍යාපන කළමනාකාරිත්වය සමග ඔවුන් මහත් කලකිරීමකින් පසුවන බවයි. අධ්‍යාපනයේ අතිශයින් වැදගත් සම්පත ගුරුවරුන් වන බැවින් මෙය ඉමහත් සැලකිල්ලට භාජනය විය යුතු ප්‍රශ්නයකි. 2006-2010 අධ්‍යාපන ක්ෂේත්‍රයේ සංවර්ධන වැඩ පිළිවෙල යටතේ ගුරුවරුන්ට අදාල කාරණා සම්බන්ධයෙන් කටයුතු කිරීමට රජය කැපවී ඇත. ගුරුවරුන්ගේ නිපුණත්වය සහ කැපවීම මෙන්ම ඔවුන්ගේ උනන්දුව, දක්ෂකම් සහ කාර්ය සාධනය වැඩිකිරීම එම වැඩ පිළිවෙලේ පරමාර්ථ අතර වෙයි. මෙම ප්‍රයත්නයන් අනිසි පත්වීම් සහ උසස්වීම් මෙන්ම වෙනත් යුක්තිසහගත නොවන ක්‍රියා හේතුවෙන් බිඳවැටීමට ඉඩ නොදිය යුතුය. ගුරුවරුන්ගෙන් නියම සේවයක් බලාපොරොත්තුවීමට නම් ඔවුන්ට සාධාරණවත්, එකහා සමානවත් සැලකිය යුතුය. ඔවුන්ට මනා පුහුණුවක් ලබාදිය යුතුය. අනාගත අපේක්ෂාවන්ට ඉඩ සැලසිය යුතුය. ප්‍රමාණවත් වැටුප් ලබාදිය යුතුය. වැටුප් වර්ධක කලට වේලාවට ගෙවිය යුතුය.

නීති ක්‍රියාත්මක නොකිරීම නිතර සිදුවන්නකි. මීට සාධක වශයෙන් සම්මත ක්‍රියාපටිපාටීන්ට පිටස්තරව පත්වීම් සිදුකිරීම සහ පාසැල්වලට ළමුන් ඇතුලත්කිරීම්වලදී කෙරෙන ඇඟිලි ගැසීම් පෙන්වාදිය හැක. සමහරවිට නොදැනුවත්කම නිසා රෙගුලාසි ක්‍රියාත්මක නොකිරීමට පුළුවන. අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ගය පැහැදිලි නැත්නම් එය කළමනාකාරීත්වයේ අකාර්යක්ෂමතාවයයි. උදහරණයක් වශයෙන් සේවාස්ථ උපදේශකයින් කලාපීය අධ්‍යක්ෂවරයාගේ අධීක්ෂණයට යටත්ද නැද්ද යන්න පැහැදිලි නැත. නිලධාරීන් සිය බලතල පාවිච්චිකිරීමට මැලිවීමද රෙගුලාසි ක්‍රියාවේ නොයෙදීමට තවත් හේතුවකි.

මෙයින් අයුතු ප්‍රයෝජන ගැනීමට මං පෑදෙයි. යහපාලනය සඳහා නිලධාරීන් තමන් කළ යුතු කාර්යයන්ට අනුකූල විය යුතු මෙන්ම සිය වගකීම් නොපිරිහෙලා ඉටුකළ යුතුය. පාලනය නැතිකම සහ විනයානුකූලව ක්‍රියා නොකිරීම බලය යොදා අයුතු ප්‍රයෝජන ගැනීමට ඉඩදීමකි. දැනට පවත්නා නීති රීති සහ රෙගුලාසි නියමාකාර ලෙස ක්‍රියාත්මක කිරීම අත්‍යාවශ්‍යය. මෙම නීති රීති  ක්‍රියාවේ යෙදීමටත්, නීත්‍යානුකූල නොවන ක්‍රියාවන් සඳහා දඬුවම් පැමිණවීමත් ගැන වඩාත් උනන්දුවක් දැක්විය යුතුය.

පොත්පත් සහ ලිපිද්‍රව්‍ය සඳහා වැයකෙරෙන මුදල් මෙන්ම ළමුන් පාසැල්වලට ඇතුලත්කිරීමේදී අයකෙරෙන ගාස්තු ඇතුලු වෙනත් ගෙවීම් වලින් පාසැල් අධ්‍යාපනයේ අසමානත්වය මනාව පෙනීයයි. මෙම ගෙවීම් සහ නිවෙස් වල ආදායම අනුව වර්ග කර ඇති පන්ති අතර කිට්ටු  සම්බන්ධයක් පෙනෙන්නට ඇත. විෂය මාලා සම්පූර්ණ කිරීම වැනි තීරණාත්මක වැදගත්කමක් ඇති කාරණා පිළිබඳව මධ්‍යම පාන්තිකයින් අතර පහළ පන්ති වලට වඩා උනන්දුවක් ඇත. පාසැල් හා සම්බන්ධ කටයුතු වලදී වැඩියෙන් හවුල්වන්නේ මධ්‍යම පාන්තික දෙමව්පියන්ය. ටියුෂන්දීම වැනි පාසැලින් පිටස්තර කටයුතු වලදීත් මෙම අසමානත්වය කැපීපෙනෙයි.

පියවරුන් උසස් තනතුරු දරන්නේ නම් නැතිනම් ව්‍යාපාරයන්හි නිරතව සිටී නම් එවන් පවුල්වල ළමයින්ට හොඳ පාසැල්වලට ඇතුල්වීමට ඉඩ සැලසෙයි. මීට අමතරව, දෙමව්පියන් අතර දූෂණය පිළිබඳව ඇති දැනුම සහ හැඟීම් අධ්‍යාපනය සහ ආර්ථික පසුබිම අනුව වෙනස්වෙයි. දුප්පත් පවුල් අතර දූෂණය ගැන වැඩි දැනුමක් නැතිවාක් මෙන්ම ඔවුහු ඒ ගැන වැඩි උනන්දුවක් නොදක්වති. මධ්‍යම පාන්තික පවුල් දූෂණය ගැන දන්නා නමුත් දූෂණයට අදල සිද්ධීන් පසුපස යෑමට උනන්දුවක් දක්වන බවක් නොපෙනේ. ඔවුන්ට එවන් ගැටලු නැතිවාක් මෙන්ම අවශ්‍යවුවහොත් ඒවා මගහරවා ගැනීමටත්, තමන්ගේ වාසියට හරවා ගැනීමටත් හැකියාව ඔවුන් සතුව ඇත. දූෂනය

ගැන වැඩිම උනන්දුවක් දක්වන්නේ පහළ-මධ්‍යම පාන්තිකයන්ය. තමන්ගේ දරුවන්ට වඩාත් හොඳ අධ්‍යාපනයක් ලබාදීමට ඔවුහු බෙහෙවින් වෙහෙසෙති. තම දරුවන් විශ්ව විද්‍යාලයකට හෝ වෙනත් උසස් අධ්‍යාපන ආයතනයකට යැවීමේ බලාපොරොත්තුවෙන් ඔවුන්ට අධ්‍යාපනයක් ලබාදීමට උනන්දුවන මේ අය අතර නගරබදව පදිංචිවී සිටින රජයේ සහ පෞද්ගලික අංශයේ රැකියා කරන අය මෙන්ම ව්‍යාපාරිකයින් සහ වෙළඳුන්ද වෙති. උසස් බලාපොරොත්තු ඇතිකරගෙන සිටින මේ දෙමව්පියන් නිරන්තරයෙන්ම රජයේ අධ්‍යාපන ක්‍රමය සමග ගැටෙති. ඔවුහු තමන් සතු මුදල්වලින් විශාල කොටසක් දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලට වැයකරති. ඔවුන් ටියුෂන් පන්ති වලට යවති. අමතර ඉගෙනුමක් ලබාදෙති.

මෙම අධ්‍යයනය සඳහා සැලසුම්කල නියැදියේ වැඩි ප්‍රතිශතය පහළ-මධ්‍යම පාන්තිකයන්ය. අධ්‍යයනය පැවැත්වූ දිස්ත්‍රික්කවල වැඩි ප්‍රමාණයක් එවන් පවුල් බැවිනි. රජයේ පාසැල් අධ්‍යාපන භූමිකාවේ ප්‍රධාන නළුවන්ද ඔවුන්ය. වැඩිම ආදායමක් ඇති පවුල් හෝ උසස්-මධ්‍යම පාන්තිකයින් නියැදියට අයත් නොවීය.

ග්‍රාමීය දුප්පත් දරුවන්ගේ යහපත තකා රජය හඳුන්වා දුන් පස්වෙනි ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය වැනි වැඩ සටහන් දැන් මධ්‍යම පාන්තික සහ පහළ-මධ්‍යම පාන්තික පවුල් ප්‍රයෝජනයට ගනිති. තියුණු තරඟ පසුබිම ඊට එක් හේතුවකි. රජයේ පාසැල් අධ්‍යාපන ක්‍රමයේ මුල් තැනක් ගන්නේ දරුවාගේ දක්ෂතාවයට වඩා සමාජයීය තරාතිරමයි. මෙයින් පාසැල් අධ්‍යාපනයේ සමාන අවස්ථාවන් සැලසීමේ න්‍යායට තර්ජනයක් එල්ලවෙයි.

සමාජයීය අසමානත්වයක් ඇතිකරමින් පාසැල් අධ්‍යාපනයේ දූෂණය තදින් පවතින විට අධ්‍යාපන ක්‍රමය සහ යහපාලනය පිළිබඳව මහජනයා අතර පවතින සමාජ විශ්වාසය බිඳීයයි. එයින් රටේ සංවර්ධන ක්‍රියාදමයට බලවත් හානියක් සිදුවේ. එවිට තරුණ පිරිස දූෂණය එදිනෙදා ජීවන රටාවේ කොටසක් ලෙස සැලකීමට පෙළඹෙති. එය රටේ අනාගත අභිවෘද්ධියට අවශ්‍ය සදාචාරය, ආචාරධර්ම සහ චර්යා අගයන් ගොඩනැගීමට ඉමහත් බාධාවකි, එමෙන්ම එය අධ්‍යාපන අමාත්‍යාංශයේ මෙහෙවරෙහි සඳහන් පරිදි ''පාර්ශවකරුවන් තෘප්තිමත්තාවයට පත්වන අයුරින් කාර්යක්ෂමතාව හා උසස් ගුණාත්මකතාවයට යොමුවන අධ්‍යාපන ක්‍රමයක් තුළින් දක්ෂ පුරවැසි පිරිසක් බිහිකිරීමේ'' අභිලාෂයට මහත් තර්ජනයකි.

## References


1. Abed, George T and Hamid, Davoodi R. *Corruption, Structural Reforms, and Economic Performance in the Transition Economies.* Washington: IMF, 2000.

2. Aturupane, Harsha. *Has the Holy Grail of education been sighted?* Colombo: The Sunday Times, July 2008.

3. Bray, Mark. *Adverse effects of private tutoring*. Paris: UNESCO/IIEP, 2003.

4. Davoodi, Hamid R and Vito Tanzi. *Corruption, Public Investment, and Growth*. IMF Working Paper No. 97/139, October 1997.

5. De Silva, Amarasiri.M.W. *Funding for Education Advocacy*: *Report on the CEF program in Sri Lanka (Evaluation Report submitted to* CEF-UK *and Save the Children Colombo), 2006.*

6. De Silva. W. A, Perera, Wijetunge.L.S, and Navaratne. *A. A. Achievement after Four Years of Schooling. National Assessment of Achievement of Grade Four Pupils in Sri Lanka: National Report.* Colombo: National Education Research and Evaluation Centre, University of Colombo, 2004.

7. Ewa, Tomaszewska and Shah Anwar. *Phantom Hospitals, Ghost Schools, and Roads to Nowhere: The Impact of Corruption on Public Service Delivery Performance in Developing Countries.* Washington,DC: Working Paper, Operations Evaluation Department, World Bank, 2000.

8. Greaney, Vincent and Kellagham, Thomas. *"Assessing National Achievement Levels in Education."* The International Bank for Reconstruction and Development and the World Bank Vol 1, (2008).

9. Griffin, Michael and Meier, Bettina. *Stealing the Future. Corruption in the Education Sector. Berlin: Transparency International,* 2005.

10. Gupta, Sanjeev, Davoodi, Hamid, and Erwin, Tiongson. *Corruption and the Provision of Health Care and Education Services.* Washington, DC: IMF Working Paper 00/116, 2000.

11. Hallak, Jacques and Poisson, Muriel. *Corrupt schools, corrupt universities: what can be done?* Paris: IIEP Series on Ethics and corruption in education, 2007.

12. Haque, Shamsul. *"Recent Transition in Governance in South Asia: Contexts, Dimensions, and Implications" in:* International Journal of Public Administration, Volume 24, issue 12 (November 2001): 1405 – 1436.

13. Hartog, Joop and Ranasinghe, Athula. *"Free-education in Sri Lanka. Does it eliminate the family effect?"* Economics of Education Review, Volume 21, Issue 6, (December 2002): 623-633.

14. Lambsdorff, Graf Johann, Taube, Markus and Schramm, Matthias, eds. *The New Institutional Economics of Corruption*. London: Routledge, 2005.

15. Ministry of Education. *A future generation Endowed with Wisdom and virtues… - 2008 Progress of the Ministry of Education and Proposed Programmes for 2009*. Colombo: Ministry of Education, 2009.

16. Ministry of Education. *Education for Economic Development and Prosperity.* Colombo: Ministry of Education, 2005.

17. Ministry of Education. *School Census 2007*. Colombo: Ministry of Education, 2007.

18. Schacter, Mark and Shah Anwar .*"Combating Corruption: Look before You Leap."* Finance and Development. International Monetary Fund 41(4) (2004): 40–43.

*19*. Tilakaratne, Ganga et al. *Educational Opportunities for the Poor in Sri Lanka: Assessing Spatial Disparities*. Colombo: Institute of Policy Studies of Sri Lanka, 2008.

2*0*. Transparency International. *Corruption in the Education Sector*. Berlin: Transparency International, Working Paper No. 04/2007, 2007.

2*1*. Treisman, Daniel S. *The Causes of Corruption: A Cross National Study.* Los Angeles: Department of Political Science, University of California, 1999b.

22. UNDP Human Development Report 2007/2008.

2*3*. World Bank. *Mainstreaming Anticorruption Activities in World Bank Assistance: A Review of Progress since 1997*. Washington, DC: World Bank, 2004.

2*4*. World Bank. *Performance Audit Report Sri Lanka General Education Project (Credit 2072-Ce)*. Operations Evaluation Department. Report no 18010, June 11, 1998.

2*5*. World Bank. *Treasures of the Education System in Sri Lanka: Restoring Performance, expanding opportunities and enhancing prospects.* Washington, DC: World Bank, 2005.

ප්‍රජාතන්ත්‍රවාදය නිසියාකාරව පවත්වාගෙන යෑමට අවශ්‍යවන්නේ කරුණු කාරණා ගැන දැනුම නොව, නිසි අධ්‍යාපනයයි.

- මහත්මා ගාන්ධි




ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා

සුපිළිපන් දේශයක් උදෙසා

9 788551 281250